# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,561 — 1965 නොවැම්බර් 19 වැනි සිකුරාදා — 1965.11.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1407 | කොටුපල් ටෙන්ඩර් හා වෙනත් ටෙන්ඩර් විකිණීම ... ... | 1454 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... . | 1413 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... — . | 1426 | රට බිම් විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 1448 | ජවන්ඡන්දයී කිරීම් පිළිබඳ දැන්වීම ... ... | 1454 |
| බඩුබාහිරාදිය විකිණීම — — ... | 1449 | විවිධ දැන්වීම් ... . .. ... | 1455 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ පසු රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැර සෙසු අයට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරනු ලබන්නේ වෙනත් කරුණු අතර සාමාන්‍ය පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය දක්වා විධිමත් කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලය ඇතුළත සමත්වීම උඩය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත් වන තෙක්, දැරිය යුතු පඩි වැඩිවීම නොගෙවා තැබීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට සාමාන්‍ය පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

සංක්‍රාන්තිය.—සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම වර්ගයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය [illegible] සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(i) තමා ලාංකිකයෙකු වූ බවට [illegible] සෑම ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම ලෙස නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරවනු ලැබේ.

9. සියලුම අයදුම්පත් ලැබුනු බව දන්වනු ඇත. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයේ සිට සත් දිනක් ඇතුලත තම අයදුම්පත ලැබුනු බව දන්වන ලිපියක් නොලත් අයදුම් කරුවකු වේ නම් වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත දැන්විය යුතුයි. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියහොත් තම අයදුම් පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

බී. ආර්. එල්. බැලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 නොවැම්බර් මස 15 වන දින,
කොලඹ, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
තැ. පෙ. 500,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය.

11-759 —65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

### කටුනායක ගුවන් තොටුපළ සංවර්ධන යෝජනා ක්‍රමය—ලඝු ලේඛක තනතුර (අනියම්)

ඉහත සඳහන් තනතුර සඳහා පහත දක්වන සුදුසුකම් සහිත ලාංකික අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරගත් ඉල්ලුම් පත්‍ර 1965 දෙසැම්බර් 10 දට පෙර මාවෙත ලැබෙන සේ එවිය යුතුය.

වැටුප්.—රු. 4.25 ක නියමිත දෛනික වැටුපකි. මීට අමතරව ආණ්ඩුවේ රෙගුලාසි අනුව ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ගෙවනු ලැබේ.

සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, සහ

(ආ) යටත් පිරිසෙයින් විනාඩියකට වචන 16 ක වේගයෙන් ඉංග්‍රීසියෙන් පිටපත් ලිවීමේ හැකියාවක් හා විනාඩියකට වචන 120ක වේගයෙන් ඉංග්‍රීසියෙන් ලඝුහතින් සටහන් කර ගැනීමේ හැකියාව.

මෙම පත්වීම් අනියම් පදනමක් මත කරනු ඇත. කටුනායක ගුවන් තොටුපළ සංවර්ධන යෝජනා ක්‍රමයෙහි කටයුතු අවසන් වනවාත් සමගම හෝ පත් කරනු ලබන්නාගේ චරිතය හෝ වැඩ හෝ අසතුටුදයක නම් ඊට කලින් වුවද සේවය අවසන් කරනු ලබනවා ඇත.

ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය,

(ආ) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය,

(ඇ) ලඝුලේඛනය පිළිබඳ සහතිකය,

(ඈ) ලඟදී ලබාගත් චරිත සහතික දෙකක්.

ලක්ෂමන් ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් මස 15 දින,
කොළඹ දීය.

#### ආකෘති පත්‍රය

##### ලඝුලේඛක තනතුර සඳහා ඉල්ලුම් පත

1. සම්පූර්ණ නම :———.
2. ලිපිනය :———.
3. උපන් දිනය :———.
4. ජාතිය :———.
5. අධ්‍යාපනික සුදුසුකම් :———.
6. ලඝුලේඛනය පිළිබඳ සහතිකය :———.
7. පාසැලින් අස්වූවාට පසු කළ රක්‍ෂා පිළිබඳ විස්තර :———.
8. වෙනත් කරුණු :———.

මා විසින් මෙහි සඳහන්කොට ඇති කරුණු සත්‍ය බවට සහතික කරමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

11-762 —65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## සමුපකාර තොග වෙළඳ සංස්ථාව

### ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර තනතුරු

සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්මික සහකාර තනතුර සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ.

පහත දක්වෙන අවම සුදුසුකම් අයදුම්කරුවනට තිබිය යුතුය :—

(අ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන් සඳහා කටුබැද්දේ ප්‍රායෝගික කාර්මික ආයතනය මඟින් පවත්වා ගෙන යන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

නැතහොත්

(ආ) රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ උප පරීක්ෂකවරුන් සඳහා වූ පාඨමාලාව සම්පූර්ණ කොට, අවුරුදු 5 ක පළපුරුද්දක් ද ලබා තිබිය යුතුය.

වයස.—1965.11.1 වැනි දිනට අවුරුදු 30 ට නො වැඩි විය යුතුය.

වැටුප් තීරු.—රජයේ ගෙවුම් ප්‍රමාණයන් අනුව, ගෙවල් කුලී, ජීවන වියදම් හා විශේෂ ජීවනාධාර දීමනා ද සහිතව රු. 340—430—රු. 670 වේ මාසික වැටුප් තීරු.

සේවක අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ අර්ථ සාධක අරමුදල් පහසුකම් ද ලැබෙනු ඇත.

රජයේ සහ රජයේ සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අයදුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, ඒවා සලකා බලනු ලබන්නේ, පත් කිරීම සඳහා තෝරා ගනු ලැබුවහොත්, ඔවුන් මුදවා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් එකඟ වන්නේ නම් පමණි.

පහත දැක්වෙන පෝරමය අනුව පිළියෙල කළ යුතු අයදුම් පත්, 1965 නොවැම්බර් 26 වැනි දින හෝ ඊට පෙර, කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 21 හි, ස. තො. ස., සාමාන්‍යාධිකාරීට ලැබෙන සේ එවිය යුතුය.

සාමාන්‍යාධිකාරී.

ස. තො. ස.,
21, වොක්ෂෝල් වීදිය,
කොළඹ 2, 1965.11.13.

#### ආදර්ශ පෝරමය

.................................................තනතුර සඳහා අයදුම් පත

1. නම සහ ලිපිනය :———.
2. උපන් දිනය :———.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
3. ජාතිය :———.
4. අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් :———.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)
5. පළපුරුද්ද :———.
   (දරණ ලද තනතුරු පිළිබඳ විස්තර, දිනයන්ද සමග, දක්විය යුතුය)
6. අයදුම්කරුගේ හැකියාව හා චරිතය පිළිබඳව, අගබලා නත හැකි, වගකිවයුතු තත්වයක් දරන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :———.

මේ අයදුම් පතෙහි මවිසින් සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

11-743 —65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## ලංකා ටයර් සංස්ථාව

### ඇබෑර්තු

ලංකා ටයර් සංස්ථාවේ ස්ථිර ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් ඇති ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගනු ලැබේ.

**1. සේවක මණ්ඩල නිලධාරී—**

(අ) වයස : 1965.10.31 වැනි දිනට අවුරුදු 35 ට අඩු විය යුතුයි.

(ආ) සුදුසුකම් : පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමග, රජයේ දෙපාර්තමේන්තුවක හෝ කර්මාන්ත/වෙළඳ ආයතනයක අඩු වශයෙන් අවුරුදු 2ක සේවක මණ්ඩල/ආයතන පාලන කටයුතු පිළිබඳ විධායක තත්වයේ පළපුරුද්ද, හෝ ; ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන සුදුසුකම් සමග කර්මාන්ත/වෙළඳ/රජයේ ආයතනයක කම්කරු සම්බන්ධතා/සුභ සාධක/සේවක මණ්ඩල/ආයතන පාලක කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 10ක පළපුරුද්ද. (මෙයින් අඩු ගණනේ අවුරුදු 5ක් පරිපාලක තත්වයක සේවය විය යුතුය)

(ඇ) වැටුප් : සියලුම දීමනා අඩංගුව රු. 500—20 × 15—රු. 800 මාසික වැටුප් පරිමාණය මේ තනතුරට හිමිය. තෝරාගනු ලබන අපේක්ෂකයාගේ සේවය අනුව පළමුවන අවුරුද්ද අවසානයේදී රු. 625—25 × 15—රු. 1,000 වැටුප් පරිමාණය ගෙවීම ගැන සලකා බලනු ඇත. (මේ වැටුප් පරිමාන පුනරීක්ෂණයට භාජනය වනු ඇත)

**2. ටයර් පරීක්ෂණ සහායක—**

(අ) වයස : 1965.10.31 වැනි දිනට අවුරුදු 20 හා 30 අතර වීම.

(ආ) ගණිතයට හෝ අංක ගණිතයට සම්මාන සාමාර්ථයක් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන සුදුසුකම්.

(ඇ) අඩු ගණනේ අවුරුදු 3 ක් ආධුනිකයකු ලෙස පිළිගත් මෝටර් ගරාජයකදී ලැබූ පළපුරුද්ද.

(ඈ) වැටුප් පරිමාණය : සියලුම දීමනා අඩංගුව මාසයකට රු. 200—7 × 15—රු. 305. (සැලකිය යුතුයි.—ටයර් පරීක්ෂණ තනතුරුවලට පත්වන අය ටයර් පරීක්ෂණ කටයුතු අඩු වන අවස්ථාවලදී ටයර් පරීක්ෂණ සහායක තනතුරුවල තත්වයට සමාන සංස්ථාවේ වෙනත් අංශවල වෙනත් කාර්ය වල යෙදී සිටීමට සිදුවන වග පැහැදිලි ලෙස සැලකිය යුතුය).

**වෙනත් කරුණු :** වුවමනා විස්තර සනාථ කිරීම පිණිස සහතික පත්වල පිටපත් ඇමුණූ ඉල්ලුම්පත්‍ර, 1965 නොවැම්බර් මස 27 වැනි සෙනසුරාදාට පෙර " සභාපති, ලංකා ටයර් සංස්ථාව, 292, ගාලු පාර කොළඹ 3 " යන ලිපිනයට ලැබෙන සේ ලියා පදිංචි කරන ලද තැපැලෙන් එවිය යුතුය.

රජයේ හෝ සංස්ථා සේවයේ යෙදී සිටින සේවකයන්ගේ ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම්කරු තෝරා ගතහොත්, සේවයෙන් මුදා හරිනු ලැබේ දැයි යන වගද පවසා, දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් එවිය යුතුය.

සභාපති,
ලංකා ටයර් සංස්ථාව.

11-730/1—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ටයර් සංස්ථාව

මෙහි පහත සඳහන් පුරප්පාඩු සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

**සැලකිය යුතුයි.**—මෙහි දක්වා ඇති සියලු ඇබෑර්තු ප්‍රථම අවස්ථාවේදී අනියම් වන අතර ඒ සඳහා තෝරා පත්කර ගනු ලබන්නන්ට දෛනික වැටුප් ගෙවනු ලැබේ. මෙම සේවකයින් සංස්ථා ස්ථිර සේවයට ඇතුලත් කර ගැනීමට සංස්ථා අධිකාරයට පොරොන්දු විය නොහැකි මුත් ඔවුනොවුන්ගේ කාර්යශීලීභාවය ආදිය ගැන සලකා බලා සංස්ථා ක්‍රියාකාරී මණ්ඩලයේ ඇතිවන පුරප්පාඩු පිරවීමේදී මොවුන් ගැනද සලකා බලනු ලැබේ.

(අ) වයස.—1965.10.31 වෙනි දිනට වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

**(ආ) ඇබෑර්තු හා ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් :**

1. **විදුලි ශිල්පීන් (ඉලෙක්ට්‍රිෂන්) (විදුලි නඩත්තු සඳහා).**—විදුලි උපකරණ නඩත්තුව, අලුත්වැඩියා කිරීම්, යන්ත්‍ර හා සුවිච් යතුරු ආම්පන්න ආදියට සම්බන්ධ අවුරුදු 8ක පුහුණු සේවා පළපුරුද්දක් පිළිගත් වැඩපළකදී හෝ ඉංජිනේරු ආයතනයකදී ලබා තිබිය යුතුයි.

2. **විදුලි ශිල්පී (විදුලිය සැපයීම).**—විදුලි බල උප මධ්‍යස්ථානයක, පුහුණු ශ්‍රේණියේ සේවකයකු ලෙස, අවුරුදු 8කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

3. **ආම්වර ඔතන්නා (අමේචර් වයින්ඩර්).**—පිළිගත් වැඩපළක හෝ ඉංජිනේරු ආයතනයක විදුලි ශිල්පියකු මෙන්ම ආම්වර ඔතන්නකු ලෙසද, අවුරුදු 8ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

4. **සංදාම පුරුද්දන්නන් (කේබල් ජොයින්ටර්ස්).**—සංදම 'T' පිරිද්දුම් පරීක්ෂා කිරීම්, සැදුම් ක්‍රියාකාරීව තිබියදී ක්‍රියා විරහිතවීම් වැළැක්වීම් හා සැර විදුලිය සැපයෙන සැදුම් පිරිද්දීම් ආදියට සම්බන්ධ අවුරුදු 8ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

5. **බැටරි යාන්ත්‍රික (බැටරි මිකැනික්).**—ඊයම් අම්ල බැටරි (ලෙඩ් ඇසිඩ් බැටරි) පිරවීම හා නඩත්තුව සම්බන්ධ පුහුණු සේවකයෙකු ලෙස, පිළිගත් වැඩපොළක හෝ ඉංජිනේරු ආයතනයක අවුරුදු 5ක් සේවය කර තිබිය යුතුයි.

6. **බංකු වැද්දුම්කරු (බෙන්ච් ෆිටර්).**—පිළිගත් වැඩපළක හෝ ඉංජිනේරු ආයතනයක පුහුණු ශ්‍රේණියේ බංකු වද්දන්නෙකු ලෙස අවුරුදු 8ක් සේවය කර තිබිය යුතුයි.

7. **ලියවන පට්ටල්කරු (ලේත් ඔපරේටර්).**—පිළිගත් වැඩපළක හෝ ඉංජිනේරු ආයතනයක (සෙන්ටර් ලේත් ඔපරේටර්) ලියවන පට්ටල්කරුවෙකු ලෙස අවුරුදු 8ක සේවා පළපුරුද්දක් තිබිය යුතුයි.

8. **මෝටර් යාන්ත්‍රික (මෝටර් මිකැනික්).**—පිළිගත් මෝටර් ගරාජයක පුහුණු ශ්‍රේණියේ මෝටර් යාන්ත්‍රිකයෙකු ලෙස පැට්‍රල් සහ/හෝ ඩීසල්වලින් ක්‍රියා කරන යන්ත්‍රවලට සම්බන්ධ අවුරුදු 8ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

9. **උපකරණ අලුත්වැඩියා කරන්නා (ඉන්ස්ට්‍රුමන්ට් රෙපයාරර්).**—පිළිගත් වැඩපළක හෝ ඉංජිනේරු ආයතනයක පුහුණු ශ්‍රේණියේ සේවකයෙකු ලෙස උපකරණ නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් සම්බන්ධ අවුරුදු 8ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

10. **යාන්ත්‍රික වැද්දුම්කරු (ෆිටර් මිකැනික්).**—පිළිගත් වැඩපළක හෝ ඉංජිනේරු ආයතනයක පුහුණු ශ්‍රේණියේ යාන්ත්‍රික වැද්දුම්කරුවෙකු ලෙස යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණවල සාමාන්‍ය වැද්දීම් වැඩ, නඩත්තු සහ අලුත්වැඩියා කිරීම් ආදියට සම්බන්ධ අවුරුදු 8ක සේවා පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.

11. **බෙලෙක් වැඩකරු (ටින්කර්).**—පිළිගත් වැඩපළක හෝ ඉංජිනේරු ආයතනයක පුහුණු ශ්‍රේණියේ බෙලෙක් වැඩකරුවෙකු ලෙස අවුරුදු 5ක් සේවය කර තිබිය යුතුයි.

12. **පාස්සුම්කරු (වෙල්ඩර්).**—පිළිගත් වැඩපළක හෝ ඉංජිනේරු ආයතනයක පුහුණු ශ්‍රේණියේ පාස්සුම්කරුවෙකු (ගෑස් සහ/හෝ විදුලි) ලෙස අවුරුදු 5ටත් 8ටත් අතර කාලයක් සේවය කර තිබිය යුතුයි.

13. **පයිප්ප වැද්දුම්කරු (පයිප් ෆිටර්).**—පිළිගත් වැඩපළක හෝ ඉංජිනේරු ආයතනයක පුහුණු ශ්‍රේණියේ පයිප්ප වැද්දුම්කරුවෙකු ලෙස අවුරුදු 5ක් සේවය කර තිබිය යුතුයි.

වැදගත්.—මෙම ඇබෑර්තු වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන සියලු පළපුරුදු සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සහතික සම්මුඛ පරීක්ෂණයෙහිදී ඉදිරිපත් කළ යුතු වේ.

(ඇ) වැටුප් විස්තර :—

1. පුහුණු ශ්‍රේණිගත සේවකයින් ලෙස යටත් පිරිසෙයින් අවුරුදු 5ක සේවා පළපුරුද්දක් සතු අයට, සියලු දීමනා අඩංගු රු. 7.50 බැගින් වූ දෛනික වැටුප් ගෙවනු ලබනවා ඇත.

2. පුහුණු ශ්‍රේණිගත සේවකයින් ලෙස යටත් පිරිසෙයින් අවුරුදු 8ක සේවා පළපුරුද්දක් ඇති අයට රු. 9 බැගින් වූ සියලු දීමනා අඩංගු දෛනික වැටුප් ගෙවනු ලැබේ.

සැලකිය යුතුයි.—අනියම් සේවකයින් හට ගෙවනු ලබන වැටුප්, අනුමත වූ වැටුප් පරිමාණවල පිහිටුවනු ලබන සංස්ථා ස්ථිර සේවකයින් කෙරෙහි බලපාන්නේ නැති බව විශේෂයෙන් සැලකිය යුතුයි.

(ඈ) සාමාන්‍ය කොන්දේසි :

1. මෙම තනතුරු සඳහා තෝරා පත් කර ගනු ලබන සියලු සේවකයින් සංස්ථා නියමයන් අනුව ඔවුන් හට නියමිත වෘත්තීය පරීක්ෂණ යන්ට පෙනී සිටිය යුතුයි.

2. එක් ඇබෑර්තුවකට වැඩි ගණනක් සඳහා ඉදිරිපත් වන සියලු අපේක්ෂකයින්, එක් ඇබෑර්තුවකට එක් අයදුම් පත බැගින් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. මූලික සුදුසුකම් රහිත සියලු අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. සම්මුඛ හා වෘත්තීය පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීමේ හේතුවෙන් වැයවන ගමන් වියදම් ආදිය අපේක්ෂකයින් විසින්ම දැරිය යුතු වේ.

සියලු අයදුම්පත් (සහතිකපත් පිටපත් ඇතුව) ගාලු පාරේ අංක 292 දරණ ස්ථානයෙහි පිහිටි ලංකා ටයර් සංස්ථාවේ සභාපති වෙත, 1965.11.30 වෙනි අඟහරුවාදාට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

සේවක මණ්ඩල නිලධාරී.

1965 නොවැම්බර් 15 වෙනිදා,
ලංකා ටයර් සංස්ථාව, කොළඹ 3.

11-730/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## පොත් තබන්නෙකුගේ තනතුර

වර්ෂයකට රු. 250—; රු. 10×15; රු. 15×10—රු. 550 පඩි ක්‍රමය යටතේ පොත් තබන්නෙකුගේ ඇබෑර්තුවක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම වැටුප් ක්‍රමය අමාත්‍යාංශයේ නියමයක් අනුව මතුවේදී සංශෝධනය විය හැක.

අයදුම් කරුවන්, අඩුම වශයෙන් පිළිගත් ආයතනයක පොත් තැබීමේ කටයුතු වල අවුරුදු පහකට නොඅඩු පළපුරුද්දක් ලත් හා අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ හා සමාන විභාගයකින් හෝ සමත් විය යුතු අතර අතිරේක වෘත්තීය සුදුසුකම් ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ඇත.

අයදුම් පත් 1965 දෙසැම්බර් මස 10 වැනි දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන්නට සැලැස්විය යුතු අතර, මේ සඳහා මෙම කාර්යාලය මගින් නිකුත් කෙරෙන ඉල්ලුම් පත් පෝරම් යොදා ගත යුතුය. තමන්ගේ ලිපිනය සඳහන්, මුද්දරයක් ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් හෝ පුද්ගලිකව මෙම කාර්යාලයට පැමිණීමෙන් හෝ ඉල්ලුම් පත් පෝරම ලබාගත හැක.

ලේකම්.

කාර්මික ජනපද සංයුක්ත මණ්ඩලය,
50, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත,
කොළඹ 2.

11-730—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## නාරාහේන්පිට රථවාහන උසාවියේ කාර්යාල කාර්ය සහායක තනතුර

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල සේවය කරණ ඉහත සඳහන් පුරප්පාඩු වී ඇති තනතුරට උසස් වීමට හිමිකම් ඇති කණිෂ්ඨ සේවකයින් ගෙන් එම තනතුර සඳහා වූ ඉල්ලුම් පත් 1965 දෙසැම්බර් 6 වැනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ. ඉල්ලුම් පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

අයදුම්කරුවන් තම අයදුම්පත් වල පහත සඳහන් විස්තර සඳහන් කළ යුතුය :—

(අ) වයස :———.

(ආ) අධ්‍යාපනික සුදුසුකම් (සමත් වී ඇති උසස්ම විභාගය) : ———.

(ඇ) රජයේ සේවයට පත් වූ දිනය :———.

(ඈ) දැනට සේවා තත්ත්වය :———.

ඩී. සී. ඩබ්ලිව්. වික්‍රමසේකර,
මහේස්ත්‍රාත් නාරාහේන්පිට.

1965 ඔක්තෝබර් මස 18 වෙනි දින.
කොළඹ, නාරාහේන්පිට රථවාහන මහේස්ත්‍රාත් උසාවියේදීය.

11-647—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### ඇඳුම් මැසීම හා මේස් ගෙතීම පිළිබඳ කර්මාන්ත පරිපාලක තනතුරු

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍ර 1965 දෙසැම්බර් මස 9 වැනි දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ "බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9" යන ලිපිනයට එවිය යුතුයි.

ස. ළ.—ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "කාර්මික පරිපාලක තනතුර සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුයි.

ඉල්ලුම්පත්‍ර ලැබුණ වග දැනුම් දෙනු නොලැබේ.

2. වැටුප් ක්‍රමය.—රුපියල් 1,146න් පටන් ගන්න රුපියල් 48 වාර්ෂික වැඩිවීම් 11කින් රුපියල් 1,674 දක්වා වැඩි වන වාර්ෂික වැටුපක් හිමි වේ. රුපියල් 1,296 පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද වේ.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි—

(අ) පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) පත්වීම තුන් අවුරුදු පරීක්ෂාවකට භාජන වේ.

(ඇ) තෝරාගත් අපේක්ෂකයා විසින් බන්ධනාගාර නිලධාරීන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ පුහුණුවීමේ කෙටි පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ යුතුයි.

(ඈ) තෝරාගත් අපේක්ෂකයා දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම ඉල්ලුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1965 දෙසැම්බර් මස 9 වැනි දිනට අවුරුදු 24ට නොඅඩු හෝ අවුරුදු 45ට නොවැඩි බව.

(ආ) සත්වන ප්‍රමාණයෙන් සමත් වී ඇති බව.

(ඇ) ලංකා කාර්මික විද්‍යාලය මගින් හෝ වෙන පිළිගත් ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන කර්මාන්තකරුවන් පිළිබඳ පරීක්ෂණයකදී—

(i) ඇඳුම් මැසීම,

(ii) මේස් ගෙතීම, යන විෂයයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් පිළිබඳ ලබා ගත් සාමාර්ථයක් හෝ ඊට සමානත්වයේ ඇති සුදුසුකම් සහ එම විෂයයන්ගෙන් එකක් ගැන අවුරුදු 5ක ප්‍රායෝගික පළපුරුද්දක් හෝ ;

(ඈ) කාර්මික වැඩපළවල ක්‍රම පිළිබඳවත්, කම්කරු පාලනය සහ කාර්මික කාර්යක්ෂමතාව පිළිබඳවත්, නිෂ්පාදනයන් දියුණු කිරීම පිළිබඳවත් අවුරුදු 10ක පළපුරුද්දක් තිබිය යුතුයි.

5. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම්පත්‍රයට පහත සඳහන් සහතික පිටපතක් පමණක් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය,

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය,

(ඇ) කාර්මික සහ වෘත්තීය සහතික, සහ

(ඈ) චරිතය පිළිබඳ ළඟදී ලබාගත් සහතික දෙකක්.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි.

7. මෙම නිවේදනයේ ප්‍රකාර නොවන සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඒ්ජ. ඩී. එල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

1965 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඇඳුම් මැසීම හා මේස් ගෙතීම පිළිබඳ කාර්මික පරිපාලක තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය

(එවිය යුත්තේ සහතිකවල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන සහතික ආපසු නොඑවනවාත් හැර තැපෑලේදී නැති වන සහතික ගැන දෙපාර්තමේන්තුව වග කියන්නේ ද නැත.)

(1) සම්පූර්ණ නම :———.

නම් :———.

වාසගම :———.

(2) ස්ථිර ලිපිනය :———.

(3) උපන් දිනය හා 65.12.9 වැනි දිනට වයස :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

(4) පියාගේ නම සහ රක්ෂාව :———.

(5) උපන් ස්ථානය—

(අ) අයදුම්කරුගේ පියා :———.

(ආ) අයදුම්කරුගේ පියාගේ පියා :———.

(6) (අ) ජාතිය—

(ආ) ඔබ ලාංකිකයෙක් ද යන වග :———.

(i) උත්පත්තියෙන් ද ? :———.

(ii) ලියාපදිංචි කරවා ගැනීමෙන් ද ? :———.

(7) කසාද බැඳලාද නැද්ද යන වග :———.

(8) අධ්‍යාපන සුදුසුකම්—

(අ) සිංහල :———.

(ආ) දෙමළ :———.

(ඇ) ඉංග්‍රීසි :———.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

(9) ඇඳුම් මැසීම හා මේස් ගෙතීම පිළිබඳ ලබාගත් සහතික සහ පළපුරුද්ද ගැන විස්තර :———.
(සහතිකවල පිටපතක් ඇමිණිය යුතුයි)

(10) දැනට රක්ෂාවක් තිබේ නම් එය :———.

(11) චරිත සහතික දෙනු ලබන්නන්ගේ නම් සහ ලිපිනයන් :
———.

(12) පාසැලින් අස්වූදා සිට කරන ලද රැකියාවන් :———
(ස්වාමියාගේ නම, සේවය හා සේවා කාලය සඳහන් කරන්න. අපේක්ෂකයා රජයේ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුයි).

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

11-637—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## ජාතික පේෂකර්ම සංස්ථාව

වෂී 1965ක්වූ නොවැම්බර් මස 26 වෙනි දින පස්වරු 4 30 දක්වා පහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ :—

### මුදල් භාරකරු තනතුර

සුදුසුකම්.—ඉංග්‍රීසි භාෂාව, සිංහල භාෂාව, ගණිතය හෝ අංක ගණිතය ඇතුළුව විෂයයන් 6ක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය (සාමාන්‍ය පෙළ) හෝ ජ්‍යෙෂ්ඨය.

වයස.—අවුරුදු 40 ට අඩු විය යුතුයි.

මුදල් භාරකරු වශයෙන් විශාල වෙළඳ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක අවුරුදු පහක පළපුරුද්ද. තෝරාගත් අයදුම්කරු විසින් මුදලින් හා විශ්වාස ආප ඔප්පුවකින් ඇප තැබිය යුතුයි.

වැටුප් ක්‍රමය.—සියළු දීමනා ඇතුළුව, මසකට රු. 260—රු. 15 × 13—රු.455 කි.

### පොත් තබන්නා තනතුරු

සුදුසුකම්.—පිළිගත් වෙළඳ ආයතනයක හෝ රජයේ ආයතනයක පොත් තබන්නෙකු වශයෙන් අඩුම ගණනේ අවුරුදු 3 ක පළපුරුද්ද හා පොත් තබන්නන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය හෝ ලංකා කාර්මික විද්‍යාලයේ පොත් තබන්නන් සඳහා උසස් වාණිජ සහතික පත්‍ර විභාගය ; හෝ

පිළිගත් වෙළඳ ආයතනයක හෝ රජයේ ආයතනයක පොත් තබන්නකු වශයෙන් අඩුම ගණනේ අවුරුදු පහක පළපුරුද්ද.

වැටුප් ක්‍රමය.—සියළු දීමනා ඇතුළුව මසකට රු. 260—රු. 15 × 13—රු. 455 කි.

තෝරාගනු ලබන අයදුම්කරුවන්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව එම වැටුප් ක්‍රමයන්හි සුදුසු ස්ථානයන්ට පත්වීම් දීම ගැන සලකා බලනු ලැබේ.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපනික සුදුසුකම් සහ පාසැලෙන් අස්වූ පසු කළ රැකියාවන් සම්බන්ධ සම්පූර්ණ විස්තරද සඳහන් කළ යුතු අතර, අධ්‍යාපනික සහ චරිත සහතිකයන්හි පිටපත් ද (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

ආධාර ලබා ගැනීමට හෝ අසත්‍ය තොරතුරු සැපයීමට හෝ නැත් කිරීම නුසුදුසුකමක් හැටියට සළකනු ලැබේ.

සභාපති.

ජාතික පේෂකර්ම සංස්ථාව,
56, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.

11-677—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්ගේ තනතුරු

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇති මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්ගේ තනතුරු සඳහා 18 මාසයේ පුහුණුව අවසන් කළ වින්නඹු මාතාවන්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම් පත් මෙහි පහත පෙනෙන ආකෘතිය අනුව පිළියෙල කර 1965 දෙසැම්බර් මස 4 වැනි දිනට පෙර කොළඹ (තැපැල් පෙට්ටිය 500) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ නමට එවිය යුතුයි. ලියුම් කවරයෙහි වම් කෙළවරේ '' මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන් සඳහා අයදුම් පත්‍රය '' යනුවෙන් සඳහන් කළ යුතුයි.,

2. පඩිය.—මේ තනතුර සඳහා වර්ෂයකට රුපියල් 696—30 × 11 12 × 1—1038 ක වේතනයක් ගෙවනු ලැබේ. පඩිය රුපියල් 906 හා රුපියල් 996 වන විට කාර්යක්ෂමතා බාධකයන්ට මුහුණ දිය යුතු වෙයි.

3. සේවා පිළිබඳ කොන්දේසි.—මෙවා විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරු වේ. එසේ ද වුවත් 1957.4.29 දිනැති අංක 372 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාර විශ්‍රාම වැටුප් හිමි ක්‍රමයට මාරු වීමට, පත්වූ දා සිට 10 අවුරුදු කාලයක් තුළ දී කැමැත්ත දක්වා සිටීමේ අයිතියක් ද ඇතිව, මුල් පත්වීම දෙනු ලබන්නේ අර්ථ සාධක අරමුදල් ක්‍රමය පදනම් කොට ගෙනය. තෝරාගත් අපේක්ෂිකාවන් අවුරුදු 3ක කාල සීමාවක් තුළ පරීක්ෂාව යටතේ තබනු ලැබේ. අයදුම් කරුවන් ලංකාවේ ඕනෑම පළාතක සේවය

කිරීමටත් ඔවුන්ට නිකුත් කරනු ලබන පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි වලට යටත්ව ක්‍රියා කිරීමටත් සූදානමින් සිටිය යුතු යි. තෝරාගනු ලැබූ අපේක්ෂිකාවන් පළමු පත්වීමේ දින සිට යටත් පිරිසෙයින් තුන් අවුරුදු කාල සීමාවක් මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන බවට ගිවිසුම කට ද බැඳීමට සූදානම් විය යුතුයි.

4. සුදුසුකම්.—(අ) 1965 දෙසැම්බර් මස 4 වැනි දිනට වයස අවුරුදු 35 ට අඩුවිය යුතුයි.

(ආ) දැනට ලියාපදිංචි වී ඇති වින්නඹුවක් විය යුතුය. කලින් වින්නඹු සේවයෙහි යෙදී සිටියවුන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. නිල ඇඳුම්.—සේවයෙහි යෙදී සිටින අවස්ථාවලදී ඇඳීමට අවශ්‍ය වන නිල ඇඳුම් සපයනු ලැබේ.

6. ඉල්ලුම් පත්‍ර මා නමට හෝ වෙනත් නිලධාරියෙකුගේ පුද්ගලික නමට නො එවිය යුතුයි.

7. ඉහත දක්වන ලද වුවමනාවන් සම්පූර්ණ නොවූ ඉල්ලුම් පත් ඉවත ලන නමුත් ඒ බැව් අයදුම්කරුවන්ට දන්වනු නො ලැබේ.

8. මේ සඳහා ඉල්ලා ඇති සහතික පත්වල පිටපත් පමණක් එවිය යුතුයි. යම් හේතුවකින් මුල් සහතික පත්‍ර එවා තිබුණොත් ඒවා ආපසු එවීමට බැඳී සිටිය නොහැක.

9. රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළවී ඇති රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම් පිළිබඳව පොදු කොන්දේසි බලනු මැනවි.

වී. ජේ. ආර්. මුතුකුමාරු,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1965 නොවැම්බර් මස 13 වන ද,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක
කාර්යාලයේ දී ය.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්ගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් වර්ෂය හා දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

(සැලකිය යුතුයි.—පූජකවරයෙකුගේ හෝ ආධාර ලබන පාඨශාලා සඳහා හෝ නිකුත් කළ උප්පැන්න සහතික මේ සඳහා) භාරගනු නො ලැබේ.)

4. ජාතිය :————.
5. විවාහකද අවිවාහක ද යන වග :————.

විවාහක නම් පහත දක්වෙන කරුණු සඳහන් කළ යුතුයි :—

(අ) විවාහයට පෙර නාමය :————.

(ආ) පුරුෂයාගේ රක්ෂාව හා රක්ෂාව කරන ස්ථානය : ————.

(ඇ) දරුවන් ගණන :————.

වැඩිමහල්ම දරුවාගේ වයස :————.

බාලම දරුවාගේ වයස :————.

(විවාහක අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳීම ගැන තම ස්වාමිපුරුෂයින්ගේ විරෝධයක් නොමැති බැව් දැක්වෙන ලිපියක් ද ඉදිරිපත් කළ යුතු ය.)

6. (අ) වින්නඹුකමේ අවසාන විභාගයෙන් සමත්වූ දිනය :————.
(ආ) පුහුණු වූ මධ්‍යස්ථානයේ නම :————.
(i) ආයතනයන්හි :————.
(ii) ක්ෂේත්‍රයෙහි :————.
(මේ සම්බන්ධයෙන් ලබාගත් සහතිකවල පිටපත් ඇමිනිය යුතු යි.)

7. චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක පිටපත් අමුණන්න.

8. භාෂාව පිළිබඳ දක්ෂතාවය :—

| | කියවීම | ලිවීම | කථාකිරීම |
|---|---|---|---|
| සිංහල | ———— | ———— | ———— |
| දෙමළ | ———— | ———— | ———— |
| ඉංග්‍රීසි | ———— | ———— | ———— |

9. මීට ප්‍රථමයෙන් දැරූ රජයේ තනතුරු ඇත්නම් ඒවායේ නම හා ඒවා දැරූ කාලසීමාද සඳහන් කරන්න.

10. සහන වින්නඹු මාතාවක් වශයෙන් (රිලීෆ්) සේවය කිරීමට උවමනා වූ අවස්ථාවක කැඳවීමක් ලදහොත් ඔබ ඊට කැමතිද :————.

11. ඉහත දක්වන සේවා කොන්දේසි පිළිගැනීමට සතුටුද, නැද්ද යන වග :————.

12. මම අසමත්කම නිසා රජයේ සේවයෙන් විශ්‍රාම ලබා හෝ සේව යෙන් පහකර නැති බවත් උසාවියක් මඟින් අපරාධකරුවකු වශයෙන් දඬුවම් ලබා නැති බවත් මෙයින් සහතික කරමි. අසත්‍ය ප්‍රකාශ කිරීමේ වරදට දඬුවම සේවයෙන් පහකිරීම බැව් දනිමි.

————,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

11-765—65.11.19 දින අංක14 ,561 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/23/10/6 (ඊ).

## ස්ථානමාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීමේ (ඉංග්‍රීසි) විභාගය—1966 පෙබරවාරි

1. විභාගය පවත්වන දින.—ඉංග්‍රීසි ලඝු ලේඛනය හා යතුරු ලිවීම මැනවින් දත්, ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම අපේක්ෂකයන්, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා තරඟ විභාගයක්, 1966 පෙබරවාරි මස 5 වැනි දින, විභාග කොමසාරිස් විසින් කොළඹ දී පවත්වනු ලැබේ.

2. ඇබෑර්තු.—(i) සේවයේ අවශ්‍යතාවයන් ගැන සලකා බලා, මේ විභාගයේ ප්‍රතිඵල අනුව පිරවිය යුතු ඇබෑර්තු සංඛ්‍යාව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් තීරණය කරනු ඇත.

(ii) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතේ පවත්නා යතුරු ලේඛක සේවයේ, 1965 දෙසැම්බර් මස 6 වැනි දිනට පෙර සිය පත්වීම ස්ථිර කර ඇති නිලධාරීන් අතරේ ම තරඟ කිරීම සඳහා සම්පූර්ණ ඇබෑර්තු සංඛ්‍යාවෙන් සියයට විසි පහක් වෙන් කර තබනු ඇත. සතුටුදායක ප්‍රමාණයක ලකුණු ලබාගත හොත්, එම අපේක්ෂකයන්ගෙන් මෙම විභාගයේ ප්‍රතිඵල අනුව ම, එම ඇබෑර්තු ද පුරවනු ලැබේ.

3. සේවා කොන්දේසි.—(i) සාමර්ථ්‍යය ලද පිරිමි අපේක්ෂකයින්, පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලයක ආධුනිකත්වය මත මෙම සේවයට පත් කරනු ලැබේ. ඔවුන්ගේ තනතුරු විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) සාමර්ථ්‍යය ලද අපේක්ෂිකාවන් මුල් අවස්ථාවේ දී පත් කරනු ලබන්නේ පත්වීමේ දින සිට තුන් අවුරුදු කාලයක පරීක්ෂාවකට යටත් කොට ය. මේ කාලය තුළ ඔවුන් විසින් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. දශ වර්ෂයක සේවය සම්පූර්ණ කිරීමට පෙර, ඕනෑ ම විටක දී තොවුන්ට විශ්‍රාම වැටුප් හිමි කායෘ මණ්ඩලයට ඇතුළු වීමට කැමැත්ත ප්‍රකාශ කිරීමට හිමිකම ඇත්තේ ය. මෙසේ කැමැත්ත ප්‍රකාශ කළ පසු එය පසුව අස්කර ගත නො හැකි ය. පරීක්ෂණ කාලය තුළ දී මෙසේ කැමැත්ත ප්‍රකාශ කරන අපේක්ෂිකාවෝ ඉන්පසු ආධුනිකත්වයෙහි තබනු ලැබෙත්. මේ ආධුනික කාලය ඔවුන්ගේ පරීක්ෂණ කාලය වන තුන් අවුරුද්දෙන් ඉතිරි වී තිබෙන කොටස ය.

(iii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයට පත් කරනු ලබන අය ස්ථාන මාරු කිරීම්වලට යටත් ය. එසේ ම ලංකාවේ ඕනෑ ම ස්ථානයකට පත් කොට යවනු ලැබීමට ද යටත් වෙති.

(iv) මේ විභාගයෙන් සාමර්ථ්‍යය ලබන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා '' නව ප්‍රවේශක '' සංඛ්‍යාවෙහි ලා සලකනු ලබන අය, 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලට ද, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින හෝ මතුවට පැනවෙන නීතිරීති සහ ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු ය. තව ද, ඔවුන් සිය ආධුනික/පරීක්ෂණ කාලය තුළ දී රාජ්‍ය භාෂාව වූ සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබා ගත යුතු ය. ආධුනික/පරීක්ෂණ කාල සීමාව අවසානයේ දී පත්වීම් ස්ථිර කරනු ලබන්නේ ඔවුන්ගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වී පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත් වූ විට ය.

(v) නව ද, සාමර්ථ්‍යය ලද " නව ප්‍රවේශක " නිලධාරීන් ඔවුන්ගේ වාර්ෂික වැටුප රු. 2,340 පියවරට එළඹීමට පෙර, පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාග ප්‍රමාණයේ සිංහල භාෂාව පිළිබඳ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතු ය. නියමිත කාලය තුළ දී එකී පරීක්ෂණයෙන් අසමත් වුවහොත්, ඊළඟට යෙදෙන වාර්ෂික වැටුප් වැඩිවීම පමා කරනු ලැබේ.

(vi) අතිරේක දීමනා සහ සේවාංශ වෙනත් කොන්දේසි දැන ගැනීම සඳහා මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුල පළවන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් පැනෙන සාමාන්‍ය කොන්දේසි බැලිය යුතු ය.

4\. **වැටුප් ක්‍රමය.**—මේ විභාගයෙන් සමත්වන අය, වර්ෂයකට රු. 1,710 න් පටන්ගෙන වර්ෂයකට රු. 120 බැගින් වූ වැටුප් වැඩිවීම්වලින් රු. 3,780 තෙක් නගින්නා වූ වැටුප් ක්‍රමයක් සහිත ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට පත් කරනු ලබන්නා හ. මෙම වැටුප් ක්‍රමයෙහි රු. 2,910 වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

5\. **සුදුසුකම්—සාමාන්‍ය කොන්දේසි—**

(i) අපේක්ෂකයෝ/අපේක්ෂිකාවෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තා හ.

(ii) අපේක්ෂකයෝ/අපේක්ෂිකාවෝ ලාංකිකයන් විය යුත්තා හ.*

(iii) අපේක්ෂකයෝ/අපේක්ෂිකාවෝ පහත දැක්වෙන සහතික පත්‍ර වලින් යටත් පිරිසෙයින් එකක්වත් ලබා තිබිය යුත්තා හ :—

(අ) ලංකා පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතික පත්‍රය ;

(ආ) ලන්ඩන් මැට්‍රිකියුලේෂන් සහතික පත්‍රය හෝ කේම්බ්‍රිජ් සීනියර් සහතික පත්‍රය.

(ඇ) (1) සිංහල භාෂාව, දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව ;

(2) අංක ගණිතය හෝ ශුද්ධ ගණිතය හෝ මූලික ගණිතය හෝ වාණිජ අංක ගණිතය ඇතුළු ව ;

(3) තවත් විෂයයන් සතරකින් එක අවස්ථාවක දී විෂයයන් පහකට නො අඩුවෙන් සාමර්ථ්‍යය ලබා ඇති අධ්‍යයන පොදු සහතිකය (සාමාන්‍ය පෙළ) ;

(ඈ) ජ්‍යෙෂ්ඨ ගෘහ කර්ම විද්‍යා සහතික පත්‍රය ;

(ඉ) විභාග දෙපාර්තමේන්තුවේ සිංහල වාණිජ සහතික පත්‍රය ;

(ඊ) කේම්බ්‍රිජ් ජූනියර් සහතික පත්‍රය හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද පාඨශාලාවකින් ප්‍රදානය කරන ලද කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ඇතුළු ව පහත සඳහන් සහතික පත්‍රවලින් එකක් :—

(i) ලංකාවේ අපේක්ෂකයන්ට/අපේක්ෂිකාවන්ට නියමිත පරිපාටිය යටතේ ලන්ඩන් වාණිජ මණ්ඩලයේ (London Chamber of Commerce) වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය හෝ) නැතහොත් උසස් වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (විදේශ) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය) ; හෝ

(ii) ලංකා වාණිජ මණ්ඩලයෙන් (Ceylon Chamber of Commerce) සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය හෝ) නැතහොත් උසස් වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය) ; හෝ

(iii) ලංකා කාර්මික විද්‍යාලයේ (ගණන් තබන්නන් සඳහා වූ හෝ ලඝු ලේඛක ටයිප් ගසන්නන් සඳහා වූ හෝ) වාණිජ සහතික පත්‍රය හෝ උසස් වාණිජ සහතික පත්‍රය.

සැලකිය යුතුයි.—මෙම විභාගයට අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනයට පෙර ප්‍රතිඵල පිට නොවී ඇති ඉහත සඳහන් කවර විභාගයකට හෝ පෙනී සිටි අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ අයදුම් පත් භාර ගනු නො ලැබේ.

(iv) 1966 පෙබරවාරි මස 1 වැනි දින වන විට අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ වයස අවුරුදු 17 ට නො අඩුවත්, අවුරුදු 30 ට නො වැඩිවත් තිබිය යුතු යි.

6\. **සුදුසුකම්—සේවා මුක්ත භටයන් ආදී අයට දී ඇති විශේෂ අනුග්‍රහ.**—මහරජිනගේ භට හමුදාවලට බැඳී සිටි සෙසු සියලු කරුණු වලින් ම සුදුසුකම් ඇති සේවා මුක්ත භටයන්ට ද, සහාය ගිනි නිවන හමුදාව, ගුවන් අනතුරු වැළැක්වීමේ සහ මහජනාරක්ෂක සේවා යන සේවාවන්හි (සිය කැමැත්තෙන් අස්වූවන්ට හැර) සම්පූර්ණ කාලය යොදා වැඩ කළ සාමාජිකයන්ට ද, එම හමුදාවලට 1945 අගෝස්තු 15 වැනි දිනට ප්‍රථම බැඳී සිටියේ නම් ද, සතුටුදායක ලෙස නොකඩවා සේවය කර තිබේ නම් ද, 5 (iv) වැනි ඡේදයේ නියමිත වයස් සීමාට සම්බන්ධ ව 1939 සැප්තැම්බර් 3 වැනි දා මුල ම දිනය සහ 1949 දෙසැම්බර් 31 වැනි දා අගම දිනය වශයෙන් ඇති ස්ථකීය සේවා කාලය ඔවුන්ගේ වයස් ප්‍රමාණවලින් අඩු කිරීමට අවසර දෙනු ලැබේ.

සැලකිය යුතුයි.—(අ) යථෝක්ත සේවාවන්හි සේවය කරන අතර ම, වෙනයම් රක්ෂාවක නියුක්ත ව සිටි හෝ පාඨශාලා ශිෂ්‍යයකු ව සිටි හෝ අයකු, මුළු කාලය යොදා සේවය කළ අයකු ලෙස සලකනු නො ලැබේ.

(ආ) සහාය ගිනි නිවන හමුදා ව ද, ගුවන් අනතුරු වැළැක්වීමේ සහ මහජනාරක්ෂක සේවාවන් ද සම්බන්ධයෙන් මෙහිලා ඇතුළත් කෙරෙනුයේ ආරක්ෂක පණත් යටතේ බඳවා ගනු ලැබූ සේවකයන් ගෙන් යුත් සේවාවන් පමණකි.

7\. **සුදුසුකම්—ලංකාවේ පිහිටි එක්සත් රාජ්‍යයට අයත් සේවාවන්හි නියුක්ත වූ එහෙත් සේවා වසමට අයත් නොවන සේවකයන්ට හා යුද්ධ හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූවන්ට ද, දෙනු ලබන විශේෂ අනුග්‍රහ :—**

(1) එක්සත් රාජ්‍යයට අයත් සේවාවන්හි යෙදී සිට 1956 ජූලි මස 6 වැනි දින හෝ ඉන් පසු ව හෝ සේවයෙන් ඉවත් කරනු ලැබූ සේවා වසමට අයත් නොවන ලාංකික සේවකයෝ හෝ යුද්ධ කඳවුරු ආපසු ගැනීමට ආණ්ඩුව විසින් කරන ලද නිරණය නිසා සේවයෙන් ඉවත් කරනු ලැබීමට භාජනව සිටින අය ද, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි පෙරිය කරච්චියට, නාරාංගන්පිට පිහිටි රාජකීය නාවික ගුවන් විදුලි මධ්‍යස්ථානය (ඇන්ඩර්සන් ගුවන් විදුලි මධ්‍යස්ථානය) ගෙන යාමට ආණ්ඩුව මගින් කරන ලද නිරණය හේතුකොටගෙන, 1954 සැප්තැම්බර් මස 27 වැනි දිනට පසුව සේවයෙන් ඉවත් කරන ලද අය ද, පහත දැක්වෙන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙම ගණයට අයත් අපේක්ෂකයන්ට මෙහි 5 වැනි ඡේදයෙහි (iv) කොටසෙහි නියමිතව ඇති වයස් සීමාව ගණන් ගැනීමේ දී තමන් එක්සත් රාජධානියට අයත් සේවාවන්හි සේවය කළ කාල සීමාව තම වයසින් අඩු කිරීමට අවසර දෙනු ලැබේ. එහෙත් එසේ කිරීමට අවසර දෙනු ලබන්නේ ඔවුන්ගේ එම සේවා කාලය අඛණ්ඩව ද, සතුටුදායකව ද පැවතියේ නම් පමණකි.

(ආ) 1955 දෙසැම්බර් මස 6 වැනි දිනට හෝ ඉන් පෙර හෝ එක්සත් රාජධානියේ සේවාවන් යටතේ යටත් පිරිසෙයින් සිව් අවුරුද්දක සතුටුදායක අඛණ්ඩ සේවයක් සපුරා සිටි එහෙත් 5 වැනි ඡේදයෙහි (iii) කොටසෙහි දක්වන ලද අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට ඉදින් තමන් 9 වැනි ඡේදයේ (ආ) (අ) කොටස යටතේ සඳහන් විභාගවලින් යටත් පිරිසෙයින් එකකින්වත් සාමර්ථ්‍යය ලබා ඇතොත්, මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(ඇ) 5 වැනි ඡේදයේ (iii) වැනි කොටස යටතේ සඳහන් වන මූලික අධ්‍යාපන සුදුසුකම් ලබා නොමැති අයදුම්කරුවෝ එම අධ්‍යාපන සුදුසුකම් ලබා ගන්නා තුරු හෝ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ යටත් පිරිසෙයින් සිව් වසක අඛණ්ඩ සතුටුදායක සේවයක් සපුරන තුරු හෝ එම සේවයේ ඉහළ ශ්‍රේණියට ඇතුළත්වීමට සුදුස්සෝ නො වෙති.

---

*රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහා ම " ලාංකික " යන පදයෙන් අදහස් කරනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි වීමෙන් හෝ ලංකාවේ රටවැසි බව ලබා ඇති තැනැත්තන් ය.

(ii) යුද්ධ හමුදාවන්හි යෙදී සිට සේවාමුක්ත වූ අය පහත දක්වන අනුග්‍රහ ලැබීමට සුදුස්සෝ වෙති :—

(අ) මෙහි 5 වැනි ඡේදයෙහි (iv) වැනි කොටසෙහි දක්වන ලද වයස් සීමාව ගණන් ගැනීමේ දී, අවඥා සහගත ලෙස සේවයෙන් නෙරපන ලද හෝ සේවයෙන් පහකරන ලද හෝ කිසියම් දුරාචාරී බවක් නිසා සේවයෙන් අස්වීමට සිදු වූ හෝ තැනැත්තන් හැර සේවා මුක්ත වූ අන්‍යයන්ට හෙවත් උප සේවකයන්ට හෝ නිලධාරීන්ට හෝ භෙදවායන්ට හෝ තමන් ස්ථිර හමුදාවේ සේවය කළ කාල සීමාව තම වයසින් අඩු කිරීමට අවසර දෙනු ලැබේ.

(ආ) අවුරුදු හතරකට නො අඩු කාලයක් නිත්‍ය හට හමුදාවේ යෙදී සිටි එහෙත් මෙහි 5 වැනි ඡේදයෙහි (iii) වැනි කොටසෙහි දක්වන ලද අධ්‍යාපන සුදුසුකම් නොමැති අයට ඉදින් තමන් 9 වැනි ඡේදයේ (ආ) (අ) කොටස යටතේ සඳහන් කරන ලද විභාගයයන් අතුරෙන් යටත් පිරිසෙයින් එකකින්වත් සාමර්ථ්‍යය ලබා ඇතොත් මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(ඇ) 5 වැනි ඡේදයේ (iii) වැනි කොටස යටතේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් ලබා නොමැති ආධුනිකයෝ එම අධ්‍යාපන සුදුසුකම් ලබා ගන්නා තුරු හෝ ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ යටත් පිරිසෙයින් සිවු වසක අඛණ්ඩ සතුටුදායක සේවයක් සපුරන තුරු හෝ එම සේවයේ ඉහළ ශ්‍රේණියට ඇතුළත් වීමට සුදුස්සෝ නොවෙති.

8. **සුදුසුකම්.—සේවක සංඛ්‍යාව අඩු කිරීම සඳහා අස්කරනු ලැබූ ආණ්ඩුවේ සේවකයින්ට දෙන විශේෂ අනුග්‍රහ :—**

ස්ථිර වූ හෝ තාවකාලික වූ හෝ නිලයක යෙදී ආණ්ඩුවේ සේවය කළ, එහෙත් ස්වකීය වැඩ හෝ හැසිරීම අසතුටුදායක වීම නිසා නොව, අන්‍ය වූ හේතූන් නිසා සේවය නවතාලීමට භාජන වූ අය පහත දක්වන අනුග්‍රහය ලැබීමට සුදුස්සෝ වෙත්.

5 වැනි ඡේදයෙහි (iv) වැනි කොටසෙහි දක්වුණු වයස් සීමාව ගණන් බැලීමේ දී සේවයෙන් පහකරනු ලැබීමෙන් හෝ වැඩ අසතුටුදායක වීමේ හේතුවෙන් හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ආණ්ඩුවේ සේවයෙන් අස්වුණු අය හැර අන්‍යයන්ට තමන් ආණ්ඩුව යටතේ සේවයෙහි යෙදී සිටි කාල සීමාව තම වයසින් අඩු කර ගැනීමට අවසර දෙනු ලැබේ.

9. **සුදුසුකම්.—ආණ්ඩුවේ සේවකයන් සඳහා දෙනු ලබන විශේෂ අනුග්‍රහ:—**

(i) **දනට ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්ත තාවකාලික ලසු ලේඛකයන්ට පහත දක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇතොත්,** අධ්‍යාපන සුදුසුකම් නොතකා මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(අ) 1966 පෙබරවාරි මස 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

(ආ) 1965 දෙසැම්බර් මස 6 වැනි දිනට අනන්ත පූර්වයෙන්, ආණ්ඩුව යටතේ තාවකාලික ලසු ලේඛකයන් වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු දෙකක අඛණ්ඩ සතුටුදායක සේවයක් සපුරා සිටිය යුතු යි.

(සංලක්ෂ්‍යය.—සේවයේ කැඩීමක්, මාසයකට වැඩි නොවන විට එය අඛණ්ඩ සේවයකට බාධාවක් වශයෙන් සලකනු නොලැබේ.)

(ඇ) 5 වැනි ඡේදයේ (iii) වැනි කොටස යටතේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් ලබා නොමැති ආධුනිකයෝ, එම අධ්‍යාපන සුදුසුකම් ලබා ගන්නා තුරු හෝ ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ, යටත් පිරිසෙයින් සිව් වසක අඛණ්ඩ සතුටුදායක සේවයක් සපුරන තුරු හෝ එම සේවයේ ඉහළ ශ්‍රේණියට ඇතුළත් වීමට සුදුස්සෝ නො වෙති.

(ii) ආණ්ඩුවේ සේවයේ තාවකාලික තනතුරු දරන එහෙත් 9 වැනි ඡේදයේ (i) වැනි කොටස යටතේ දෙනු ලබන අනුග්‍රහයනට සුදුසුකම් ලබා නොමැති පහත දක්වෙන (අ) සහ (ආ) යන වර්ගවලට අයත්, අයහට මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

(අ) 1965 දෙසැම්බර් 6 වැනි දිනට අනන්ත පූර්වයෙන් ආණ්ඩුව යටතේ, යටත් පිරිසෙයින් එක් අවුරුද්දක අඛණ්ඩ සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත අය :—

(අ) ඔවුන් 5 වැනි ඡේදයේ (iii) වැනි කොටසෙහි සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුයි.

(ආ) 1966 පෙබරවාරි මස 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

(ඇ) ඔවුන්ගේ සේවය සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් සහතික කොට තිබිය යුතු අතර, ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයට පත් කිරීම සඳහා තෝරා ගනු ලැබුවහොත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තුවල සේවයෙන් ඔවුන් මුද හැරීමට කැමති විය යුතු යි.

(ආ) 1965 දෙසැම්බර් මස 6 වැනි දිනට අනන්ත පූර්වයෙන් ආණ්ඩුව යටතේ, යටත් පිරිසෙයින් සිව් අවුරුද්දක අඛණ්ඩ සේවයක් සපුරා සිටින පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත අය :—

(අ) ඔවුන් පහත දක්වෙන සහතික පත්‍රවලින් එකක්වත් ලබා තිබිය යුතුය :—

(i) මෙට්‍රික් ජූනියර් සහතික පත්‍රය ;

(ii) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ;

(iii) අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද පාඨශාලාවකින් ප්‍රදානය කරන ලද කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ;

(iv) ලංකාවේ අපේක්ෂකයන්ට නියමිත පරිපාටිය යටතේ ලන්ඩන් වාණිජ මණ්ඩලයේ (London Chamber of Commerce) වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (විෂයය) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලසු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය හෝ) නැතහොත් උසස් වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (විෂයය) (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලසු ලේඛක ටයිප් ගසන්නන් ගේ කොට්ඨාශය) ; හෝ

(v) ලංකා වාණිජ මණ්ඩලයේ (Ceylon Chamber of Commerce) සහ ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද වාණිජ අධ්‍යයන සහතික පත්‍රය (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලසු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය හෝ) නැතහොත් උසස් වාණිජ සහතික පත්‍රය, (සාමාන්‍ය වාණිජ කොට්ඨාශය හෝ ලසු ලේඛක ටයිප් ගසන්නන්ගේ කොට්ඨාශය) ; හෝ

(vi) ලංකා කාර්මික විද්‍යාලයේ (ගණන් තබන්නන් සඳහා වූ හෝ ලසු ලේඛක ටයිප් ගසන්නන් සඳහා වූ) වාණිජ සහතික සහතික පත්‍රය හෝ උසස් වාණිජ සහතික පත්‍රය.

(ආ) 1966 පෙබරවාරි මස 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

(ඇ) ඔවුන්ගේ සේවය සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් සහතික කොට තිබිය යුතු අතර, ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයට පත් කිරීම සඳහා තෝරා ගනු ලැබුවහොත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තුවල සේවයෙන් ඔවුන් මුද හැරීමට කැමති විය යුතු යි.

(ඇ) 5 වැනි ඡේදයේ (iii) වැනි කොටස යටතේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් ලබා ගන්නා තුරු හෝ ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ යටත් පිරිසෙයින් සිව් වසක අඛණ්ඩ සතුටුදායක සේවයක් සපුරන තුරු හෝ එම සේවයේ ඉහළ ශ්‍රේණියට ඇතුළත්වීමට ආධුනිකයෝ සුදුස්සෝ නොවෙති.

(iii) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතේ පවතින යතුරු ලේඛක සේවයට අයත් 1965 දෙසැම්බර් 6 වැනි දින හෝ ඊට පෙර හෝ සිය පත්වීම් ස්ථිර කර ඇති නිලධාරීන්ට, වයස හෝ අධ්‍යාපන සුදුසුකම් හෝ නොතකා මෙම විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මෙම විභාගයෙන් සාමර්ථ්‍යය ලබන ඉහත සඳහන් ගණයට අයත් 1956 සැප්තැම්බර් 24 වැනි දිනට ප්‍රථම සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ''ආදි ප්‍රවේශකයන්'' වශයෙන් සලකනු ලැබෙත්.

(iv) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ගේ පාලනය යටතේ පවතින යතුරු ලේඛක සේවයට අයත්, මීට ඉහතින් තාවකාලික ලසු ලේඛකයන් වශයෙන් ආණ්ඩුව යටතේ සේවය කොට ඇති නිලධාරීන්ට අධ්‍යාපන සුදුසුකම් නොතකා, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

**(අ) 1966 පෙබරවාරි මස 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු යි.**

(ආ) යතුරු ලේඛක සේවයට බැදෙද්දී ඔවුන් තාවකාලික ලඝු ලේඛකයන් ව සිටිය යුතු අතර 1965 දෙසැම්බර් 6 වැනි දිනට අනන්ත පූර්වයෙන් දෙවර්ගයේ ම තනතුරුවල යටත් පිරිසෙයින් අවුරුදු දෙකක අඛණ්ඩ සේවා කාල එකතුවක් තිබිය යුතු යි.

සංලක්ෂ්‍යය.—මාසයකට වැඩි නොවන කාලයක සේවයේ කැඩීමක් සේවයට බාධාවක් වශයෙන් සලකනු නොලැබේ.

(ඇ) 5 වැනි ඡේදයේ (iii) වැනි කොටස යටතේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් ලබා නොමැති ආධුනිකයෝ, එම අධ්‍යාපන සුදුසුකම් ලබා ගන්නා තුරු හෝ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ යටත් පිරිසෙයින්, සිව් වසක අඛණ්ඩ සතුටුදායක සේවයක් සපුරන තුරු හෝ එම සේවයේ ඉහළ ශ්‍රේණියට ඇතුළත්වීමට සුදුස්සෝ නො වෙති.

(v) ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරන, එහෙත් මෙහි ඉහත ඡේදවල දක්වා ඇති අනුග්‍රහයන් ලැබීම සඳහා සුදුසුකම් නැති පහත සඳහන් (අ) සහ (ආ) වර්ගවලට අයත් නිලධාරීන්ට පහත සඳහන් කොන්දේසිවලට යටත් ව විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) 1965.11.13 වැනි දිනට සේවයෙහි යෙදී සිටින අය.—

(අ) ඔවුන් 5 වැනි ඡේදයේ (iii) වැනි කොටසෙහි දක්වුණු අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුයි.

(ආ) 1966 පෙබරවාරි මස 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුයි.

(ඇ) දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ඔවුන්ගේ සේවය සතුටුදායක බවට සහතික කොට තිබිය යුතු අතර, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තුවල සේවයෙන් ඔවුන් මුදා හැරීමට කැමති විය යුතු ය.

(ආ) 1965 දෙසැම්බර් 6 වැනි දිනට අනන්ත පූර්වයෙන් ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් අවුරුදු හතරක අඛණ්ඩ සේවයක් සපුරා සිටින අය :—

(අ) ඔවුන් 9 වැනි ඡේදයේ (ආ) (අ) කොටසෙහි සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතු ය.

(ආ) 1966 පෙබරවාරි මස 1 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

(ඇ) දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ඔවුන්ගේ සේවය සතුටුදායක බවට සහතික කොට තිබිය යුතු අතර ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ස්වකීය දෙපාර්තමේන්තුවල සේවයෙන් ඔවුන් මුදා හැරීමට කැමති විය යුතු ය.

(ඈ) 5 වැනි ඡේදයේ (iii) වැනි කොටස යටතේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් ලබා ගන්නා තුරු හෝ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියෙහි සිව් වසක අඛණ්ඩ සතුටුදායක සේවයක් සපුරන තුරු හෝ එම සේවයේ ඉහළ ශ්‍රේණියට ඇතුළත්වීමට ආධුනිකයෝ සුදුස්සෝ නො වෙති.

සංලක්ෂ්‍යය.—(අ) මෙම විභාගයෙන් සාමර්ථ්‍යය ලබන ඉහත දක්වුණු (අ) සහ (ආ) යන ගණවලට අයත්, 1956 සැප්තැම්බර් මස 24 වැනි දිනට පෙර පත් කරන ලද නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා ''ආදි ප්‍රවේශකයන්'' වශයෙන් සලකනු ලැබෙත්.

(ආ) ඉහත සඳහන් (අ) සහ (ආ) කොටස් යටතේ දුම්රිය, තැපැල්, මිනින්දෝරු, රෙගු ආරෝග්‍යශාලා යනාදි දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන්ට අයත් නිලධාරීහු මෙම විභාගයට පෙනී සිටීමට සුදුස්සෝ නොවෙති. එසේ වුවද, දනට අවුතුවෙන් නිලධාරීන් බඳවා ගැනීම නවතා ඇති දෙපාර්තමේන්තු ගත ලිපිකාර සේවාවන්හි නියුක්තව සිටින නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට අවසර තිබේ.

(vi) *අනියම් සේවකයෝ.*—1965 දෙසැම්බර් 6 වැනි දිනට පෙර වූ අවුරුදු 5 තුළ අඩු ම ගණනේ මාස 6ක් එක දිගට ම නොවූ වත්, සේවය කොට ඇති පහත සඳහන් (අ) සහ (ආ) වර්ගවලට අයත් නිලධාරීන්ට, 1966 පෙබරවාරි 1 වැනි දිනට වයස අවුරුදු 45ට නොවැඩි නම්, හා හා 5 (iii) වැනි ඡේදයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සතුව ඇත්නම් මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

(අ) ස්ථිර ලඝු ලේඛකයන් පත් කිරීම හේතු කොට ගෙන 1965 සැප්තැම්බර් 30 වැනි දින හෝ ඉන් පෙර හෝ සේවය නවත්වන ලද, අනියම් ලඝු ලේඛකයෝ ;

(ආ) දනට සේවයෙහි නියුක්ත අනියම් ලඝු ලේඛකයෝ.

10. අයදුම් පත්.—(i) මේ විභාගය සඳහා වූ ආදර්ශ අයදුම් පත් පෝරමයක් මේ නිවේදනය අග පළ කර ඇත. අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම් පත් ඊට අනුව ෆුල්ස්කැප් ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරගත යුතු ය.

(ii) අයදුම් පත් 1965 දෙසැම්බර් 6 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන්, කොළඹ 2, මැලේ වීදිය, තැ. පෙ. 1503, විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය.

එම දිනට පසුව ලැබෙන කිසිම අයදුම් පතක් භාර ගනු නො ලැබේ. අයදුම් පත්‍රය බහා එවනු ලබන ලියුම් කවරයේ, වම් පස ඉහළ කෙළවරේ, විභාගයේ නම පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

(iii) නියමානුකූල ව අවලංගු කළ රුපියල් 20ක මුද්දර අයදුම් පතෙහි අලවා තිබිය යුතු යි.

(iv) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල දනට සේවයෙහි යෙදී සිටින අපේක්ෂකයන් විසින් එවනු ලබන අයදුම් පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. 8 වැනි ඡේදය හා 9 වැනි ඡේදයේ (vi) (අ) කොටස යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයන් විසින් සිය අයදුම් පත් එවිය යුත්තේ ඔවුන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙනි. එසේ නොකරන කිසියම් අයදුම් කරුවෙකු වෙතොත් ඔහු විභාගයට නුසුදුස්සකු කොට සලකනු ලැබේ. 1965 දෙසැම්බර් 6 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් හෝ විභාග කොමසාරිස් වෙත ලැබෙන පරිදි යවන ලෙස ඉල්ලීමකුත් සමඟ ස්වකීය අයදුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් වෙත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් අයදුම් කරුවන්ගෙන් ඉල්ලනු ලැබේ.

විභාග කොමසාරිස්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයට අයදුම් පත් නො එවිය යුතු ය.

11. විභාගයට ඇතුළත් කර ගැනීම.—(i) ලැබී ඇති ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් ඒ ඒ අපේක්ෂකයා වෙත විභාග කොමසාරිස් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තමන්ගේ ප්‍රවේශ පත්‍ර විභාග මධ්‍යස්ථානය භාර පරිපාලක වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

ඉල්ලුම් කරුවන් තමන් සඳහා නියම කර තිබෙන විභාග ශාලාවෙහි ම විභාගයට පෙනී සිටිය යුතු ය. තමාට නියමිත විභාග ශාලාව හැර අන්‍ය විභාග ශාලාවක දී කිසිම අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නො ලැබේ.

ප්‍රවේශ පත්‍රය සමඟ කාල සටහනෙහි පිටපතක් ද අපේක්ෂකයන් වෙත යවනු ලැබේ. විභාගයට පෙනී සිටින්නා වූ සෑම අපේක්ෂකයකු විසින් ම විභාගය පවත්වනදින යෙහි ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග පරිපාලක වෙත භාර දිය යුතු ය.

සියළුම විභාග අපේක්ෂකයන් විසින් පිළිපැදිය යුතු ව්‍යවස්ථා මාලාවක් මේ නිවේදනය අග පළ වේ. අපේක්ෂකයෝ මෙම ව්‍යවස්ථාවන් පිළිපැදීමට බැඳී සිටිති.

යම් කිසි අපේක්ෂකයකුට විභාගයට කලින් (යටත් පිරිසෙයින් සත් දවසකට කලින්) තමාගේ ප්‍රවේශ පත්‍රය නො ලැබුණහොත් ඔහු විසින් ඒ බව වහාම,

''කොළඹ 2,
තැ.පෙ. 1503,
මැලේ වීදිය,
විභාග කොමසාරිස්.''

යන ලිපිනයට දන්වා දිය යුතු යි. (විදුලි පණිවුඩ යවන ලිපිනය—''විභාග'' කොළඹ, කියා වේ.) ප්‍රවේශ පත්‍රය නො ලැබුණ බව විභාග කොමසාරිස්ට දන්වා දෙන අතර ම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුයි :—

(1) විභාගයේ නම ;
(2) සම්පූර්ණ නම ;
(3) සම්පූර්ණ ලිපිනය ;
(4) තැපැල් කන්තෝරුව, ලියාපදිංචි කළ අංකය සහ අයදුම් පත තැපැල් කළ දිනය.

(ii) විභාගයට ඇතුළත් කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට කල්පනා නොකළ යුතුයි.

විභාග කොමසාරිස්ට ස්වකීය අභිමතය පරිදි කිසියම් අපේක්ෂකයකුට තාවකාලිකව විභාගයට පෙනී සිටීම පිණිස තාවකාලිකව අවසර දිය හැකි ය. එසේ දෙනු ලබන අපේක්ෂකත්වය පසුව ස්ථිර කරනු ලැබේ. නැතහොත් අවලංගු කරනු ලැබේ.

12. හැඳින්වීමේ පත්‍ර.—විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ම විභාග ශාලාවේ දී විභාග පරිපාලකගේ සතුටට හේතු වන පරිදි සෑම විෂයයක් පාසා ම ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් ඕනෑම එකක් භාර ගනු ලැබේ:—

(අ) පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන හැඳින්වීමේ පත්;

(ආ) විභාග දිනයට අවුරුදු 3කට නො වැඩි කාලයක් ඇතුළත නිකුත් කරන ලද වලංගු ගමන් අවසර පත්‍රයක් (පාස්පෝට් බලපත්‍රය) ;

(ඇ) විභාග දිනයට අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් ඇතුළත ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත සංවිධානයක හෝ අධිකාරිත්වය යටතේ නිකුත් කරන ලද, අයිතිකරුගේ ඡායාරූපයක් ද සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ අන්‍ය ලියවිල්ලක්;

(ඈ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටේ දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක්.

පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ............................................................................ (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අයගේ බව මම සහතික කරමි.

.....................................................................
අයදුම් කරුගේ පුරුදු අත්සන

.....................................................................
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

.....................................................................
(නම සහ තරාතිරම)

දිනය : .....................................................................

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නො හැකි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය තාවකාලික ය. එම අපේක්ෂකත්වය විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකි ය.

13. සුදුසුකම් පිළිබඳ ලියවිලි.—(i) අයදුම්පත සමඟ වෙන කිසිම ලිපි ලේඛනාදියක් නො එවිය යුතු යි. එහෙත් නියම කොට ඇති පරිදි අවශ්‍ය සියලුම විස්තර අයදුම් පතෙහි සඳහන් කළ යුතුය. මෙසේ අවශ්‍ය වන සියලුම කරුණු වලින් සම්පූර්ණ නොවන ඉල්ලුම් පත්‍රයක් වුවහොත් එය එහි අන්තර්ගත කරුණු උඩ පමණක් සලකා බලා ප්‍රතික්ෂේප කරන්නට ඉඩ තිබේ.

(ii) සුදුසුකම් ලද අපේක්ෂකයන් විසින් තමන්ගේ යෝග්‍යතාව, ලියකියවිලිවලින් ඔප්පු කළ යුතු ය. එබඳු වූ අපේක්ෂකයන් එම ලියකියවිලි, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වුවහොත්, එම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම හෝ නො එසේ නම් විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාද ව ලියාපදිංචි කළ තැපෑලෙන් යැවීම හෝ කළ යුතු ය.

(iii) පහත දක්වෙන ලියකියවිලි අවශ්‍ය විය හැකිය :—

(අ) යහපත් චරිතය පිළිබඳ වගකිවයුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

සංලක්ෂ්‍යය.—අපේක්ෂකයා ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවකින් ලඟදී අස් වී හෝ සිටී නම් චරිත සහතිකය ලබා ගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයාගෙනි. නො එසේවන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාරයෙක්, අධිනීතිඥ කෙනෙක්, නීතිඥ කෙනෙක්, හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රුපියල් 2,400 ක් හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ සාමාන්‍යයෙන් ප්‍රකට ව දන්නා කෙළින් ම තොරතුරු ලබාගත හැකි තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුව ද ලබාගත හැකි වේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම හා ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන් ව තිබිය යුතු ය.

ආණ්ඩුවේ ස්ථිර තනතුරක් උසුලන අපේක්ෂකයින් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නො වේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක්, හෝ උප්පැන්නය ලියා පදිංචි නො කළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක් ; කිසියම් අපේක්ෂයකුහට ඉදිරිපත් කළ හැක්කේ අනුමාන වයස් සහතිකයක් පමණක් නම් එම අපේක්ෂකයාගේ උපන් දිනය වශයෙන් සලකනු ලබන්නේ සහතිකයේ සඳහන් වර්ෂයේ ජූලි මස 1 වැනි දිනට ය.

සංලක්ෂ්‍යය.—(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටාගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නො ලැබේ.

(ii) උප්පැන්න සහතික පත්‍ර වෙනුවට දිවුරුම් සහතික පත්‍ර හෝ බව්තීස්ම පත්‍ර භාර ගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයෙහි දක්වෙන නම/නම හා අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන එසේම ඔහු විභාගයේ දි පෙනී සිටින නම/නම හා අතර වෙනසක් වේ නම්, යථායෝග්‍ය පරිදි උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදයේ) අංක 27 හෝ 28 හෝ දරණ නියමයන් අනුව ස්වකීය උප්පැන්නයෙන් දක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහා ම කටයුතු කළ යුතු ය.

1957 අගෝස්තු මස 18 වැනි දින නිකුත් කරන ලද අංක 394 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ ප්‍රකාර ස්වකීය නම වෙනස් කළ දනට ආණ්ඩුවේ තනතුරු දරණ අපේක්ෂකයන් උප්පැන්න සහතිකයේ ද තමන්ගේ නම වෙනස් කරවා ගැනීමට ක්‍රියා කිරීම අවශ්‍ය නො වේ.

(ඇ) ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියා පදිංචිවීමේ සහතික පත්‍රයක් හෝ පරම්පරාවෙන් හිමි වූ පුරවැසි බවක් ඇති බැව් ආණ්ඩුව මගින් පිළිගත් බව දක්වෙන සහතිකයක් (උචිත වන පරිදි);

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත් හෝ එසේ සහතික පත් නිකුත් කොට නැතහොත් ඊට අදාළ වූ වෙනත් රාජකාරී ලියවිල්ලක් (උදා :— පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානයාගෙන් ලබාගත් ලිපියක්) ;

(ඉ) යුද්ධ හමුදාවේ අංශයක සේවය කිරීම පිළිබඳ සහතිකයේ මුල් පිටපත හෝ මහාජනාරක්ෂක සේවයේ සම්පූර්ණ කාලය යොදවා වැඩ කළ කෙනෙකු බව දක්වෙන සහතිකයේ මුල් පිටපත (අදාල තන්හි) (මෙය අවශ්‍ය වන්නේ 6 වැනි ඡේදයෙහි දක්වුණු අපේක්ෂකයන් සම්බන්ධයෙනි.)

(ඊ) හේවා පන්නයට අයත් නොවූ සේවකයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ මුල් සහතිකය හෝ යුද හමුදාවේ සේවයෙහි යෙදී සිටි බවට ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 7 වැනි ඡේදයෙහි දක්වුණු අපේක්ෂකයන් කෙරෙහි ය.)

(උ) ආණ්ඩුවේ සේවය පිළිබඳ ව ලබාගත් සහතිකය (මෙය අවශ්‍ය වන්නේ මෙහි 8 වැනි ඡේදයෙහි දක්වුණු අපේක්ෂකයන් සම්බන්ධයෙනි.)

(ඌ) හැඳින්වීමේ පත්‍රය (සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඊ සඳහා ද මෙය රැගෙන ආ යුතු ය.)

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේ දී වුවමනා සියළු ම ලියකියවිලි සූදානම් ව තබා ගන්නා ලෙස අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වෙතොත් ඊ අවස්ථාවේ දී වුවමනා සියළු ම ලියකියවිලි ඉදිරිපත් කරන්ට අපොහොසත් වන හෝ විභාග කොමසාරිස් විසින් ඉල්ලා සිටි කල්හි ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන හෝ අපේක්ෂකයකු වෙතොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

14. **අසත්‍ය තොරතුරු සැපයීම ගැන දඬුවම්.**—මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නො සුදුසු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑ ම අවස්ථාවක ඔහුගේ/ඇගේ අපේක්ෂකත්වය අවලංගු කරන්නට පිළිවන.

අපේක්ෂකයකු/අපේක්ෂිකාවක විසින් ඉදිරිපත් කරන ලද යම් කිසි තොරතුරක් ඔහු/ඇය දැනුවත් ව ම අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය සිතාමතා ම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත් හෝ එසේ නැතහොත් ඔහු/ඇය මේ විභාගයට පෙනී සිටීමට නුසුදුසු ව සිටි බව ඔහු/ඇය සේවය කරන කාලයේ කවර අවස්ථාවක දී හෝ ඔප්පු වුවහොත් අප්‍රමාද ව සේවයෙන් පහ කිරීමට පිළිවන.

**නිවේදනයේ සඳහන් නියමයන් සම්පූර්ණයෙන් පිළි නො පදින අයවලුන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.**

15. **මුදල් ආපසු ගෙවීම.**—කවර කාරණයක් නිසාවත් මුදල් ආපසු ගෙවනු නොලැබේ. මේ විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙන කිසිම විභාගයක් සඳහා මාරු කරන්නට නො පිළිවන.

16. **ආණ්ඩුවේ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—විභාග කොමසාරිස් විසින් පිළි ගන්නා ලද අයදුම් පත්‍ර ඇති ආණ්ඩුවේ සේවය කරන නිලධාරීන්ට දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු (රාජකාරි නිවාඩු නොවේ.) දිය යුතු යි.

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතේ පවතින යතුරු ලේඛක සේවයට අයත්, 1965 දෙසැම්බර් 6 වැනි දින හෝ ඊට පෙර හෝ පත්වීම් ස්ථිර කර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් වියදම් ගෙවනු නො ලැබේ.

17. **විභාග පරිපාටිය.**—විභාගය කොටස් දෙකකින් යුක්තය. I වන කොටස ලිඛිත පරීක්ෂණයකි. II වන කොටස වාචික පරීක්ෂණයකි. විභාගය සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයය වෙනුවෙන් නියමිත ලකුණු පහත දක්වේ. ලිඛිත පරීක්ෂණයේ දී නරක අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ. නො පැහැදිලි අකුරු ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැලකීමට ඉඩ තිබේ.

| I වන කොටස | ලකුණු |
|---|---|
| 1. ඉංග්‍රීසි වාක්‍ය රචනය (පැය 1 යි) ... ... ... ... ... | 50 |
| 2. ඉංග්‍රීසි ලඝු ලේඛනය ... ... ... ... ... (විනාඩියකට වචන 90 ගණනේ විනාඩි 5 ක් තුළ කියවනු ලබන පාඨ ලඝු හසින් ලියා ගෙන එය විනාඩියකට වචන 7 ගණනේ සාමාන්‍ය විදියට ලිවීම.) | 150 |
| 3. ඉංග්‍රීසි යතුරු ලිවීම ... ... ... ... ... (වචන 600 කින් පමණ සමන්විත පාඨයක් නිවැරදිව විනාඩි 20 ක් ඇතුළත ටයිප් ගැසීම, එනම් විනාඩියකට වචන 30 ගණනේ ටයිප් ගැසීම.) | 50 |
| 4. සිංහල හෝ දෙමළ ... ... ... ... ... ... (පැය 1 යි) | 50 |

සැලකිය යුතුයි.—(I) සිංහල හෝ දෙමළ පත්‍රය සුදුසුකම් ලැබීමේ එකක් වශයෙන් පමණක් සලකනු ලැබේ. මේ පත්‍රය සඳහා නියමිත ලකුණු වලින් අවුවශයෙන් 40%ක් සැම අයදුම්කරුවකු විසින් ම ලබාගත යුතු ය. කෙසේ වුවද, එසේ සුදුසුකම් ලත් අය අතුරෙන් පත්කිරීම් සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීමේ දි, මේ පත්‍රයෙන් ලැබූ ලකුණු සංඛ්‍යාව සැලකිල්ලට ගනු නො ලැබේ.

(II) සිංහල හෝ දෙමළ හෝ පහළ සිංහල හෝ පහළ දෙමළ හෝ විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ සමත් වී ඇති අයදුම් කරුවන් මෙම පත්‍රයෙන් නිදහස් කරනු ලැබේ.

(III) පරීක්ෂණය පැවැත්වෙන දින දී ප්‍රයෝජනය සඳහා තමන්ගේ ම යතුරු ලියන යන්ත්‍ර රැගෙන ආ යුතු යි. විභාග කොමසාරිස් විසින් විභාග ශාලාවේදී යතුරු ලියන යන්ත්‍ර සපයනු නො ලැබේ.

(IV) එසේ කළ නොහැකි අපේක්ෂකයන්ට තම තමන් අතරේ එක යතුරු ලියන යන්ත්‍රයක් පාවිච්චි කිරීමට පිළියෙල කර ගැනීමට ඉඩ දෙනු ලැබේ. එක්දිනක දි එක යතුරු ලියන යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා පිළියෙල කර ගන්නා අපේක්ෂකයන්ගේ ගණන හතරකට වැඩි විය යුතු නොවේ. එසේ කරන අපේක්ෂකයන් ඔවුන් අතුරෙන් පළමුවෙන් යතුරු ලිවීමේ පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු අපේක්ෂකයාට නියම දිනයෙහි විභාගය පටන් ගැනීමට ප්‍රථම විභාග මධ්‍යස්ථානයේ පරිපාලක නිලධාරියා වෙත දැනුම් දිය යුතු ය. එක් එක් අපේක්ෂකයාට නියම වී ඇති දිනය නොතකා එම අපේක්ෂකයන් සියල්ලම එක දිනයෙහි ම විභාග මධ්‍යස්ථානයේ පරිපාලක නිලධාරියා පරීක්ෂා කරනවා ඇත. ඒ සම්බන්ධ ව යොදගෙන ඇති වැඩ පිළිවෙල පිළිබඳ ව අපේක්ෂකයන් විසින් අත් දන්වීමක් දීම වුවමනා නො වේ.

(V) මෙම විභාගය සඳහා පෙනී සිටින, 1965 දෙසැම්බර් මස 6 වැනි දින වන විට සිය පත්වීම් ස්ථිර කර ඇති රජයේ සියළු ම නිලධාරීන්ට තමන් ගේ විභාග ශාලාව වෙත කාර්‍යාලයීය යතුරු ලියන යන්ත්‍ර රැගෙන යාමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවසර දෙනු ලැබේ. එහෙත් මෙම අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නා සැම නිලධාරියකුගෙන් ම යතුරු ලියන යන්ත්‍ර සුරක්ෂිතව ආපසු භාර දෙන බවටත් ඒවා පරිහරණය කිරීමේ දි සිදුවන අලාභ හානි ආදියක් වේතොත් ඒවාට වගකියන බවටත් ලිඛිත ප්‍රකාශයක් දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් ලබාගත යුතු ය.

(VI) ඉහත (IV) ඡේදය යටතේ දී ඇති අවසර හැරුණු විට තමාගේ යතුරු ලිවීමේ පරීක්ෂණය සඳහා අපේක්ෂකයකුට දී තිබෙන දිනයෙහි වෙනසක් කර ගැනීම පිණිස කරනු ලබන ඉල්ලීමකට සාමාන්‍යයෙන් ඉඩ දෙනු නො ලැබේ.

(VII) ටයිප් ගසන ලද පත්‍රිකා හරි වැරදි බැලීමේ දී නිසි ශෝභන පිළිවෙල, නිරවද්‍යතාවය සහ වේගය ගණන් ගනු ලැබේ.

| II වන කොටස | ලකුණු |
|---|---|
| සම්මුඛ පරීක්ෂණය ... ... ... ... ... | 50 |

ලිඛිත පරීක්ෂණය මුලින් පවත්වා එහි ප්‍රතිඵල අනුව අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණය සඳහා තරහ ක්‍රමයට තෝරා ගන්නවා ඇත. කොළඹ දී පවත්වනු ලබන මේ සම්මුඛ පරීක්ෂණයේ දිනය ඔවුන්ට කල්තියා දැනුම් දෙනවා ඇත. සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු ගණන නියම කරනු ලබන්නේ විභාග කොමසාරිස්ගේ ද අදහස් විමසා ක්‍රියා කරන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසිනි. සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් දක්වන අපේක්ෂකයන්ගේ/අපේක්ෂිකාවන්ගේ ගණන ඇබෑර්තු සංඛ්‍යාවට වඩා අඩුවුවහොත්, සම්මුඛ පරීක්ෂණය නො පැවැත්වීමට ඉඩ තිබේ.

18. **ප්‍රතිඵල ප්‍රසිද්ධ කිරීම සහ පත්වීම් දීම.**—සමර්ථවන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කර සුදුසු පුරප්පාඩු ඇති වූ විට ඔවුන් ට පත්වීම් දෙනවා ඇත.

19. **වෛද්‍ය පරීක්ෂණය.**—පත්වීම් දීම සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයන්/අපේක්ෂිකාවන් විසින් ලංකාවේ ඕනෑ ම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත බවට වෛද්‍ය පරීක්ෂණයකින් ද සාමර්ථය ලැබිය යුතු යි.

20. මේ රෙගුලාසි වලින් විස්තර නො කරන ලද මීට අදාල වූ වෙනත් යම් කරුණක් වේ නම් එය භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ අභිමතය පරිදි තීරණය කෙරෙනු ඇත.

සී. ඊ. කුරේ
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

## ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට බඳවා ගැනීමේ (ඉංග්‍රීසි) විභාගය – 1966 පෙබරවාරි

විභාග අංකය :.................................................

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

# ඇතුළත්වීමේ ඉල්ලුම් පත්‍රය

1. (අ) ඔබේ පුරුදු අත්සන ...

මුල් අකුරු සහිත ඔබේ නම ...

ඔබේ සම්පූර්ණ නම ...
(පැහැදිලි ලොකු අකුරෙන්)
(පිරිමියෙක් ද, විවාහක කාන්තාවක් ද, අවිවාහක කාන්තාවක් ද යන වග සඳහන් කරන්න.)

(ආ) සම්පූර්ණ ලිපිනය (ආණ්ඩුවේ සේවයේ සිටින අපේක්ෂකයන් විසින් ස්වකීය කාර්යාලයීය ලිපිනය සඳහන් කළ යුතුයි)

2. (අ) ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ—

(i) පරම්පරාවෙන් ද, නැතහොත්

(ii) ලියාපදිංචි කිරීමෙන් ද, යන වග

(ආ) උපන් ස්ථානය—

(i) අපේක්ෂකයාගේ : ...............................................

...............................................................

(ii) අපේක්ෂකයාගේ පියාගේ : ......................................

...............................................................

(iii) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තාගේ : .................

...............................................................

(iv) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මී මුත්තාගේ:..................

...............................................................

සැළකිය යුතුයි.—අපේක්ෂකයා සහ ඔහුගේ පියා යන දෙදෙනාම උපන්නේ ලංකාවේ නම් (i) සහ (ii) පමණක් පිරවීම සෑහේ. අපේක්ෂකයා හෝ ඔහුගේ පියා උපන්නේ ලංකාවේ නොවේ නම් (i), (ii), (iii), සහ (iv) යන සියල්ලම පිරවිය යුතු යි.

3. (අ) ඔබ උපන් දිනය ... ... ...

(ආ) 1966 පෙබරවාරි 1 වැනිදාට ඔබේ වයස (අවුරුදු හා මාස වලින්)

| | දිනය | මාසය | අවුරුද්ද |
|---|---|---|---|
| (අ) | ...................... | ...................... | ...................... |
| (ආ) | ...................... | ...................... | ...................... |

| | කණ්ඩායමේ හෝ සේවයේ හෝ ස්ථානයේ නම (අවශ්‍යවූ තැනදී) | දැරූ තනතුර හෝ නිලය | දින | | කාලය | |
|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | අවුරුදු | මාස |
| 4. යුද්ධ හෝ මහජනාරක්ෂක සේවාවන් පිළිබඳ තොරතුරු ... | | | | | | |
| | | | | මුළු ගණන ... | | |

සැළකිය යුතුයි.—(අ) අපේක්ෂකයා මේ සේවාවලින් එකක යෙදී සිටියදී වෙනත් රජකාවක් කළේ නම්, නැතහොත් ඒ කාලයේදී පාඨශාලා ශිෂ්‍යයකුව සිටියේ නම් ඔහුට සම්පූර්ණ සේවාකාලයක් ගැන අයිතිවාසිකම් කිව නොහැකිය.

(ආ) සහාය ගිනි නිවන හමුදාවද, ගුවන් අනතුරු වැළැක්වීමේ සහ මහජනාරක්ෂක සේවාවන්ද සම්බන්ධයෙන් මෙහි ලා ඇතුළත් වනුයේ ආරක්ෂක පනත් යටතේ ඇතුළත් වුනු සේවකයන් ගෙන් යුත් සේවාවන් පමණකි.

| | ආයතනයේ නම | දැරූ පදවිය හෝ ධුරය | දින | | කාලය | | අස්කරනු ලැබීමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | අවුරුදු | මාස | |
| 5. හේවා වසමට අයත් නොවන අයකු වශයෙන් ලංකාවේ පිහිටි එක්සත් රාජ්‍යයේ සේවාවන්හි කරන ලද සේවය පිළිබඳ විස්තර දක්වන්න | | | | | | | |
| | | | | එකතුව ... | | | |

| | සේනාංකයේ නම | නිලය | දින | | කාලය | | සේවාවෙන් අස්වියාමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | අවුරුදු | මාස | |
| 6. ඔබ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වුවෙක් නම්, නිත්‍ය භට හමුදාවෙහි ඔබ විසින් කරන ලද සේවය පිළිබඳ විස්තර දක්වන්න. | | | | | | | |
| | | | | එකතුව ... | | | |

| | දෙපාර්තමේන්තුව | දරූ පදවිය | ස්ථිරවද නැතහොත් තාවකාලික වද යන වග | දින | | කාලය | | සේවා වෙන් අස්වීයාමට හේතු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා | අවුරුදු | මාස | |
| 7. විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 8 වැනි ඡෙදය යටතේ දක්වෙන පරිදි නිළධාරීන් සංඛ්‍යාව අඩුකිරීම සඳහා අස්කරන ලද ආණ්ඩුවේ සේවකයන්ට දෙනු ලබන විශේෂ අනුග්‍රහය යටතේ නම්, ආණ්ඩුව යටතේ ඔබ විසින් කරන ලද සේවය පිළිබඳ සම්පූර්ණ විස්තර මෙහි දක්වන්න | | | | | | | | |
| | | | | | එකතුව ... | | | |

8. නිවේදනයේ 9 වැනි ඡෙදයේ සඳහන් වූ ආණ්ඩුවේ ස්ථිර, තාවකාලික හා අනියම් තනතුරු දරන්නන්ට දෙන විශෙෂ අනුග්‍රහ යටතේ ඉල්ලුම් කරන්නේ නම් :—

(අ) ඔබ ඇතුළත්වන්නේ 9 වැනි ඡෙදයේ කුමන කොටසකට ද ? ...

(ආ) දරණ තනතුර ... ... ...

(ඇ) එම තනතුර ස්ථිර ද, තාවකාලික ද, අනියම් ද ? ...

(ඈ) දෙපාර්තමේන්තුවේ නම ... ... ...

(ඉ) සේවා කාලය (දින සහිතව) ... ... ........................ වැනි ද සිට ..................ද දක්වා කාලය :—

අවුරුදු.............................. මාස ........................

(ඊ) 1966 පෙබරවාරි 1 වැනි දට වයස ... ...

(උ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනයෙහි පවතින, යතුරු ලේඛක සේවයෙහි නියුක්ත යතුරු ලේඛකයකු නම් එම පත්වීම ස්ථිර කළ දිනය දක්විය යුතු යි. ...

9. මෙම විභාගයට ඇතුළත්වීමට සුදුසුකම් පිණිස අපේක්ෂකයා සමර්ථ වී ඇති විභාගවල තොරතුරු—

(අ) විභාගයේ නම, අවුරුද්ද සහ මාසය ... ...

(ආ) මධ්‍යස්ථානය ... ... ...

(ඇ) විභාග අංකය ... ... ...

(ඈ) කණිෂ්ඨ පාඨශාලා සහතික විභාගය හෝ ඊට සමාන විභාගය හෝ පවත්වන ලද්දේ පාඨශාලාවක් මගින් නම් පහත දැක්වෙන විස්තර සපයන්න :—

(i) පාඨශාලාවේ නම ... ...

(ii) එහි ලිපිනය ... ... ...

(iii) එහි පාලනය ... ... ...

(6 වෙනි පිටුවේ ඇති සහතිකය සම්පූර්ණ කළ යුතුයි).

---

10. ආණ්ඩුව යටතේ කළ රක්ෂා ද ඇතුළුව මීට කලින් තමන් විසින් කරන ලද රක්ෂාවන්ද, ඒ ඒ රක්ෂාවල යෙදී සිටි කාලය හා ඒ එක එකකින් අස්වී යාමට හේතු වූ කරුණු ද පිළිබඳ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න :

(අ) වෙළඳ සමාගමේ/ස්වාමියාගේ/ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ නම ... ... ...

(ආ) රක්ෂාවේ ස්වභාව ... ... ...

(ඇ) සේවා කාලය ... ... ...

(ඈ) එම සේවය හැර යාමට හේතුව ...

---

11. ඉදිරිපත් කෙරෙන චරිත සහතිකය ලබාගත් තැනැත්තාගේ නම, පදවිය (පදවියක් ඇත්නම්) සහ ලිපිනය ...

---

12. කිසියම් වරදකට ඔබ කවද හෝ වරදකරු කරනු ලැබ තිබේ නම් හෝ චෝදනා කරනු ලැබ තිබේ නම් හෝ සිනායි කරනු ලැබ තිබේ නම් හෝ ඒ බව සඳහන් කරන්න. එසේ නම්, ඒ දිනය ද, වරදේ ස්වභාව ද, උසාවියේ නම ද, නඩු නොම්මරය ද මෙහි දක්වන්න.

---

13. (අ) ඔබ ගන්නේ කුමන භාෂාව ද ? සිංහල ද නැතහොත් දෙමළද ?

(ආ) ඔබ මෙම විෂයයෙන් නිදහස් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා ඇත්නම් එම විභාගය පිළිබඳ විස්තර මෙහි දක්වන්න. ...

---

මෙහි සඳහන් කරන ලද ප්‍රකාශයන් මගේ දැනීම පරිදි හා විශ්වාසය පරිදි සත්‍ය බවත් මෙයට අලවා ඇත්තේ නිර්ව්‍යාජ වූ ද, එසේම කලින් පාවිච්චි නොකරන ලද්ද වූ ද මුද්දර බවත් මෙයින් දිවිරා සහතික කරමි.

මේ විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකහව ක්‍රියා කිරීමට ද බැඳෙමි. එසේම මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කරන ලද සේ සැලකීමට ඉඩ ඇති බව ද මැනවින් දනිමි.

| |
|---|
| විභාගාපේක්ෂකයා නියමිත මුද්දර මෙහි අලවා ඒ උඩ (දිනය ද යොදා) අත්සන් කළ යුතුයි. (මුද්දරවල වටිනාකම රුපියල් 20 යි) |

.............................................
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :.............................................

(සංලක්ෂ්‍යය.—අපේක්ෂකයා, ස්ථිර, තාවකාලික හෝ අනියම් වශයෙන්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක සේවයෙහි නියුක්ත වූවකු නම් ඔහු විසින් අත්සන් කළ යුත්තේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා හෝ එම ප්‍රධානයා වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියකු හෝ ඔහුගේ ප්‍රාදේශීය ප්‍රධානයා හෝ ඉදිරිපිට ය. අවශේෂ අපේක්ෂකයන් විසින් අත්සන් කළ යුත්තේ සමාදාන විනිශ්චයකාරයකු හෝ ආදායම් පාලක නිලධාරියකු හෝ පෙරකදෝරු කෙනෙකු හෝ නොතාරිස් කෙනෙකු හෝ රුපියල් 2,400ක් හෝ ඊට ඉහළ වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර සේවයෙහි නියුක්ත නිලධාරියකු හෝ යුද්ධ හමුදාවේ, නාවුක හමුදාවේ හෝ ගගන හමුදාවේ අධිකාරි නිලධාරියකු හෝ ඉදිරිපිට ය.)

---

අපේක්ෂකයා යම්කිසි තැනැත්තකු ඉදිරිපිට දී අත්සන් කරයි ද ඒ තැනැත්තාගේ සහතිකය

.................................................................................................... පදිංචි ....................................................

නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 196..............................................................................වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

සහතික කරන අයගේ අත්සන : ....................................................

නම, පදවිය හා තරාතිරම : ....................................................

....................................................................................

ලිපිනය : ....................................................................

....................................................................................

---

දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ සහතිකය

මේ අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් ස්වකීය සේවය සම්බන්ධව 7/8 වැනි කොටුවෙහි සඳහන් කර තිබෙන කරුණු පරීක්ෂාකර බලා ඒවා නිවැරදි බව හෙළි වූ බවත්, ඔහුගේ/ඇගේ* වැඩ කටයුතු හා හැසිරීම දිගටම සතුටුදායක/වූ* බවත් විභාගය පිළිබඳ රෙගුලාසිවල හැටියට ඔහු/ඇය* මේ විභාගය ගැනීමට සුදුස්සකු බවත් මෙයින් සහතික කරමි.

*තවද, මීට කලින් .................................................................................................... යන නමින් හඳුන්වනු ලැබූ මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව, 1957.8.18 වැනි දින අංක 394 දරණ භාණ්ඩාගාරයේ චක්‍ර ලේඛනයේ විධිවිධානවලට අනුව ස්වකීය නම ....................................................................................යන්නට දැන් වෙනස් කර ඇති බැව් වැඩි දුරටත් සහතික කරමි.

*අපේක්ෂා කරන පදවියට ඔහු/ඇය* තෝරාගනු ලැබුවහොත් දැනට ඔහු/ඇය* දරන තනතුරෙන් ඔහු/ඇය* මුදාලීමට පුළුවන.

....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන.

දිනය :................................................ පදවිය : ....................................................

*අනවශ්‍ය වචන කපා දමන්න

---

9 වැනි කොටුවෙහි සඳහන් වූ සහතිකයේ ආකෘති පත්‍රය

(i) ....................................................................................................................................
(පාඨශාලාවේ ලිපිනය)

(ii) ....................................................................(iii) ....................................................................
(පාලනය) (පාඨශාලාවේ නම)

පාඨශාලාවේ ප්‍රධානාචාර්ය (iv) .................................................................................................... වන
(ප්‍රධානාචාර්ය තැනගේ නම)

මම අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද මෙම පාඨශාලාවේ ශිෂ්‍යයකු වූ/ශිෂ්‍යාවක වූ (v) ....................................................

.................................................................................................... මෙම පාඨශාලාව මගින් පවත්වන ලද
(අයදුම්කරුගේ නම)

(vi) ....................................................................................විභාගයෙන් සමර්ථ වූ බව සහතික කරමි. මෙම විභාගය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික විභාගය හා සමාන ය.

....................................................
ප්‍රධානාචාර්ය තැනගේ අත්සන.

දිනය : 1965..................................මස.........වැනි දින

## ලංකාවේ විභාග දෙපාර්තමේන්තුව

# විභාගාපෙක්ෂකයන් සඳහා නීති

සියලු ම විභාගාපෙක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු ය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපෙක්ෂකයකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ රට වැඩි හෝ පමුණුවනු ලැබේ.

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම.

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයකට ම හෝ නුසුදුස්සකු කිරීම.

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.

(vi) විභාගාපෙක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපෙක්ෂකයා පොලිසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතර තුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවක දී වුවත් එවැනි විභාග අපෙක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

## නීති

1. සියලුම විභාගාපෙක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අයලදීත් විභාගශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපෙක්ෂකයන්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්ත ව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතු ය.

2. විභාගාපෙක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපෙක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නො ලැබේ. විභාගය පටන්ගෙන පැය බාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපෙක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපෙක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපෙක්ෂකයකු ම තමා ගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාගශාලාධිපතීන්ගේ විශෙෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නො කළ යුතුයි. තමන්ට නියම නො කරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්‍යමණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපෙක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නො ලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපෙක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නො හැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නො ලිය යුතුයි. මේ නීතිය නො සැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියාකිරීමකැයි සැළකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නවා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද කඩදාසි ඇතුළු පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුයි. ඒවා උත්තර පත්‍රයෙහි ම කොටසක් විය යුතුයි. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි.) විභාග ශාලාවේ දී ලියන ලද කිසි ම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එක ම ප්‍රශ්නයට පිළිතුරු දෙ තැනක ලියැවී තිබේනම් අනවශ්‍ය පිළිතුර පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මෙ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැලකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාද හෝ ගණන් කොහෙත් ම නොසාද හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත්, චිත්‍ර කර්මයෙහි දී තමන්ගේ චිත්‍රය තවත් අපෙක්ෂකයකුගේ චිත්‍රයකට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියෙකින් සමාන ව එසේ නැතිනම් බොහෝ සෙයින් කිට්ටුව තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතුවිය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටත ගෙන යාම තහනම් ය. මේ සියලුම ද විභාග කොමසාරිස් සතු ය. මේ නීතිය කඩ කිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතුවෙනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබැලි ද, තමන්ගේ පාටපෙට්ටි හෝ ජ්‍යාමිති උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවල දී, ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි, පෙට්ටි හා පාර්සල් ආදිය ද, ෆයිල් කවර, කාර්ඩ් බෝර්ඩ්, පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් ජේපර් යනාදිය ද විභාග ශාලාව තුළ සිටින කිසිම්ටක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නො ගත යුතුය. මේ නීතිය කඩකිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසි ම අපෙක්ෂකයකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියනලද කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් ය. විභාගශාලාධිපතින් නියම කළහොත් සෑම අපෙක්ෂකයාම තමන් සන්තකව තිබෙන ද මෙ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපෙක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම ද හොර උත්තර ලිවීමට යත්න දැරීම ද තහනම් ය. තවත් අපෙක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නො කළ යුතු ය. වෙන අයදුම්කරුවකුට උදවු දීමෙන් ද වෙන අයදුම් කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ උදවු ලබාගැනීමෙන් ද සම්පූර්ණයෙන් ම වැළකිය යුතු ය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක් ම ලියමින් සිටින කඩදාසිය යට තබාගත යුතුයි. ලියන ලද කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත්, ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසි විභාගාපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයකුට ඉන් පිටත යන්නට වුවමනා වුවොත් විභාගශාලාධිපතින්ගේ සහකාර නිලධාරියකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත්, නැවත විභාග ශාලාවට ඇතුළුවන විටත් ඔහු සෝදිසියකට භාජන විය යුතුයි.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියනවිට හෝ විභාගය පටන්ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුයි.

16. විභාගාපේක්ෂකයකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදවු දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

**විභාගාපේක්ෂකයන් සඳහා උපදෙස් :**

විභාගාපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කටවත් කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරි හැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත් වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසු කම ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැලකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නො කිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතුවිය හැකි ය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අනන්‍යතා පත්‍ර (හැඳින්වීමේ පත්‍ර) ඉදිරිපත් කළ යුතු අපේක්ෂකයන් සෑම විෂයයකට ම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නො කළහොත් ඔබේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට ඉං සලසා ගත යුතු ය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියනකඩදසි, තීන්ත පොවන කඩදසි, ප්‍රස්තාර කඩදසි, ලැජර් කඩදසි, සාරාංශ ලියන කඩදසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අඩුතු වෝස්තර යක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නො පමාව ම විභාගශාලාධිපතින්ට දන්විය යුතු ය. විභාග ශාලාවේ දී ඔබට ම දෙනු ලබන කඩදසි හැර වෙන මොන ම කඩදසියක් වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නො කළ යුතුයි. ඉතිරි වන කඩදසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදසියක ම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නො පමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදසියේ දෙ පැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස් ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ලෙසට තෝරා බේරා ගන්නට නො හැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයකට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමෙන් නිවැරදි ලෙස යෙදිය යුතු යි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධ ව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නො සලකා හැරීමෙන් බොහෝවිට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගණ බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දක්විය යුතු යි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර විය යුතු අවස්ථා වල දී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙළ අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නො ගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින් ම බාර දිය යුතු ය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතු ය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍ර නැතිව යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නො දිය යුතු ය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ කථා කිරීම අවශ්‍ය වූ විට ද, කඩදසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නො නැගිට අත පමණක් එසවිය යුතු ය.

එච්. එල්. විමලසූරිය,
වැඩබලන විභාග කොමසාරිස්.

කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

11-742—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

1. ශුද්ධ කිරීමේ කුඩු සැපයීම.
2. වතේ කැබිනට් සහ කබඩ් සැපයීම.
3. මෝටර් රථ වාහන ඇදියට බැටරි සැපයීම.

ඉහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1965.12.14 නොව 1965.12.28 බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් කරුණාවෙන් සලකත්වා.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

වර්ෂ 1965ක් වූ නොවැම්බර් මස 19 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේදීය.

11-748—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

### කල්පිටියේ නාවික හමුදා කඳවුරට ආහාර ද්‍රව්‍ය (අමු හා වියලි) සැපයීම

1965 නොවැම්බර් 5 දින අංක 14,550 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ (1457 වැනි පිටුව) පළ වූ අංක 11-109 දරණ, ඉහත සඳහන් සේවය වෙනුවෙන් ටෙන්ඩර් කැඳවීමේ නිවේදනයේ 3 වැනි ඡේදය සම්බන්ධයෙන්, ටෙන්ඩර් පත්‍ර නිකුත්කිරීම 1965 දෙසැම්බර් 4 වැනි සෙනසුරාදා මධ්‍යාහනයේ 12 දක්වා යනුවෙන් දිනයක් ඉදිරියට ගෙන ඇති බැව් ටෙන්ඩර්කරුවන් වෙත මෙයින් නිවේදනය කෙරේ.

ඉ. සී. තේජ්ව,
ලුතිනන්, (සැ.) රා. ලං. නා. හ.,
නාවික හමුදාධිපති වෙනුවට.

1965 නොවැම්බර් 12 වැනිදා,
නාවික ආහාර හා නිල ඇඳුම් අංශය,
නාවික හමුදා මූලස්ථානය,
කොසිගහ වීදිය,
කොළඹ.

11-769—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1965 දෙසැම්බර් මස 15 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා වැලිගම කප්පරතොට වෙරළට ටොන් 1/2 සිට ටොන් 1 දක්වා බර ඇති කළුගල් 2,000 ක් සහ අඟල් 9-12 සක්කගල් කියුබ් 100 ක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1965 දෙසැම්බර් මස 15 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25 ක මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1965 දෙසැම්බර් මස 13 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ආර්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස්.

1965. 11 12,
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදීය.

11-610—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## 1965–66 මුදල් වර්ෂය තුල බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත්කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපයීම

බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් 1966 ජනවාරි මස 1 ද සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පිසනු ලැබූ ආහාර සැපයීම සඳහා 1965.12.3 දින පෙරවරු 10 දක්වා ඒ ඒ බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර්, ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.) භාරගනු ලැබේ. එම දිනවල පෙරවරු 10.05ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් ආහාර සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේ දී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේ දී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නැති නම හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත්තේ ය.

3. ආහාර සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් වේ :—

*උදය ආහාරය—*

(අ) ආප්ප හෝ ඉදිආප්ප (අවුන්ස 6කට නොඅඩු විය යුතුයි) ;
(ආ) හකුරු අවුන්ස එකක් හෝ සම්බෝල ;
(ඇ) සීනි දමන ලද තේ කෝප්පයක්.

*දිවා භෝජනය—*

(අ) හාල් අවුන්ස 8 ප්‍රමාණය තැම්බූ බත් පිඟානක් ;
(ආ) හරක් මස් හෝ මාලු හෝ කරවල අවුන්ස 2 යි ;
(ඇ) එළවළු ව්‍යන්ජන ශාකයි; එක ව්‍යන්ජනයක් අවුන්ස 2 ප්‍රමාණය විය යුතුයි.

සැ. යු.—(1) සලාක කිරීම නිසා නොහොත් වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා සම්පූර්ණ ආහාර ප්‍රමාණයක් හෝ ඉන් කොටසක් හෝ සැපයිය නොහැකි නම්, අධිකාරී තැනගේ අභිමතය පරිදි කොන්ත්‍රාත්තුවට බැඳී ඇති වෙළඳ මිළ ප්‍රමාණයට සැහෙන සේ ආදේශක ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරුවනට පිළිවන.

(2) කොන්ත්‍රාත්කරුවන්ගෙන් උදය ආහාරය ලබාගනු ලබන්නේ ආයතනය මගින් එය අඩු මිලකට සපයා ගැනීමට නොහැකි වූවහොත් පමණකි.

4. සියළුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා සිල් තබා උපලේඛනයේ සඳහන් අධිකාරී තැන වෙත රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නොයවන ටෙන්ඩර් පත්‍ර එම අධිකාරී තැනට හෝ ඔහු විසින් පත් කරන ලද බලයලත් නියෝජිතයෙකු වෙත නම් ඔහුට හෝ භාරදී එය භාර ගත් බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "1965–66 වර්ෂය තුළ බන්ධනාගාර සහ සිරසැල්වල් සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ට පිසන ලද ආහාර සැපයීමේ ටෙන්ඩරය." යැයි ලියා උපලේඛනයෙහි සඳහන් දිනවල මෙහි 1 වැනි ඡේදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරී තැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නතර කළ දින සිට සති 6ක් යනතුරු ටෙන්ඩර් කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර් කරුවන් විසින් කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර අධිකාරින්ගේ කාර්යාලවල හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරිය හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම ලබා ගත හැකිය.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීම පුළුවන් නො විනි නම් හෝ එසේ කිරීමෙන් වැළැකී සිටිනම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජ සන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනයේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට, එම ටෙන්ඩර්කරුවනට සිදු වෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නිති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාරදුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල්, කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු, එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවෝ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම ඉදිරිපත් කළ යුතුයි. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවය නිසියාකාර ඉටු කිරීමේ දී දත යුතු සියලුම අවශ්‍ය කරුණු දත ගැනීම සඳහා උපලේඛනයේ සඳහන් අධිකාරිවරුන් ගෙන් විමසනු මැනවි.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමඟ කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දනට එම පදවිය දරන්නා වූ ද නිලධාරියා ද ඔහුට පසු එම පදවිය දරන්නා වූ නිලධාරියා ද වේ.

1965 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

උප ලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාරගන්නා නිලධාරියා |
|---|---|---|---|
| | රු. | රු. | |
| කෑගල්ල සිරසැල සහ උසාවිය | 25 | 100 | නුවර බන්ධනාගාර අධිකාරි |
| කළුතර සිරසැල සහ උසාවිය | 10 | 50 | කොළඹ රිමාන්ඩ් අධිකාරි |

11-617—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## ලුණු දෙපාර්තමේන්තුව

### බීමට ජලය සැපයීම

වර්ෂ 1966 ජනවාරි 1 වැනි දින පටන් 1966 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා පුත්තලමේ නැගෙනහිර සහ බස්නාහිර ලුණු ලේවායන්හි නියුක්ත සායම් මණ්ඩලයට බීමට සුදුසු ජලය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1965 ක් වූ දෙසැම්බර් මස 10 වෙනි දින පස්වරු 3 වනතුරු කොළඹ, කොටපෙස් සැට්ටියේ, අංක 110, සර් ජේම්ස් පීරිස් මාවත, තැපැල් පෙට්ටිය 539 දරණ ස්ථානයේ ලුණු කොමසාරිස් තැන විසින් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ පුත්තලමේ ප්‍ර. ලුණු අධිකාරි තැනගෙන් 1965 දෙසැම්බර් මස 9 වෙනි දින දවල් 12 දක්වා ලබා ගත හැකි පෝරම් කොළවලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25 ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම් කොළ දෙනු ලැබේ.

ජේ. ජේ. ජී. අබේරත්නනායගම්,
ලුණු කොමසාරිස්.

පිඑ/293.
1965 නොවැම්බර් 12 වෙනි දින,
කොළඹ.

11-756—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## ලුණු දෙපාර්තමේන්තුව

1966 ජනවාරි මස 1 වැනි දින සිට 1966 දෙසැම්බර් මස 31 වැනි දින වනතුරු අලිමන්කඩ ලුණු ලේවායේ සිට මූලතිව් ලුණු ගබඩාවට ගෝනිවල අසුරන ලද ලුණු පටවා ගෙන යාම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවතේ අංක 110, තැ. පෙ. 539 දරණ ලිපිනයට ලුණු කොමසාරිස් තැන විසින් 1965 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා පස්වරු 3 වනතුරු භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ, අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ අලිමන්කඩ ප්‍ර. ලුණු අධිකාරි තැනගෙන් ලබා ගන්නා පෝරම කොළවලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25 ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ. වැඩි විස්තර ඉහත සඳහන් අයවලුන්ගෙන් ලබාගත හැක.

ජේ. ජේ. ජී. අබේරත්නනායගම්,
වැඩ බලන ලුණු කොමසාරිස්.

අංකය : වි. ජී. 294.
1965 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ.

11-755—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

උඩුනුවර, හේවාහැට සහ ඇඳිගම යන ස්ථානයන්හි බලවේග පේෂ කම් හල්වලට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා, සම්දේශ කටයුතු භාර අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 65.12.17 දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පහත සඳහන් දෙපාර්තමේන්තුවක රු. 1,00,000කට හෝ ඊට වැඩි ගොඩනැගිලි වැඩ සඳහා හෝ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට මේයට සහභාගි විය හැක.

(අ) රජයේ වැඩ දෙපාර්තමේන්තුව.

(ආ) මහාමාර්ග දෙපාර්තමේන්තුව.

(ඇ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

(ඈ) දුම්රිය දෙපාර්තමේන්තුව.

3. මේයට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100ක ඇප මුදලක් මේ කාර්යාලයේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කර 65.12.13 දින දහවල් 12ට ප්‍රථම කුවිතාන්සිය ඉදිරිපත් කර ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පැමිණිය හැක. ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලබන්නේ 65.12.17 දින පෙරවරු 9.30ට සම්දේශ කටයුතු භාර අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපතිතුමාගේ කාර්යාලයේ දිය.

පී. එච්. පී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
වැඩ බලන අධ්‍යක්ෂක.

1965 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ 7,
මොරින් වත්ත, චතුරශ්‍රයේ දී ය.

11-760—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පේෂකර්ම අත්යන්ත්‍ර උපකරණ සැපයීම සම්බන්ධව ම විසින් 65.11.5 වැනි දින ගැසට් පත්‍රයේ පළ කැරවූ 65.10.30 දින දරන ටෙන්ඩර් දැන්වීමෙහි සඳහන් "පේෂකර්ම අත් යන්ත්‍ර තොගයක්" යන වාක්‍ය ඛණ්ඩය "පේෂකර්ම අත් යන්ත්‍ර උපකරන තොගයක්" කියා නිවැරදි විය යුතු බව මෙයින් දන්වමි.

ඩී. එච්. ඩී. ද සිල්වා,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත වැඩ බලන අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් 15 දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේදී ය.

11-754—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයට පිවිසෙන පාරේ අග සිට අනුරාධපුර-පුත්තලම් පාරට යාවෙන පාරේ 4 වන සැතපුම, සක්කගල් අල්ලා කුඩා ගල් දමා තාර දැමීම (ටෙන්ඩර් අංක ආර්.ඇල්. 5) සඳහා ටෙන්ඩර් පත් 1965.12.14 වෙනි දින පෙ. ව. 10 දක්වා භාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000 කට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට, සමූපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ හැක.

3. 1965.12.10 වැනි දින තෙක් (එදින ඇතුළුව) කාර්යාලීය වේලාවන් තුළදී පහත සඳහන් වාරිමාර්ග කාර්යාලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි:—

1. කුරුණෑගල, 2. පුත්තලම.

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තුමන්ගෙන් ලබාගත හැක.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම,
1965.11.10 වැනි දින.

11-646/1—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයට පිවිසෙන පාරේ අග සිට අනුරාධපුර-පුත්තලම් පාරට යාවෙන පාරේ 5 වන සැතපුම, සක්කගල් අල්ලා කුඩාගල් දමා තාර දැමීම (ටෙන්ඩර් අංක ආර්. ඇල්. 6) සඳහා ටෙන්ඩර් පත් 1965.12.14 වෙනි දින පෙ. ව. 10 දක්වා භාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000 කට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට, සමූපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ හැක.

3. 1965.12.10 වැනි දින තෙක් (එදින ඇතුළුව) කාර්යාලීය වේලාවන් තුළදී පහත සඳහන් වාරිමාර්ග කාර්යාලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි:—

1. කුරුණෑගල, 2. පුත්තලම.

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තුමන්ගෙන් ලබාගත හැක.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම,
1965.11.10 වැනි දින.

11-646/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයට පිවිසෙන පාරේ අග සිට අනුරාධපුර-පුත්තලම් පාරට යාවෙන පාරේ 6 වන සැතපුම, සක්කගල් අල්ලා කුඩාගල් දමා තාර දැමීම (ටෙන්ඩර් අංක ආර්.ඇල්. 7) සඳහා ටෙන්ඩර් පත් 1965.12.14 වෙනි දින පෙ. ව. 10 දක්වා භාර ගනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000 කට ලියා. පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් සකස් කල හැක.

3. 1965.12.10 වැනි දින තෙක් (එදින ඇතුලුව) කාර්යාලීය වේලාවන් තුලදී පහත සඳහන් වාරිමාර්ග කාර්යාලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි පෝරම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි:—

1. කුරුණෑගල,
2. පුත්තලම.

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුලදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තුමන්ගෙන් ලබාගත හැක.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද.

වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපරය, තඹුත්තේගම,
1965.11.10 වැනි දින.

11-646/3—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයට පිවිසෙන පාරේ අග සිට අනුරාධපුර-පුත්තලම් පාරට යාවෙන පාරේ 7 වන සැතපුම, සක්කගල් අල්ලා කුඹාගල් දමා තාර දැමීම (ටෙන්ඩර් අංක ආර්.ඇල්. 8) සඳහා ටෙන්ඩර් පත් 1965.12.14 වෙනි දින පෙ. ව. 10 දක්වා භාර ගණු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 40,000 කට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් සකස් කල හැක.

3. 1965.12.10 වැනි දින තෙක් (එදින ඇතුලුව) කාර්යාලීය වේලාවන් තුළදී පහත සඳහන් වාරිමාර්ග කාර්යාලයන්හි ඉංජිනේරු මහතුන්ගෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි :—

1. කුරුණෑගල.
2. පුත්තලම.

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම්, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී ඉහත සඳහන් වාරිමාර්ග ඉංජිනේරු තුමන්ගෙන් ලබාගත හැක.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
වාරිමාර්ග ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

වාරිමාර්ග කාර්යාලය,
රාජාංගන ව්‍යාපාරය, තඹුත්තේගම.
1965.11.10 වැනි දින.

11-646/4—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

හක්වටුන ඔය ජලාශ ව්‍යාපාරයේ ප්‍රධාන දකුණු ඇලේ සැතපුම් 6 දම්වැල් 13 සිට සැතපුම් 6 දම්වැල් 26 දක්වා ඇල වේල්ල ඉදිකිරීම සහ පාර සෑදීම සඳහා ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් අයදුම් පත් කොළඹ, තැ. පෙ. අංක 500 මහා ලේකම් ගොඩනැගිල්ලේ අංක 355 දරණ කාමරයෙහි ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 දෙසැම්බර් 21 කුජ දින පූර්ව භාග 10 වන තෙක් භාර ගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 1,00,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ පස් වැඩ කිරීමට යෝග්‍ය යන්ත්‍ර ඇති කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක. කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයයෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම අනුපිටපතක් සමඟ පුරවා ඉදිරිපත් කළ යුතුය.

රුපියල් 200ක ටෙන්ඩර් ඇප මුදලක් වාරිමාර්ග අධ්‍යක්ෂක කාර්යාලයයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කාර්යාලයීය වේලාවන් තුළ 1965 දෙසැම්බර් 17 වැනි කිවි දින හෝ ඊට පෙර කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් පෝර්ම ලබාගත හැක.

මෙ ගැන වැඩි විස්තර කුරුණෑගල, වයඹ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඞී. ජේ. රාමනායක,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

11-601—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—අනුරාධපුර උප කොට්ඨාශය

අනුරාධපුර, උතුරු මැද කොටසේ ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා 1965 දෙසැම්බර් මස 7 වැනි අඟහරුවාද දක්වා ටෙන්ඩර් අයදුම් පත් භාර ගනු ලැබෙ. ටෙන්ඩර් විවෘත කිරිම එහිදී එදිනම සිදු කරනු ලැබෙ.

නාච්චාදූව වාරිමාර්ග පාරට ගල් සහ තාර දැමීම

| අංකය | විස්තර | උවමනා ලියා පදිංචි වු ප්‍රමාණය |
|---|---|---|
| 1 ... | 1 වැනි සැතපුම | ... රු. 34,000 හා ඊට වැඩි |
| 2 ... | 2 වැනි සැතපුම | ... රු. 34,000 හා ඊට වැඩි |
| 3 ... | 3 වැනි සැතපුම | ... රු. 35,000 හා ඊට වැඩි |
| 4 ... | 4 වැනි සැතපුම | ... රු. 36,000 හා ඊට වැඩි |
| 5 ... | 5 වැනි සැතපුම | ... රු. 37,000 හා ඊට වැඩි |

වාරිමාර්ග දෙපාර්තමෙන්තුවෙ ඉහත සඳහන් ගණන් වලට හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන්ට, ග්‍රාම සංවර්ධන සමිති වලට හා සමුපකාර සංගම් වලට මෙම වැඩ සඳහා ටෙන්ඩර් ඉල්ලුම් කල හැක.

වර්ෂ 1965 නොවැම්බර් මස 19 වැනි දින සිට 65.12.3 දින දක්වා කාර්යාලිය වෙලාවන් තුලදී අනුරාධපුර වාරිමාර්ග, පදවිය, මහකනදරාව වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයන්ගෙන් ලබා ගත හැකි පෝර්ම වල පමණක් අයදුම් පත් ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් පෝර්ම කොල ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමෙන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ තිබෙද? නැද්ද? යන්න ගැන සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල යුතුය. පෝර්ම කොල නිකුත් කිරීමට ප්‍රථම රු. 50 ක තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ දිවයිනේ ඕනෑම කච්චෙරියක තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

මෙ සම්බන්ධයෙන් ගිවිසුම, වැඩ සැලසුම ආදී වැඩි විස්තර කාර්යාලිය වෙලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

එම්. රත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු,
අනුරාධපුරය.

1965 නොවැම්බර් 13 දින,

11-683—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වවුනියා උප කොට්ඨාශය

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වවුනියා උප කොට්ඨාශයේ සින්නතම්පනෙයිකුලම් අළුත්වැඩියා කිරීම පිණිස අයදුම්පත් වවුනියාවේ උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1965 දෙසැම්බර් මස 14 වෙනි අඟහරුවාදා පෙ. ව. 10.00 වන තෙක් භාරගනු ලැබේ. එදින ටෙන්ඩර් අයදුම්කරුවන්ට පෙනී සිටිය හැකිය.

මේ සේවය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 36,000කට හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචිවූ ලාංකික කොන්ත්‍රාත් කරුවන් පමණක් සුදුස්සෝ වෙති.

ටෙන්ඩර් අයදුම් පත් දෙපිටපතකින් පිළියෙල විය යුතුය. 1965 දෙසැම්බර් මස 10 වෙනි දින දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් අයදුම් පත් ලබාගැනීම පිණිස රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කොළඹින් පිටස්තර ඕනෑම කච්චේරියක හෝ කොළඹ වාරිමාර්ග අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ හෝ වවුනියා උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. පහත සඳහන් කාර්යාල වලින් කාර්යාල වේලාවන් තුලදී ටෙන්ඩර් පත් ලබා ගත හැකිය. වාරිමාර්ග ඉංජිනේරු, යාපනය උප කොට්ඨාශය—කිලිනොච්චිය, වාරිමාර්ග ඉංජිනේරු, මුලතිව් උප කොට්ඨාශය-ඔඩ්ඩුසුඩාන්, වාරිමාර්ග ඉංජිනේරු, වවුනියා උප කොට්ඨාශය-වවුනියා, වාරිමාර්ග ඉංජිනේරු, මන්නාරම උප කොට්ඨාශය-මුරුන්කන්.

මේ සඳහා වැඩි විස්තර වවුනියා උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය.

කේ. ෂන්මුගනාදන්,
වවුනියා උ. කො. වාරිමාර්ග ඉංජිනේරු තැන.

1965.11.13.
වවුනියාව,
වාරිමාර්ග කාර්යාලයේදීය.

11-690—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 65/66 මුදල් වර්ෂය තුළ ගොවිපලවල හැදෙන පොල් විකිණීම

කොළඹ, ග්‍රෙගරි පාරේ, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන විසින්, ලබුදූව, කොරණ, වල්පිට සහ පස්සර යන රජයේ ගොවිපල 1965/66 මුදල් වර්ෂය තුළ හැදෙන පොල් විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් මස 15 වැනි දින දහවල් 12 දක්වා භාර ගනු ලැබේ.

2. මිල ගණන් සඳහන් කළ යුත්තේ පොල් දහසක් (1000) සඳහාය.

3. ටෙන්ඩර් ආකෘති පත්‍ර, කොළඹ 7, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන විසින් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර එසේ නිකුත් කරනු ලබන්නේ එක් ටෙන්ඩර යක් සඳහා රුපියල් 25 ක් බැගින් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ ඉහත සඳහන් ගොවිපලක හෝ කළ හැකිය.

4. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන්, "පරිපාලන නිලධාරි, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලය, තැ. පෙ. 622, කොළඹ 7" යන ලිපිනයට එවිය යුතු අතර ලියුම් කවරයේ වම් කෙළවරේ මුදුනේ "පොල් සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

5. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් ඉහත කී පරිපාලන නිලධාරි තැන සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

6. මේ පිළිබඳ වැඩි විස්තර කොළඹ ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩී. පී. ආර්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් දින,
පේරාදෙණියේ දීය.

11-685/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පැල වූ දෙල් මුල් කැබලි 10,000ක් සැපයීම

කොළඹ 7, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන විසින් පැල වූ දෙල් මුල් කැබලි 10,000ක් සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් 15 වැනි දින දහවල් 12 දක්වා භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ 7, ග්‍රෙගරි පාරේ, අංක 54 දරණ ස්ථානයේ ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන විසින් නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ආකෘති එසේ නිකුත් කරනු ලබන්නේ එක් ටෙන්ඩරයක් සඳහා රුපියල් 10ක් බැගින් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ කළ හැකිය.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් "පරිපාලන නිලධාරි ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලය, තැ. පෙ. 622, කොළඹ 7" යන ලිපිනයට එවිය යුතු අතර ලියුම් කවරයේ වම් කෙළවර මුදුනේ "දෙල් පැල සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

4. මෙම දෙල් මුල් කැබැල්ලක් අඟල් 4 වත් 6වත් අතර දිග තිබිය යුතු අතර ඇඳුනුදල්ල පවත් පිරිසෙයින් අඟල් 9වත් 18වත් අතර දිග තිබිය යුතුය.

5. ටෙන්ඩර්කරු විසින් මෙම දෙල් පැල ඉහත කී පරිපාලන නිලධාරි තැන විසින් නියම කරනු ලබන කොටස් වශයෙන් කරඹෑව, අඹේපුස්ස, කොරණ, වල්පිට හා පස්සර යන ගොවිපලවලට ගෙන ගොස් භාරදිය යුතුය. මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ ප්‍රවාහන ගාස්තුද ඇතුළුවය.

6. වැඩි විස්තර "කොළඹ 7, ග්‍රෙගරි පාරේ, අංක 54 දරණ ස්ථානයේ, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයෙන්" ලබාගත යුතුය.

ඩී. පී. ආර්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් දින,
පේරාදෙණියේ දී ය.

11-685/3—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ලබුදූව රජයේ ගොවිපලේ නිපදවනු ලබන එළ කිරි විකිණීම

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, ලබුදූව, රජයේ ගොවිපලේ නිපදවනු ලබන එළ කිරි විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, 1965 දෙසැම්බර් 15 දින දහවල් 12.00 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ කිරි පයින්ට් එකක් සඳහාය.

3. දිනට කිරි පයින්ට් 200 වත් 400 වත් අතර ප්‍රමාණයක් නිපද වනු ඇත. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් ලබුදූව ගොවි පලේදීම මෙම කිරි භාර ගෙන ඉවත ගෙන යා යුතුය. මෙම කොන්ත්‍රාත්තුව පවතිනු ඇත්තේ 1966 සැප්තැම්බර් 30 දින තෙක් පමණි.

4. ලබුදූව රජයේ ගොවිපලේ හෝ ඕනෑම කච්චේරියක රුපියල් 25 ක් තැන්පත් කොට එම කුවිතාන්සිය, කොළඹ 7, ග්‍රෙගරි පාරේ අංක 54 දරණ ස්ථානයේ, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන වෙත ඉදිරිපත් කළ විට, ඔහු විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

5. එසේ ලබා ගන්නා ආකෘති පත්‍ර, දෙපිටපතකින් යුතුව, ලියා පදිංචි කළ තැපෑලෙන් "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම් කෙළවර මුදුනේ, 'ලබුදූව කිරි සඳහා ටෙන්ඩර්' යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර්කරුවනට වුවමනානම්, ටෙන්ඩර් විවෘත කරන වේලා වේදී, ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් ඇස්තමේන්තු කරන ලද අවුරුද්දකට නිපදවනු ලබන කිරි ප්‍රමාණයේ වටිනාකමින් සියයට 5 ක තැන්පත් මුදලක් ගෙවා කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

8. මේ පිළිබඳ වැඩි විස්තර, ලබුදූව රජයේ ගොවිපලෙන් හෝ කොළඹ 7, ග්‍රෙගරි පාරේ, අංක 54, දරණ ස්ථානයේ ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩී. පී. ආර්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් දින,
පේරාදෙණියේ දීය.

11-685/4—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අඹේපුස්ස රජයේ ගොවිපලේ නිපදවනු ලබන එළ කිරි විකිණීම

පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් අඹේපුස්ස රජයේ ගොවිපලේ නිපදවන එළකිරි විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් 15 වැනි දින දහවල් 12.00 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ කිරි පයින්ට් එකක් සඳහාය.

3. දිනකට කිරි පයින්ට් 200 වත් 400 වත් අතර ප්‍රමාණයක් නිපදවනු ඇත. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් අඹේපුස්ස ගොවිපලේදීම මෙම කිරි භාර ගෙන ඉවත ගෙන යා යුතුය. මේ කොන්ත්‍රාත්තුව පවතිනු ඇත්තේ 1966 සැප්තැම්බර් 30 වැනි දින තෙක් පමණි.

4. අඹේපුස්ස රජයේ ගොවිපලේ හෝ ඕනෑම කච්චේරියක රුපියල් 25 ක් තැන්පත් කොට එම කුවිතාන්සිය කොළඹ 7, ග්‍රෙගරි පාරේ, අංක 54 දරණ ස්ථානයේ, ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනවෙත ඉදිරිපත් කළ විට ඔහු විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

5. එසේ ලබා ගන්නා ආකෘති පත්‍ර, දෙපිටපතකින් යුතුව, ලියාපදිංචි කළ තැපැලෙන් "සභාපති ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම් කෙළවර මුදුනේ "අබේපුස්ස කිරි සඳහා ටෙන්ඩර්" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම්, ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

7. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් ඇස්තමේන්තු කරන ලද, අවුරුද්දකට නිපදවනු ලබන කිරි ප්‍රමාණයේ වටිනාකමින් සියයට 5 ක තැන්පත් මුදලක් ගෙවා කෘෂිකර්ම අධ්‍යක්ෂ සමග ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

8. මේ පිළිබඳ වැඩි විස්තර අබේපුස්ස රජයේ ගොවිපලෙන් හෝ කොළඹ 7, ග්‍රෙගරි පාරේ අංක 54 දරණ ස්ථානයේ ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් දින,
පේරාදෙණියේදීය.

11–685/5—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ගොඩනැගිලි තැනීම

වල්පිට රජයේ ගොවිපොලේ 3 බී නිවාසයක් තැනීම සඳහා ටෙන්ඩර් පත් 1965.12.13 වැනි දින ප. ව. 2.30 වන තෙක් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) ගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවලය. සියලුම ටෙන්ඩර් දෙපිටපතකින් යුක්ත විය යුතු අතර, අත්සන් කොට කවරයක බහා එය සීල් තබා කවරයේ වම් පස උඩ කෙළවරෙහි "වල්පිට 3 බී නිවාසයක් තැනීම සඳහා ටෙන්ඩර්" යන්න ලියා පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය.

3. මෙම ටෙන්ඩර් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුය. නැතහොත් ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

4. ලියාපදිංචි කළ තැපැලෙන් එවුණු ටෙන්ඩර් ලැබුණු බව එසේ එවූ සියලුම ටෙන්ඩර්කරුවන් වෙත, ටෙන්ඩර් විවෘත කෙරෙන දිනයෙහිදී දන්වා එවනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දිනයෙහි සිට දින 4 ක් ඇතුළතදී යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට සිය ටෙන්ඩරය ලැබුණු බවට නිවේදනයක් නොලැබුන හොත් ඔහු විසින් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුය.

5. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී පෙනී සිටීමට ටෙන්ඩර්කරුවන් බලාපොරොත්තු වන්නේ නම් ඔවුන්ට ඒ සඳහා අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනු ලබන්නේ ටෙන්ඩර් දෙපාර්තමේන්තුවේ දීය. පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙළ කර ගෙන, තම තමන් විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්වල අනු පිටපත් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර් ආකෘතිපත්‍ර, රු. 50,000කට අධික වටිනාකමකින් යුත් ගොඩනැගිලි කටයුතු සඳහා රජයේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් පමණක්, ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි සහ රු. 50ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1965.12.10 වැනි දින දවල් 12 වන තෙක් ලබාගත හැකිය. ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කළ යුත්තේ ඕනෑම කච්චේරියක නැතහොත් කොළඹ මහා භාණ්ඩාගාරයෙහි ය. ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් පත්‍රයට අත්සන් තැබූ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ. ජයග්‍රාහක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10 ක් ඇතුළතදී නියමිත ඇපය තැබීමට හෝ ගිවිසුම අත්සන් කිරීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට, ඔහු ගෙන් රජයට ලැබිය යුතු වෙනත් දේ ලබා ගැනීමට හානියක් නොවන සේ ඔහුගේ නමද සේවය පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් ගේ ලේඛනයෙහි ඇතුලත් කරනු ලැබේ. පහත සඳහන් ආයතන හා පුද්ගලයන් ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කරනු ලැබේ. (අ) සමූපකාර තොග වෙළඳ ආයතනය (ආ) වෙනත් ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංස්ථා—උදා: ජාතික යන්ත්‍රෝපකරණ ආයතන සංස්ථාවේ සභාපති, (ඉ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ අනුමත කළ ග්‍රාම සංවර්ධන සමිති, (ඊ) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

7. නියමිත ආකෘතියෙහි ඉදිරිපත් නොකැරුණු හෝ එම ආකෘතියෙහි සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ හෝ කවර ටෙන්ඩරයකුදු සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් කරන ගාස්තු ප්‍රමාණයන් හා මිල ගණන් තීන්තෙන් පිරිසිදුව සඳහන් කළ යුතු අතර, වෙනස් කළ හැම තැනක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය. ටෙන්ඩර් කරන මිල ගණන් වචන හා ඉලක්කම් යන දෙආකාරයෙන්ම දැක්විය යුතුයි.

8. ටෙන්ඩර්කරුවන් විසින් සිය ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී අදාල ප්ලෑන් හා ටෙන්ඩරයේ කොන්දේසි හදාරා ඇතැයිද, අදාල භූමි භාගයට ගොස් එය පරීක්ෂා කරන ලදැයිද, ඊට සම්බන්ධ හැම කරුණු ගැනම එනම් දේශීය තත්ත්වය, දේශීය කම්කරු තත්ත්වය, ගෙවීම් ප්‍රමාණ, ප්‍රවාහණ පහසුකම් හා එම භූමි භාගයට යාම් ඊම් පහසුකම් ඇතුළු ස්වකීය ටෙන්ඩරයට කවරාකාරයකින් හෝ බලපාන සෙසු සියලුම තත්ත්වයන් මනාවැ අවබෝධ කර ගන්නා ලදැයිද සලකනු ලැබේ.

9. භූමිභාගය එළි කිරීමේ කාර්යය සඳහා ටෙන්ඩර්කරුවන් විසින් ලංකාවට ගෙන්වීමට අදහස් කරන සියලුම යන්ත්‍ර, උපකරණ හා ද්‍රව්‍ය පිළිබඳ උප ලේඛනයක්ද ඔවුන්ගේ ටෙන්ඩර් සමග ඉදිරිපත් කළ යුතු අතර, එම යන්ත්‍ර, උපකරණ සහ ද්‍රව්‍යවල නියමිත මිල ගණන්ද රුපියල්වලින් දැක්විය යුතුය.

10. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ මිල ගණන්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට සති 12 ක් ඉකුත් වෙනතෙක් භාරගත හැකිවන පරිදි විවෘතව තැබිය යුතුය. ගොඩනැගිලි ඉදි කිරීම ටෙන්ඩරය භාරගත් දින සිට මාස 4 ක් ඇතුළතදී සම්පූර්ණ කිරීමට ටෙන්ඩර්කරු වග බලා ගත යුතුය. එසේ කිරීමට අසමත් වුවහොත් ප්‍රමාදය සඳහා දඩුවමක් වශයෙන් නොව ප්‍රමාණ කළ අලාභ වශයෙන් එම වැඩය සම්පූර්ණ කරන තෙක් එක ගොඩනැගිල්ලකට එක දිනකට රු. 20 ක මුදලක් බැගින් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

11. ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දී දින 10 ක් ඇතුළතදී ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් ගිවිසුමකට ඇතුළත් වී ටෙන්ඩර් කළ මුදලින් සියයට පහකට සමාන මුදලක්ද ඕනෑම කච්චේරියක කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කළ යුතුය. මෙම මුදල ආපසු ගෙවනු ලබන්නේ කොන්ත්‍රාත්තුව සතුටුදායක අන්දමින් සම්පූර්ණ කළ පසුව පමණයි. කොන්ත්‍රාත්තුව නිසියාකාර ඉටු කිරීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු අසමත් වුවහොත් ඔහු ගේ ඇප තැන්පත් මුදල රාජසන්තක කොට, ඔහුගෙන් රජයට ලැබිය යුතු වෙනත් දේ ලබා ගැනීමට හානියක් නොවන සේ, ඔහුගේ නමද සේවය පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබේ. මුද්දර ආඥාපනතට අනුකූලව ගිවිසුමට සහ/හෝ බැඳුම්කරයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකමද ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුය.

12. ඉහත සඳහන් කර්මාන්ත කරගෙන යාමේදී සියයට සියයක් ලාංකික කම්කරුවන්ම ඒ සඳහා යෙදවීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු වගබලා ගත යුතුය. මෙම සංඛ්‍යාව වෙනස් කළ හැක්කේ ස්ථිර ලේකම්වරයාගේ අනුමතිය ලබාගෙන පමණකි. "ලාංකික" යන පදයෙන් අදහස් කරනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ රට වැසියකු වන කෙනෙකි. කාර්ය නියුක්ත කිරීමට හෝ ක්‍රියා කිරීම මෙහෙය වීමට පුහුණු පුද්ගලයන් පිටරටින් ගෙන්වීම සංක්‍රමණ නීතිරීතිවලට යටත්ව කළ යුතුය. ඒ පිළිබඳ විධිවිධාන සලසා ගැනීමද ටෙන්ඩර්කරුවන් විසින්ම කරගත යුතුය.

13. 1934රේ අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (අධිකාරය 117) යටතේ සේවකයකු විසින් හෝ සේවකයකු සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන කවර වන්දියක් සම්බන්ධයෙන් වුවද රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරු වගබලා ගත යුතුය.

14. ඇපකරුවකු හෝ වැඩි දෙනෙකු ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා නියම කළහොත් එසේ ඉදිරිපත් කිරීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර්කරු විසින් නම් කෙරෙන එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලැබුවහොත්, කොන්ත්‍රාත්කරුගේ වියදමින් බැඳුම්කරයකට අත්සන් තැබීමට ඔවුන්ට සිදුවේ.

15. රාජකාරිය පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජයේ නාම ලැයිස්තුවෙහි තනි වශයෙන් හෝ වෙනත් පුද්ගලයකුගේ නමද සමග ඒකාබද්ධ වශයෙන් හෝ නම සඳහන් වන කවර පුද්ගලයෙකු ගෙන් හෝ ටෙන්ඩර් භාර නොගන්නා අතර, එවැන්නකු සමග කවර කොන්ත්‍රාත්තුවකට හෝ ඇතුළත්ද නොවනු ලැබේ.

16. කොන්ත්‍රාත්කරු වෙත භාරදිය යුතු සියලුම නිවේදන, පෞද්ගලික වශයෙන් ඔහුටම භාර දුනහොත් හෝ ගිවිසුමෙහිදී ඇති ලිපිනයට තැපැලෙන් යැවුවහොත් හෝ ඔහුට භාර දුන්නා සේ සලකනු ලැබේ. කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අවසරය ලියවිල්ලකින් නොලබා කොන්ත්‍රාත්තුව හෝ එහි කොටසක් හෝ අතුරු බද්දට දීමද කොන්ත්‍රාත්කරු විසින් නොකළ යුතුය.

කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අවසරය ලියවිල්ලකින් නොලබා කොන්ත්‍රාත්තුව හෝ එහි කොටසක් හෝ අතුරු බද්දට දීමද කොන්ත්‍රාත් කරු විසින් නොකළ යුතු ය.

16. කොන්ත්‍රාත් කරු විසින් සේවයේ යොදනු ලබන ඕනෑම පුද්ගලයෙකු, එසේ සේවයෙහි යෙදීම ප්‍රඥගෝචර නොවේයැ යි සැලකෙන විට ඔහු සේවයෙහි යෙදවීම නවතාලීමේ බලය රජය සතුවේ.

17. දෙපාර්තමේන්තුවේ යහපත තකා කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් නියමිත වැඩයෙන් කොටසක් අඩු කරනු ලැබූ අවස්ථාවක් වුවහොත්, කොන්ත්‍රාත්තුවේ නියත වශයෙන් දක්වා ඇති ප්‍රමාණය නොකරනු ලැබීම හේතුකොට ගෙන රජයෙන් කිසිම අලාභයක් ඉල්ලා සිටීමට ද කොන්ත්‍රාත් කරුට අයිතියක් නැත්තේ ය.

18. අසතුටුදායක වැඩ කටයුතු නිසා හෝ කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමයන් ඉටු නොකිරීම නිසා හෝ කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතිය ද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය. එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත් කරුගේ වියදමින් එම වැඩය සම්පූර්ණ කර ගැනීම සඳහා වෙනත් විධිවිධාන යොදා ගැනීමේ අයිතියද කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු වන්නේ ය.

19. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩරයක හෝ ටෙන්ඩර්වල කොටස් පමණක් පිළිගැනීමේද අයිතිය රජය සතු වේ.

20. තවදුරටත් අවශ්‍ය තොරතුරු පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) ගෙන් ලබාගත හැකිය. මේ පිළිබඳව විමසීම් එවිය යුත්තේ ඔහුගේ කාර්යාලයීය පදවි නාමයට විනා පෞද්ගලික නාමයට නොවේ.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් මස 5 වැනි දින,
පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

11–597—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කුණ්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානයට අහල් හාගයේ කොට්ට ලෑලි සැපයීම හා ගෙන ගොස් භාර දීම

මෙහි පහත දක්වා ඇති ප්‍රමාණවලින් අහල් ½ යේ කොට්ට ලෑලි හතරැස් අඩි 25,000 ක් සැපයීම හා කුණ්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානයට ගෙන ගොස් භාර දීම සඳහා සීල් තබා එවන ටෙන්ඩර් පත් කොළඹ 1, ඩියුක් විදියේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965.12.14 දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ.

පළල අහල් 4 රේ ලෑලි හතරැස් අඩි 5,000 ⎫
පළල අහල් 6 යේ ලෑලි හතරැස් අඩි 10,000 ⎬ 25,000 යි
පළල අහල් 8 වේ ලෑලි හතරැස් අඩි 10,000 ⎭

2. මසකට පළමු වර්ගයෙන් හතරැස් අඩි 1,000 ක්ද, දෙවැනි වර්ගයෙන් හතරැස් අඩි 2,000 ක් හා 3වැනි වර්ගයෙන් හතරැස් අඩි 2,000 ක්ද වශයෙන් මාස 5 ක් ඇතුළත දී සම්පූර්ණ ප්‍රමාණය සපයා අවසන් කළ යුතුය.

3. සපයන කොට්ට ලෑලි නියම ප්‍රමාණයේ හොඳ තත්ත්වයේ ඒවා විය යුතුය. ඉල්ලා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල නොවන තත්ත්වය අසතුටුදයක ලෙස ඇති ලෑලි භාර ගනු නො ලැබේ.

4. කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ පරිපාලන නිලධාරි තැනගෙන් ටෙන්ඩර් පෝරම ලබා ගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර එවිය යුතුය. සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලන හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, තැ. පෙ. 536, කොළඹ 1" යන ලිපිනය ලියා එහි මුදුන් කෙළවරේ "කුණ්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානයට කොට්ට ලෑලි සැපයීම" යන්නද ලියා එවිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින 1965.12.14 දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කෙරේ. එම නිකුත් කිරීම කරනුයේ එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ හොත් පමණි. මුදල් තැන්පත් කිරීම, පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක නැතහොත් කොළඹ මහා භාණ්ඩාගාරයේ කළ යුතුයි. මහා භාණ්ඩාගාරයේ තැන්පත් කරන්නේ නම් මහා භාණ්ඩාගාර පොදු තැන්පත් ගිනුම (කෘෂිකර්ම අධ්‍යක්ෂ) ටෙන්ඩර් තැන්පත් යන ගිනුමටම තැන්පත් කළ යුතුයි. පොරොන්දු පත්‍රයකට අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පිළිගත් බව දන්වා දින (10) දහයක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවා හැර ඔහුගේ නම ආණ්ඩුවේ කොන්ත්‍රාත් පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් වීමටද ඉඩ තිබේ.

6. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් නො එවුවහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ඒවා අතින්ම භාර දිය යුතුය. ටෙන්ඩර් බහා ලන කවරයේ වම් කෙළවරේ "කුණ්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානයට කොට්ට ලෑලි සැපයීම" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි. ලියාපදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ඒවා විවෘත කරන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දන්වීමක් නො ලැබුනහොත් ඔහු ටෙන්ඩර් මණ්ඩලයෙන් වහාම විමසිය යුතුය.

7. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් විවෘත කරන අවස්ථාවේදී, පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීමට නියමිතව ඇති අවසාන දින එකී වේලාවට කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

8. නියමිත පෝරමයෙහි ලියා නැති නැතහොත් නියමිත කොන්දේසි සම්පූර්ණයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නො ලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒවා සම්බන්ධයෙන් යම් කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවන්ගේ කෙටි අත්සන ද තැබිය යුතුය.

9. ටෙන්ඩර්කරුවන්ගේ නම, ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

10. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. පොරොන්දු පත්‍රය අත්සන් කරනු ලැබූ පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඒ බව දන්වා දින 10 ක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට නොහැකි වුවහොත් ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයටද ඇතුළත් වෙනවා ඇත.

11. ගිවිසුම් පත්‍රයට හෝ පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

12. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුය.

13. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනු ලැබේ.

14. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. ලාංකිකයා යන වචනයේ අර්ථය පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා හෝ ලාංකික පුරවැසියකුවූ තැනැත්තෙක්ය යන්නය.

15. 1934 රේ 19 වැනි අංකය දරන කම්කරුවන්ගේ වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

16. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියළුම දන්වීම් ඔහුගේ අතට භාර දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට යැවුවොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සළකනු ලැබේ.

17. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙක් කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙක් වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

18. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට කනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වන වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධ වන කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැදෙනු නො ලැබේ.

19. වැඩි විස්තර, කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලනය හා සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂතැනගෙන් හෝ කුණ්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානයේ කළමනාකාර තැනගෙන් ලබා ගත හැකිය.

ඩී. සී. එල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1965.11.10 දින,
කොළඹ 1, තැ. පෙ. 536,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේදීය.

11–596—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අංක 14,547 හා 65.10.29 වෙනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ දැන්වීම සම්බන්ධයෙනි. පේරාදෙණියේ ගන්නොරුවේ මධ්‍යම පර්යේෂණස්ථානයේ ගරාජයන් 30 ක් තැනීම පිළිබඳ ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1965.12.13 වෙනි දින පස්වරු 2.30 තෙක් දීර්ඝ කළ බව මෙයින් දන්වමි. 1965.12.10 වෙනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්‍ෂ.

1965 නොවැම්බර් 11 වැනි දා,
පේරාදෙණියේ දී ය.

11-702—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42, ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පරන්තන්හි නි. මි. යෝ. ක්‍ර. ගබඩාවට සහ ගොඩෝර ගබඩාවට 1966 වර්ෂය තුළදී කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1965 දෙසැම්බර් 10 වෙනි සිකුරාදා අ. භා. 2.30 තෙක් භාර ගනු ලැබේ.

දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝටන් පෙදෙස කාර්යාලයෙහි ගණකාධිකාරී තැනට රුපියල් 50 ක තැන්පතු මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටෙන්ඩර් අංශයට ඉදිරිපත් කොට ලබාගන්නා ලද ටෙන්ඩර්පත් අනු පිටපතද සහිතව පුරවා එවිය යුතුය. 1965 දෙසැම්බර් 10 වෙනි සිකුරාද දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ යාපනයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගේ කාර්යාලයෙන් විමසා දැන ගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් 19 දින දීය.
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
ඇඩින්බරෝ චන්ද්‍රවංකය,
තැ. පෙ. 537, කොළඹ 7.

11-698—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

පුලියන්කුලම ඇව ගබඩාවේ ඇති කඳන් 80 ක් හල්මිල්ල, රූනෙ, මිල්ල, සූරියමැර, කිරිය, පළු හා මඩන් ඝණ අඩි 946.3 ක් පමණ හා 2 වැනි පන්තියේ ඉරාපු ලී ඝණ අඩි 67.6 මිලදී ගැනීම සඳහා 65.11.27 වැනි දින උදය 10 දක්වා සීල් ටෙන්ඩර්පත්‍ර බාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන්ට ටැන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර ඉහත සඳහන් දැව පරීක්ෂා කර බැලිය හැක.

3. ටැන්ඩර් සීල් කර, "පුලියන්කුලම ගබඩාවේ කඳන් මිලදී ගැනීම සඳහාය" කියා ලියුම් කවරයේ වම් පැත්තේ සඳහන් කළ යුතුය.

4. ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. ටැන්ඩර් කිරීමට බලාපොරොත්තු වන අය ටැන්ඩරයේ පැහැදිලිව අකුරෙන් සහ ඉලක්කමෙන් සඳහන්කර වවුනියාවේ දි. ව. නි. ගේ නමට රු. 10ක ටැන්ඩර් ඇප මුදලක් එම ටැන්ඩරයට ඈමිනිය යුතුය.

5. ටැන්ඩර් දැන්වීම පහත අත්සන් කරන මගෙන් හෝ පුලියන් කුලම ගබඩාවේ ස. ග. පා. ගෙන් ලබාගත හැක.

ඩී. දිසානායක,
දිශා භාර කැලෑ නිලධාරි, වවුනියාව.

දිශා කැලෑ කාර්යාලය,
වවුනියාව, 65.11.5 දාය.

11-694—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ බොරැල්ලේ මැගසින් පාරේ පිහිටි බේකරියට එළවළු ගිතෙල් දළ වශයෙන් මසකට රාත්තල් 350 ක් බැගින් 1966.1.1 සිට 1966.12.31 දක්වා සැපයීම පිණිස ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ අලෙවි කිරීමේ කොමසාරිස් විසින් 1965 දෙසැම්බර් මස 10 වැනි සිකුරාද අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට හෝ රු. 50 ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1965 දෙසැම්බර් මස 10 වැනි සිකුරාද දවල් 12 වන තෙක්, අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැකි පෝරමවල ටෙන්ඩර් ලියා අනුපිටපත් ද සමග එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගත හැකිය.

එස්. නඩරාජා,
වැඩ බලන අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් මස 12 වැනි දිනදී,
කොළඹ 1,
අංක 62, චැතැම් වීදියේ,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

11-652—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් මස 8 වැනි බදාදා දවල් 10 වන තෙක්, කොළඹ 5, පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

1. (අ) කුරුණෑගල බස්හලෙහි කොන්ක්‍රීට්වලින් බස් ආවරණ තැනීම.
   (ආ) බස් නැවතුම් පලෙහි බස් කපා පොළොව සමතලා කිරීම.
   (ඇ) බස් නැවතුම් පොළ අංගනය කොන්ක්‍රීට් දමා සකස් කිරීම.
2. යාපනේ කොන්ඩාවිල් ඩිපෝවේ දිශා කාර්යාලය තැනීම.
3. මහරගම ඉංජිනේරු වැඩපොළ ඉදිරිපිට අංගනවලට කොන්ක්‍රීට් දැමීම.
4. රත්නපුර ඩිපෝවේ ඉංජිනේරු වැඩපොලේ ඇතුල් අංගනය කොන්ක්‍රීට් දමා සකස් කිරීම.

වැඩ අංක 1 සම්බන්ධයෙන් රු. 1,00,000 ක් හෝ එයට අධික මුදලක් මිල වන වැඩ සඳහාද, වැඩ අංක 2 සහ 3 සම්බන්ධයෙන් රු. 50,000 ක් හෝ එයට අධික මිලක් වැය වන වැඩ සඳහාද, වැඩ අංක 4 සම්බන්ධයෙන් රු. 40,000 ක් හෝ එයට අධික මිලක් වැය වන වැඩ සඳහාද, රජයේ හෝ ලංකා ගමනාගමන මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් යථෝක්ත වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සෝ වෙති.

ඔවුන්ගේ සහතික පත්‍ර ආදිය ඉංජිනේරුතැන අනුමත කළහොත් ටෙන්ඩර්කරුවන් විසින්, වැඩ අංක 1 සම්බන්ධයෙන් රු. 300 ක් ද වැඩ අංක 2 සම්බන්ධයෙන් රු. 200ක් ද වැඩ අංක 3 සහ 4 සම්බන්ධයෙන් රු. 100 බැගින් ද, යනුවෙන් ටෙන්ඩර් ඇප මුදලක් කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයෙහි පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත තැන්පත් කළ යුතුයි. එසේ තැන්පත් කළ මුදල වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය වේරහැර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගේ කාර්යාලයට ඉදිරිපත් කළ විට එකී නිලධාරි තැන විසින් 1965 දෙසැම්බර් මස 4 වැනි සෙනසුරාදා දවල් 12 දක්වා අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයෙන් සපයන ටෙන්ඩර් පෝර්මවල ලියා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා පමණක් පිළිගනු ලැබේ.

ප්‍රධාන සිවිල් ඉංජිනේරුතැන.
ලංකා ගමනාගමන මණ්ඩලය.

1965 නොවැම්බර් මස 9 වෙනි දින,
වේරහැර, බොරලැස්ගමුවේ දීය.

11-566—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

සඳහන් 2 වන අංකයේ සඳහන් මුදලට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට 1965 දෙසැම්බර් මස 9 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඕඩර්, තැපැල් ඕඩර් ඈදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසැල් ගොඩනැගිලි අංශයෙන්, හෝ කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් හෝ ලබාගත යුතු ය. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතු ය.

3. පූර්වෝක්ත 2 වැනි අංකයේ නියමිත වශයෙන් දක්වෙන මුදල් ප්‍රමාණය සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී තිබේ නම්, මෙකී වැඩ සඳහා අනුමත කළ සමිතිවලට ද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැකි වේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන බැවින් ඔවුන්ගේ ටෙන්ඩරය එකී පෝර්මයේ ලියා ඉල්ලුම් කළ යුතු ය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. යථෝක්ත 2 අංකයේ සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට විශේෂ ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගත හැකි වූද, ඔවුන්ගේ කාර්යාලයේ දී සැලැස්ම බලාගත හැකි වූද, කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතැනගෙන් පූර්වෝක්ත 2 හා 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් 2 කින් යුක්තව ලියාපදිංචි කළ තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ප්‍රදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ලියාපදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකමැති වන්නේ නම්, ටෙන්ඩර් කරුගේ සේවා විස්තර, නම, ලිපිනය කවරයේ දැක්වෙන සේ සිල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝජිතයකු විසින් හෝ, කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර තැන වෙත පුද්ගලිකව ඉදිරිපත් කොට ඔහුගෙන් ටෙන්ඩරය භාරදුන් බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

5. 1965 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා පෙරවරු 10.30 ට කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේ දී ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන නිලධාරී තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසන් වන දින සිට සති 6 ක කාලපරිච්ඡේදයක් දක්වා තමන් ඉල්ලුම් කළ මිල ගණනට වැඩය භාර ගැනීමට ටෙන්ඩර් කරුවන් කැමති විය යුතු ය.

7. තවදුරටත් අවශ්‍ය විස්තර, ටෙන්ඩර් ලියකියවිලි, පරීක්ෂා කිරීම පිණිස කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකි ය.

8. උළු සෙවිලි කළයුතු ගොඩනැගිලිවලට මෙරට උළු යෙදිය යුතු ය. මෙම උළුවල තරාතිරම නියත වශයෙන් දැනගැනීමට පරීක්ෂණයක් අවශ්‍ය නම්, එය පැවැත්වීම සපයන්නාගේ වියදමින් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනය මගින් කරගත හැකි වේ.

ඩබ්ලිව්. ඩී. සී. මහතන්තිල,
වයඹ ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් මස 13 වැනි දින,
කුරුණෑගල, අධ්‍යාපන කාර්යාලයේ දී ය.

21-711/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## ජාතික ලුණු සංස්ථාව

### භාණ්ඩ විකිණීම

පහත සඳහන් භාණ්ඩ විකිණීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1965 නොවැම්බර් මස 25 වැනි ගුරු දින පස්වරු 3 තෙක්, ජාතික ලුණු සංස්ථාවේ, හම්බන්තොට මහ ලේවායේ, සාමාන්‍යාධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. | පෝර්බෑන්ක් හොණ්ඩර 20 බිම තරාදි | 2 |
| 2. | ඇවරිත් හොණ්ඩර 20 බිම් තරාදි | 1 |
| 3. | ඇවරි හොණ්ඩර 20 බිම් තරාදි | 1 |
| 4. | ලොරි පට්ටම් (ටිම්) | 6 |
| 5. | ලොරි පුට්ටම් වලලු | 6 |
| 6. | ලොරි දුණු සැට් | 2 |

11-734—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

මහනුවර බන්ධනාගාර නිලධාරීන්ගේ නිවාස වශයෙන් 1—බී ශ්‍රේණියේ තට්ටු නිවාස ධාරකයක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, විරාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1965 දෙසැම්බර් මස 15 වෙනි බදාදා පෙරවරු 11.00 වනතෙක් භාරගනු ලැබේ.

2. මහනුවර ර. වැ. දෙපාර්තමේන්තුවේ නිර්මාණ/විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වෂී 1965 දෙසැම්බර් මස 3 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 65,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

ඒ. සී. වික්‍රමසිංහ,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදිය, 1965 නොවැම්බර් 15.

11-766/1—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ නව විදුලි සංදේශ ගොඩනැගිල්ල සඳහා ලෝහ ජනේල සපයා ගෙනැවිත් බාරදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, විරාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ, තැපැල් හා විදුලි හා සංදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1965 දෙසැම්බර් මස 15 වෙනි බදාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී ලබාගැනීමට පුළුවන.

3. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු රු. 100 මුදල වෙනුවෙන් කොළඹ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ කොළඹින් පිටත නම් ඕනෑම කච්චේරියකින් හෝ නිකුත් කරන ලද කුවිතාන්සිය 1965 දෙසැම්බර් මස 3 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු වෙත ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලැබූවිට ඔහු විසින් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

ටී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදිය, 1965 නොවැම්බර් මස 15 දින.

11-766/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

6. ලාංකික සම්බන්ධතා ඇති රටවල් වූ ඇල්බේනියාව, ඔස්ත්‍රියාව, බල්ගේරියාව, චීන මහාජන සමූහාණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහාජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගෝස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, ආදී රටවලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියා පදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් තිබී බව ඔප්පු කළ යුතු වෙයි.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වන ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් හා සැපයීම් අංශය) ලබා ගත හැක. මෙම කාර්යාලයෙන් ලබා ගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිතා කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර්කරුවන්ට පමණි.

8. මෙහි පළමුවන ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2ක්වත් විවෘතව තැබිය යුතුය.

9. කෙලින් ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමැති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයන් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියළුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකාණ්ඩුවේ නියෝජිතයන්ගෙන් ලබා ගත හැකි බව දැන්විය යුතුය. මහා බ්‍රිතාන්‍යය, ඇමරිකා එක්සත් ජන පදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහාජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හංගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාවේ බොම්බාය සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නි හි සිටින ලංකා වෙළෙඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයන්ගෙන්.

10. ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වෙනි ඡේදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ, රජයේ බෙහෙත් ගබඩා අධිකාරිට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධ විස්තර එම ඡේදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුය. ටෙන්ඩර් පත් සම්පේක්ෂ කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වන ඡේදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී සෑම ටෙන්ඩර් කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ සහ නම මිළ ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුණ ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට යම්කිසි ටෙන්ඩර් කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙළ කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

12. ටෙන්ඩර්කරුවන් විසින් රුපියලේ වටිනාකම හා විදේශීය විනිමය වටිනාකම වෙන වෙනම තමන්ගේ මිළ ඉදිරිපත් කිරීම්වල සෑම විෂය අංකයක් වෙනුවෙන් ම සඳහන් කළ යුතු වන්නේය.

එස්. බාලක්‍රිෂ්නන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1965 නොවැම්බර් 2 වනද,

කොළඹ 10,
ඩීන්ස් පාරේ අංක 355 දරණ තැන පිහිටි,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) කාර්යාලයේදී ය.

## අදාල උප ලේඛනය

| විෂය අංකය | විස්තරය | ඇස්තමේන්තු කළ අවශ්‍යතා | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 1. | ලික්විඩ් එච්. සී. එන්. සිලිංඩර්ස්–එක් සිලිංඩරයක ඉතා උසස් වාණිජ පිරිසිදුතාවය. 96% දක්වා ඇති ලික්විඩ් එච්. සී. එන්. (හයිඩ්‍රොසයනික් ඇසිඩ්) රාත්තල් 75ක් අඩංගුය. | 133 යි ... | සුදුසු ඇහිරීම් ක්‍රමයක |

බාරදීමේ ක්‍රමය .—

මෙම සැපයීමේ සම්පූර්ණ තොගය සමාන තොග 3කින් කොළඹ, දුම් ගැසීමේ මධ්‍යස්ථානයට ගෙනැවිත් බාර දිය යුතුය. පළමුවෙනි තොගය ඇනවුම් කළ දින සිට මාස 3ක් ඇතුළතදීද, ඉතිරි තොග 2, ඉන්පසු එන මාස 3කට වරක් ද සැපයිය යුතුය.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, සඳහන් කළ මිළ ගණන, සහ කොළඹට ගෙනඒමේ ගාස්තුව හා ඇහිරීම් හා අනිකුත් සියළුම ගාස්තු ඇතුළුව මිල භාණ්ඩ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් සඳහන් කළ යුතුය.

වායුවේ මිළ සඳහන් කරන විට සිලිංඩරයන්ගේ කුලියද සඳහන් කළ යුතු වෙයි. මෙම සිලිංඩර් කොළඹ අනුවාසක මධ්‍යස්ථානය කරා ගෙනැවිත් බාරදීම හා ඒවා ආපසු යැවීමේ වියහියදම් සපයන්නන් විසින් ම දැරීම යුතු වෙයි.

ප්‍රදානය කරනු ලබන සිලිංඩර්, දැනට වරායේ ඇති ඇමරිකන් සයනාමයිඩ් සමාගමේ අනුවාසක උපකරණ සමග පාවිච්චියට සුදුසු පරිදි වූ ඒවා විය යුතු යි.

11-761—65. 11. 19 වැනි දින අ ක 14,561 දරන ගැසට් පත්‍රය

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### අයිතිකරු නොකියන ලද මිනී සහ අජීව උපත් වැළලීම හා අස්කිරීම

කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය 1966 ජනවාරි 1 වැනිද සිට 1966 සැප්තැම්බර් 30 වැනිදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති අයිතිවාසිකම් නොකියන ලද මිනී සහ අජීව උපත් අස් කිරීම හා වැළලීම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතන වලින් කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මගින් සපයන ලද පෝර්ම වල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර් කරුවන්ගේ නම සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන් පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් සෞඛ්‍ය සේවා අධිකාරි හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රය ලබාගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිති-වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළයුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර්පත්‍ර නිකුත් කෙරෙන අවසාන දිනට පෙරදින දහවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපෑලෙන් පෝර්ම ඉල්ලුම් කරන අයට මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල් වේලා ඇතිව එවීමෙන් අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර්පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු සෞඛ්‍ය සේවා අධිකාරි වෙත දැන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝර්ම එම කාර්යාල වලින් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළයුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම ඉහත සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරි තැනගේ නමට එවිය යුතුයි. සීල්තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා යන්න සඳහන් කළයුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළයුතුයි. ටෙන්ඩර් පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලේකම් ගණකාධිකාරි වරයාට පුද්ගලිකව භාරදීමෙන් හෝ එය ලැබුණ බවට කුවිතාන්සියක්ද ලබාගත හැක. ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන්ද එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10 ට පසු තැපෑලෙන් එවන හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. එක් ආයතනයක අස්කළ යුතු හා වැළලිය යුතු මිනී හා අජීව උපත් ප්‍රමාණය දළ වශයෙන් ආයතන භාර වෛද්‍ය නිලධාරීතුමාගෙන් හෝ මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර්පත්‍රයේ පිටු පස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාරගැනීමටද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටස් ප්‍රතික්ෂේප කිරීමේ බලයද රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම්පතක් එවීමෙන් දනගත හැකිය.

එල්. ආර්. ජේ. වොට්සන්,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කොළඹ.

උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | |
| අයිතිවාසිකම් නොකියන ලද මෘත ශරීර අස්කිරීම හා වැළලීම දකුණු කොළඹ රෝහල, නළුම්බෝවිල | 100 0 | .. 300 0 | ... 1965.12.10 පෙ.ව. 10.0 |

11—582—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—කළුතර කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1966 ජනවාරි 1 වනදා සිට 1966 දෙසැම්බර් 31 වන දා දක්වා (දින දෙකම ඇතුළත් ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමු වන තීරුවේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කළුතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරුවේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නො තබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලි ව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල මඩකලපුව, කොළඹ, යාපනය, ගාල්ල, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය, සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත සඳහන් පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරුව බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී, කළුතර" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරුවේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරණ ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුව හොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කර ගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුව ය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරනවිට ටෙන්ඩර්යේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළෙඳ පොළේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් කරන ලද මිළ ගණන් මෙහි පළමු වන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරුවෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බදු බාහිරාදිය කබා ගැනීම.**— [illegible] ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි [illegible] කොන්ත්‍රාත්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම [illegible] ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් පැළැඳිය යුතුය.

13. **සහල් සැපයීම.**—රෝගීන්ට සහ සේවකයන්ට ආහාර [illegible] පදනම මත ඒ ඒ ආයතන භාර නිලධාරීන් මගින් නියෝජ්‍ය ආහාර කොමසාරිස් විසින් සහල් ලබා ගැනීමට අවශ්‍ය පත් නිකුත් කරනු ඇත.

ඊ. නාගේන්ද්‍රන්,
[illegible] සේවා අධිකාරී, කළුතර.

1965 නොවැම්බර් 12 වැනි දින,
[illegible]

## උපලේඛනය

| (1) | (2) | (3) | (4) | (5) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
| | | | | සේවකයින් සඳහා | | | | රෝගීන් සඳහා | | | |
| ආයතනයේ නම | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු |
| 1. අළුත්ගම ගැමි රෝහල ... | 100... | 400 | | 78... | 78... | 78... | 314... | 600... | 630... | 593... | 2,362 |
| 2. අළුත්ගම වීදියේ ගැමි රෝහල ... | 100... | 400 | | 222... | 54... | 371... | 880... | 560... | 370... | 693... | 2,187 |
| 3. බෙරුවල මාතෘ නිවාසය ... | 100... | 400 | 65.12.6 | 130... | 130... | 131... | 513... | 80... | 77... | 86... | 332 |
| 4. බුලත්සිංහල මාතෘ නිවාසය ... | 100... | 300 | පෙ. ව. 10 | 236... | 232... | 236... | 947... | 487... | 519... | 500... | 1,956 |
| 5. වාද්දුව මාතෘ නිවාසය ... | 100... | 300 | | 181... | 173... | 176... | 703... | 20... | 14... | 18... | 60 |
| 6. පනාපිටිය මාතෘ නිවාසය ... | 100... | 200 | | 100... | 100... | 101... | 401... | 10... | 5... | 7... | 47 |

11–643—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (යාපනය කොට්ඨාශය)

### කිරි නොමැතිව පියු ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1966 ජනවාරි 1 වෙනිද සිට 1966 සැප්තැම්බර් 30 වෙනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පියු ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනයේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වෙවා එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය, සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම් ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී ටෙන්ඩර් පත්‍ර අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම නම වත්කම මට හෝ නමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම් ඉහත සඳහන් දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීමට හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මෙ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් පත්‍ර එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙලවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිළිව සඳහන් කළයුතුවාක් මෙන් ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හිදී පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහිදී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් කරුවිසින් පෝරමයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි " සී " උපලේඛන යට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් නම් ඒවා පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සළසා දෙනු නො ලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි — ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ශිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

ඈස්. රාසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
යාපනය, 1965.11.11.

## උපලේඛනය

| (1) ආයතනය | (2) තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට — මාළු | සේවකයන්ට — හරක් මස් | සේවකයන්ට — කරවල | සේවකයන්ට — එළවළු | රෝගීන්ට — මාළු | රෝගීන්ට — හරක් මස් | රෝගීන්ට — කරවල | රෝගීන්ට — එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | | | | | | | | | |
| 1. කෝපායි ග්‍රා. රෝ. සහ මා. නි. | ... 100... | 400 | 1965.12.10 වනද පෙරවරු 10 ට | 600... | — ... | 600... | 900... | 1,900... | — ... | 1,900... | 3,000 |
| 2. පුනාකරි ග්‍රා. රෝ. සහ මා. නි. | ... 100... | 600 | | 400... | — ... | 400... | 1,900... | 300... | — ... | 400... | 1,600 |

11-470/1—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බඩුබාහිරාදිය ප්‍රවාහණය සඳහා ටෙන්ඩර් කැඳවීම—1965/67—යාපනේ කොට්ඨාශය

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයන් හා සේවය.—1966.1.1 දින සිට 1967.9.30 දක්වා කාලය තුළ පහත සඳහන් ආයතනවල සිට දුම්රිය ස්ථාන වලට ද දුම්රිය ස්ථානවල සිට ආයතනවලට ද බඩුබාහිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික වෙළඳ ආයතනයන්ගෙන් හෝ සමුපකාර සංගම්වලින් හෝ ටෙන්ඩර් යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල්.—(අ) යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරි නමින් ලඟම පිහිටි කච්චේරියේ රු. 100 ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ලබාගත යුතුය. වෙහි පහත සඳහන් එක් එක් කාණ්ඩය සඳහා වෙන වෙන ම ටෙන්ඩර් තැන්පත් මුදල් බැඳිය යුතුය.

(ආ) අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට ද තැන්පත් මුදලක් නො තබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර.—පහත සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරින්ගේ කවුරුන් විසින් හෝ 1965 දෙසැම්බර් 7 වැනිද දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ :—

| | | | | |
|---|---|---|---|---|
| අනුරාධපුරය | කොළඹ | කළුතර | කුරුණෑගල | පුත්තලම් |
| මඩකලපුව | ගාල්ල | මහනුවර | මාතලේ | බදුල්ල |
| යාපනය | කෑගල්ල | මාතර | වවුනියාව | රත්නපුරය |

(අ) මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් එවනතුරු හෝ ඉදිරිපත් කරන තුරු හෝ,

(ආ) ටෙන්ඩරය අපේක්ෂිත අයදුම්කරු විසින් වත්කම පිළිබඳව අත්සන් කරන ලද ප්‍රකාශනයක් එවනතුරු හෝ ඉදිරිපත් කරනතුරු හෝ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

4. වත්කම් පිළිබඳ තොරතුරු.—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත් දරන හෝ නැති හෝ හැම ටෙන්ඩර්කරුවකු විසින් ම වත්කම පිළිබඳව තොරතුරු සැපයිය යුතුය. මේ සඳහා අදාල ආකෘති පත්‍ර කලින් ලබාගත යුතුය.

5. බඩුබාහිරාදියේ තක්සේරු කරන ලද ප්‍රමාණයන්.—අපේක්ෂිත ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම පිණිස එක් අවුරුද්දකට ප්‍රවාහනය කළ බඩුබාහිරාදියෙහි ආසන්නතම මෙම ප්‍රමාණයන් මෙම කාර්යාලයෙහි තබා ඇත. එක් බර ප්‍රමාණයක් යටතේ ගිය අවුරුද්දේ බඩුබාහිරාදිය ප්‍රවාහනය කර නැති අවස්ථාවන් සඳහා පසුගිය අවුරුදුවල දී ප්‍රවාහනය කල බඩුබාහිරාදියෙහි සංඛ්‍යා ලේඛන ඇතුලත් කර ඇත.

6. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ අයුරු.—ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් පිළියෙල කර යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙතට ලිපිනය ලියන ලද එක කවරයක බහා මුද්‍රා තබා යැවිය යුතුය. කුමන සේවයක් සඳහා ද යන්න කවරයේ වම් කෙළවරේ උඩ කොණෙහින් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය කවරයේ වම් පැත්තේ පහළ කොනෙහින් සඳහන් කළ යුතු වේ. පහත සඳහන් එක් එක් කාණ්ඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය හැකි අතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයෙහි ලේකම්/ගණකාධිකාරි වෙත ලේඛණ ගත තැපැලෙන් යැවීමට හෝ පුද්ගලිකව භාරදීමට හෝ පුළුවන. එවිට ලේකම්/ගණකාධිකාරි ටෙන්ඩර් පත්‍ර ලැබුණ බවට කුවිතාන්සි නිකුත් කරනු ඇත.

7. ප්‍රවාහණය සඳහා ගාස්තු ප්‍රමාණය.—පහත සඳහන් අයුරු තුන් පිළිවෙලට ම ගාස්තු ප්‍රමාණ සඳහන් කළ යුතු වේ :—

(අ) එක් එක් ගමනක් සඳහා සම්මත ගාස්තු ප්‍රමාණය ;

(ආ) ප්‍රවාහණය කළ පෙට්ටි ගණන හෝ ප්‍රවාහණය කළ දුර ප්‍රමාණය හෝ ගැන නොසලකා හොණ්ඩරයකට සම්මත ගාස්තු ප්‍රමාණය;

(ඇ) බර ප්‍රමාණය අනුව ඇති එක් එක් අංශ සඳහා ගාස්තු ප්‍රමාණය.

ටෙන්ඩර් තෝරා ගැනීම කරනු ලබන්නේ වඩාත්ම රජයට හිතකර කරුණු පදනම් කර ය.

8. ප්‍රවාහණය කරන අයුරු.—සේවය සඳහා යොද ගන්නා වාහනය ටෙන්ඩර්කරු සතු එකක් විය යුතු අතර, එම වාහනයේ ලියා පදිංචි කළ අංකයත්, එහි බර ප්‍රමාණයත්, එයට ගෙන යා හැකි බර ප්‍රමාණයත්, එය කුමන වර්ගයේ වාහනයක් ද යන්නත් අනාවරණය කළ යුතු වේ. මෙම තොරතුරු අනාවරණය කිරීමට නොහැකි වුවහොත් ටෙන්ඩරය අවලංගු වේ. වාහනය ලියාපදිංචි කළ සහතික පත්‍රය ඉදිරිපත් නොකළොත් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු නොලැබේ.

9. ටෙන්ඩර් භාර ගැනීමේ අවසානය.—1965 දෙසැම්බර් 10 වැනිද පෙරවරු 10 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වේ.

10. ටෙන්ඩර් විවෘත කිරීම.—ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ට ඇසෙන සේ ටෙන්ඩර්කරුවන්ගේ නම්ද, ගාස්තු ප්‍රමාණයන් ද කියවනු ලැබේ. ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට උවමනා වුවහොත් යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරීන් සමග හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකු සමග හෝ කලින් යොද ගෙන ඉදිරිපත් කර ඇති ඕනෑම ටෙන්ඩරයක අනුපිටපතක් පරීක්ෂාකර බැලීමට ඉඩදෙනු ලැබේ.

11. ටෙන්ඩර් සඳහා අතිකුත් කොන්දේසි.—ටෙන්ඩර් පත්‍රයෙහි දෙවැනි පිටුවෙහි මේවා සඳහන් වන බැවින් පරීක්ෂාකාරීව කියවා බලා අදල අවස්ථාවන්හි දී ඒ අනුව ක්‍රියාකළ යුතු වේ.

12. ටෙන්ඩර් භාරගැනීම.— (අ) සම්මත ආකෘති පත්‍රයෙහි පිළියෙළ කර නොමැති හෝ,

(ආ) සියළුම ටෙන්ඩර් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකල හෝ කිසිම ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

කරුණු නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩරයක් මුළුමනින් ම හෝ එහි කොටසක් හෝ භාර ගැනීමේත්, සඳහන් කල කාලයට අඩු කාලයක් සඳහා හෝ භාර ගැනීමේත් අයිතිවාසිකම රජය වෙතම තබාගනු ලැබේ.

## පළමුවන ඡෙදයෙහි සඳහන් ආයතනවල දුම්රිය ස්ථානවල හා බාහිර බඩු ගබඩාවල නාමාවලිය

| ළඟම ඇති දුම්රිය ස්ථානය හෝ බාහිර බඩු ගබඩාව | ආයතනයේ නම | දු.ස. හෝ බා.බ.ග. සිට දුර | අනුමත කර ඇති දින ගණන |
|---|---|---|---|
| | "බී" කාණ්ඩය | | |
| වාවුනියාව / වාවාකච්චේරිය | වාවාකච්චේරිය ර. රෝ. | 1 | 1 |
| | වාවාකච්චේරිය සෞ. කා. | ½ | 1 |
| | පූනාකාරි ප. ඒ. | 14½ | 1 |
| | වෙරාවිල් මැ. ඕ. සහ මා. නි. | 36 | 3 |
| නාවත්කුලි, යාපනය | කයිතඩි මැ. ඕ. | ½ | 1 |
| | අනලතිව් මැ. සහ මා. නි. | 23 | 3 |
| | ඩෙල්ෆ්ට් ර. රෝ. | 33 | 3 |
| | කරෙයිනගර් මැ. ඕ. සහ මා. නි. | 13 | 1 |
| | කරෙයියූර් මැ. ඕ. සහ මා. නි. | 2 | 1 |
| | කයිට්ස් ර. රෝ. | 14 | 1 |
| | කයිට්ස් සෞ. කා. | 14 | 1½ |
| | යාපනේ රජයේ මහාරෝහල | 1½ | 1 |
| | යාපනේ සෞ. කා. | 1 | 1 |
| | යාපනේ සෞ. සේ. අධි කාර්යාලය | 1½ | 1 |
| | යාපනේ බන්ධනාගාර රෝහල | 2 | 1 |
| | යාපනේ බෝවෙන රෝග රෝහල | 3 | 1 |
| | යාපනේ වරාය සෞඛ්‍ය කාර්යාලය | 2 | 1 |
| | මන්ඩෙයිතිව් මැ. ඕ. සහ මා. නි. | 7½ | 1 |
| | නයිනාතිව් මැ. ඕ. සහ මා. නි. | 26 | 3 |
| | පුංගුඩුතිව් ර. රෝ. | 20 | 2 |
| | වඩුකොඩ්ඩෙයි ග්‍රා. රෝ. | 8½ | 1 |
| | වේලනේ මැ. ඕ. සහ මා. නි. | 12 | 1½ |
| කොකුවිල් | කොකුවිල් මැ. ඕ. | ½ | 1 |
| | මානිපායි සෞ. කා. | 4 | 1 |
| | මානිපායි මැ. ඕ. සහ මා. නි. | 3 | 1 |

ඇස්. රාසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
යාපනය, 1965.11.11.

11—470/2—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කෑගල්ල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.—වර්ෂ 1966 ජනවාරි 1 වෙනිද සිට 1966 දෙසැම්බර් 31 වෙනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුල මේ සමග ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. එකස් හෝ එවා, එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි කල අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී අවසාන දිනට පළමු දිනයේ දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වවුනියාව යන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොමැවන වෙනත් ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කල බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. වත්කමේ විස්තර.—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී ටෙන්ඩර් පත්‍ර අවසාන දිනට සැලකිය යුතු කාලයකට පුරම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට යනුවු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝරම ඉහත සඳහන් දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කම විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 5 වෙනි තීරය බලන්න.

5. ටෙන්ඩර් පත්‍ර එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි කෑගල්ල '' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙලවරෙහි එහි කවර සේවාවක් සඳහාදැයි පැහැදිළිව සඳහන් කල යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙලවරෙහි ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කල යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දමීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. ටෙන්ඩර් පත්‍ර බාර බන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වෙනි තීරයේ සඳහන් දිනයන්හිදී පෙරවරු 10 ට ටෙන්ඩර් පත් බාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී කියනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක ඔවුන් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ "බී" උප ලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවෙන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ හෙයින් ටෙන්ඩර් පෝරමයෙහි "බී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කල යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට පවත්නා පොළෝ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් නම් ඒවා පාලක මිළ ගණන අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුවන්ගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් කුමානම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයේ සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කල යුතුය.

11. **ඩබුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ තිබෙන ගිවිසුම් කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

ඒ. පී. එච්. තාබෝ,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි තැන.

1965.11.11 වැනි දින, කෑගල්ලේ සෞඛ්‍ය සේවා.
අධිකාරි කාර්යාලයේදිය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට: මාළු | මස් | කරවල | එළවළු | නොගෙවන රෝගීන්ට: මාළු | මස් | කරවල | එළවළු | කිරි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කදුපිටපත්තු මාතෘ නිවාසය | ... 100... | 300 | 1965 දෙසැම්බර් මස 14 වෙනි දින පෙ.ව. 10 ට | 170... | 170... | 170... | 680... | 300... | 300... | 300... | 1,270... | |
| අල්ගම මාතෘ නිවාසය | ... 100... | 300 | | 153... | 130... | 160... | 650... | 70... | 70... | 70... | 280 | |
| බුලත්කොහුපිටිය මාතෘ නිවාසය | ... 100... | 400 | | — ... | 120... | 260... | 500... | — ... | 400... | 850... | 1,670 | |
| හිඳුරලාකන්ද මාතෘ නිවාසය | ... 100... | 300 | | — ... | 150... | 310... | 620... | — ... | 50... | 90... | 200 | |
| හෙට්ටිමුල්ල මාතෘ නිවාසය | ... 100... | 400 | | 30... | 30... | 120... | 240... | 320... | 300... | 1,070... | 2,450 | |
| මකුද්දල මාතෘ නිවාසය | ... 100... | 300 | | 170... | 160... | 330... | 510... | 220... | 200... | 430... | 640 | |
| වැලිගමුව මාතෘ නිවාසය | ... 100... | 300 | | 100... | 90... | 100... | 390... | 820... | 80... | 90... | 330 | |

11—475—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1966 ජනවාරි 1 වැනිද සිට 1965 දෙසැම්බර් 31 වනද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර්පත් කොළඹ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී, සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වෙවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා නැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර්පෝරම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙණෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි, කොළඹ" කියා එවිය යුතුයි. සිල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළයුතුවාත් මෙන්ම එහි වම්පස කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම්තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසාන වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩර්යක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ "බී" උප ලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උප ලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැළකිය යුතුය.

ඇල්. ආර්. ජේ. වොටසන්,
කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
නො. 83, කින්සි පාර,
කොළඹ 8. 1965.11.9.

උපලේඛනය

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය, වේලාව | ආහාර ප්‍රමාණය දල වශයෙන් — සේවකයින්ට | | | | ආහාර ප්‍රමාණය දල වශයෙන් — නොගෙවන රෝගීන්ට | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මාළු | මස් | කරවල | එලවලු | මාළු | මස් | කරවල | එලවලු |
| 1. මිතිරගල මා. නි. | 100 | 800 | 1965.12.10 වන දින පෙරවරු 10ට | 50 | 50 | 50 | 50 | 50 | 50 | 50 | 250 |
| 2. පිළියන්දල මා. නි. | 100 | 800 | එම | 100 | 100 | 100 | 350 | 50 | 50 | 50 | 150 |
| 3. තලාහේන මා. නි. | 100 | 800 | එම | 50 | 50 | 50 | 150 | 50 | 50 | 50 | 50 |
| 4. වෙයන්ගොඩ මා. නි. | 100 | 400 | එම | 100 | 100 | 100 | 400 | 100 | 100 | 100 | 450 |

11-580—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## සහකාර ආහාර පාලක කාර්යාලයේ (කොළඹ නාගරික ප්‍රදේශයේ) ආපන ශාලාව

1966 ජනවාරි මස 1 වැනි දින සිට 1966 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ කාලය තුළ කොළඹ, බාන්ස් පෙදෙසේ අංක 17 දරන ස්ථානයෙහි සහකාර ආහාර පාලක කාර්යාලයේ කාර්ය මණ්ඩලයට හා සේවකයින්ට ආහාර පාන ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් 1965 දෙසැම්බර් මස 6 වෙනි සඳුදා දවල් 12.00 දක්වා භාරගනු ලැබේ.

2. 1965 දෙසැම්බර් මස 4 වෙනි දින (සෙනසුරාදා) දවල් 1.00 දක්වා, ටෙන්ඩර් පෝර්ම සහකාර ආහාර පාලක කාර්යාලයේ දී ලබාගත හැක. මෙම ටෙන්ඩර් පෝර්ම පිටපත් 2 ක් ලෙස පිළියෙලකොට එක කවරයක බහා සීල් තබා, "සහකාර ආහාර පාලක තැන, අංක 17, බාන්ස් පෙදෙස, කොළඹ 7" යන ලිපිනයට එවිය යුතුය. කවරයේ වම් කෙළවරේ "ආපනශාලා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පෝරමයේ සඳහන් ආකාරයට ආහාර පානවල මිල ගණන් සටහන් ප්‍රකාශනයක් ටෙන්ඩරයේ දිය යුතුයි.

4. ටෙන්ඩරය පිළිගත් බව දන්වා එවා දවස් 3 ක් ඇතුළත තෝරාගත් ටෙන්ඩර්කරු ඇප වශයෙන් රුපියල් දෙසිය පණහක් (250) සහකාර ආහාර පාලක කාර්යාලයේ දී තැන්පත් කළ යුතුය. මෙම මුදල කොන්ත්‍රාත්තුව හරියාකාර ඉටු කිරීම සඳහා ඇප මුදලක් වශයෙන් තබා ගනු ලැබේ. කොන්ත්‍රාත්තු අනුව යටකී කාලය තුළ තෝරාගත් ටෙන්ඩර්කරු සතුටුදායක ලෙස කොන්ත්‍රාත්තුව කරගෙන යායුතුය. එසේ නොකළහොත් ටෙන්ඩර්කරු විසින් අලාභය ගෙවීමට සිදුවේ. යථෝක්ත කාලය තුළ කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කළහොත් එම කාලය අවසානයේ දී ඇප මුදල ආපසු දෙනු ලැබේ.

5. ආහාර පිසීම සඳහා ආපනශාලාවට අමතර වශයෙන් තව කාමරයක් දෙනු ලැබේ. කෑම පිසීම සඳහා ආපන ශාලාකරු විසින් මෙහි ලිප් පිහිට යොදා ගත යුතුයි.

6. ආපන ශාලාවට අයිති ගොඩනැගිල්ල හා යටකී කාමරය සඳහා කුලිය වශයෙන් මසකට රුපියල් 25 (විසිපහක්) ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුයි. ආපන ශාලාවක් සඳහා, නාගරික සභාවට ගෙවිය යුතු බලපත්‍ර කුලියද ඔහු විසින් ගෙවිය යුතුයි.

7. ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීමේ බලය සහකාර ආහාර පාලක තැන තමාටම වෙන්කොට තබාගනු ලැබේ.

8. ටෙන්ඩරය පිළිගත් බව දන්වා අවශ්‍ය ඇප මුදල තැන්පත් කළ වහාම කොන්ත්‍රාත්කරු සහකාර ආහාර පාලක තැන සමග කොන්ත්‍රාත්තුවට බැඳිය යුතුයි. එම බැඳුම්කරයට අවශ්‍ය මුද්දර ගාස්තු ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුයි.

9. 1965. 12. 6 වෙනි දින දවල් 1.00ට සහකාර ආහාර පාලකගේ කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ඇත. කැමති නම් ටෙන්ඩර් කරුවන්ට, මේ අවස්ථාවේදී සිටිය හැක.

එච්. ඩී. පී. බෝදිදස,
සහකාර ආහාර පාලක,
(කොළඹ නාගරිකය).

1965 නොවැම්බර් 10 වෙනි දින,
සහකාර ආහාර පාලක කාර්යාලය,
17, බාන්ස් පෙදෙස,
කොළඹ 7.

11-575—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

කොළඹ මහරෝහලේ නො. 36 දරණ වාට්ටුවට අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහිවූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 දෙසැම්බර් මස 15 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ.

2. ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ/විධායක ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම් කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1965 දෙසැම්බර් මස 3 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් අ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 13,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

එස්. සෙල්වදුරෙයි,
අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි).

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේ දිය, 1965.11.12.

11-708—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහනුවර සෞඛ්‍ය සේවා ප්‍රදේශය

**1965-66 වර්ෂය තුළ එළකිරි, ටෝන් කිරි සහ පිටි කිරි සහ සීනි ප්‍රවාහන සඳහා පිළිගත් ටෙන්ඩර් පිළිබඳ විස්තර**

| සෞඛ්‍ය කොට්ඨාශය | එළ කිරි, ටෝන් කිරි පිටි කිරි සහ සීනි යන වග | ලැබුන ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පයින්ට් එකකට/ හොණ්ඩරයකට | ගාස්තු ප්‍රමාණය රු. ශ. |
|---|---|---|---|---|---|
| 1. තලාතුඔය ... | ... එළකිරි ... | 2 | ... බී. එල්. එස්. ද සිල්වා මයා. ... | පයින්ට් එක | 0 07 9/10 |
| 2. ගම්පොල ... | ... එම ... | 2 | ... එම ... ... | පයින්ට් එක | 0 09 7/8 |
| 3. කටුගස්තොට... | ... එම ... | 3 | ... සී. ඒ. ඩී. ගුණතිලක ... ... | පයින්ට් එක | 0 04 |
| 4. වත්තේගම ... | ... එම ... | 2 | ... රොසලින් පෙරේරා මිය.... ... | පයින්ට් එකක් | 0 03 7/10 |
| 5. ගලගෙදර ... | ... එම ... | 1 | ... ඩබ්ලිව්. සයිමන් මයා. ... ... | පයින්ට් එකක් | 0 14 |
| 6. මැදමහනුවර ... | ... ටෝන් කිරි ... | 2 | ... ඇම්. ඇස්. හුසේන් මයා. ... ... | පයින්ට් එකක් | 0 07 |
| 7. උතුරට ... | ... පිටි කිරි සහ සීනි ... | 1 | ... එච්. ඩී. චාර්ලස් අප්පුහාමි මයා. ... | හොණ්ඩරයක් | 12 0 |
| 8. නුවරඑළිය ... | ... පිටි කිරි සහ සීනි ... | 1 | ... ඒ. ආරුමුගම් මයා. ... ... | හොණ්ඩරයක් | 13 0 |

මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි.

1965.11.9 වැනි දින,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය.

11-593—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

**ටෙන්ඩර් ප්‍රතිඵල—කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම, 1965–66**

| ආයතනය | ලැබුණු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ගණන් — සේවකයන්ට — මාළු රු.ශ. | මස් රු.ශ. | කරවල රු.ශ. | එළවළු රු.ශ. | නොපගවන රෝගීන්ට — මාළු රු.ශ. | මස් රු.ශ. | කරවල රු.ශ. | එළවළු රු.ශ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අළුත්නුවර රෝහල ... | 4 | ... එස්. මාරිමුත්තු මහතා ... | 1·50... | 1·40... | 1·25... | 1·00... | 1·45... | 1·45... | 1·25... | 0 95 |
| බණ්ඩාරවෙල රෝහල ... | 4 | ... ඊ. ඒ. එම්. ප්‍රනාන්දු මහතා ... | 1·60... | 1·60... | 1·50... | 1·00... | 1·60... | 1·60... | 1·50... | 1·00 |
| කොස්ලන්ද රෝහල ... | 5 | ... ඊ. ඒ. එම්. ප්‍රනාන්දු මහතා ... | 1·50... | 1·40... | 1·30... | 1·00... | 1·50... | 1·40... | 1·30... | 1·00 |
| මඩුල්සීම රෝහල ... | 5 | ... එස්. මාරිමුත්තු මහතා ... | 1·65... | 1·50... | 1·30... | 1·00... | 1·60... | 1·40... | 1·25... | 0 95 |
| මහඔය රෝහල ... | 4 | ... එස්. මාරිමුත්තු මහතා ... | 1·80... | 1·75... | 1·50... | 1·15... | 1·75... | 1·60... | 1·35... | 1·10 |
| මැදගම රෝහල ... | 4 | ... එස්. මාරිමුත්තු මහතා ... | 1·65... | 1·50... | 1·25... | 1·00... | 1·50... | 1·40... | 1·35... | 0 88 |
| සියඹලාණ්ඩුව රෝහල ... | 2 | ... එස්. මාරිමුත්තු මහතා ... | 2·00... | 1·75... | 1·50... | 1·20... | 1·75... | 1·60... | 1·40... | 1·15 |

එච්. කණගරත්නම්,
බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1965 නොවැම්බර් මස 12 දින,
බදුල්ලේ, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දිය.

11-633—65.11.16 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

### සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම—රාජකීය ලංකා නාවික හමුදාව

1965 දෙසැම්බර් මස 15 වැනි බදාදා පූ. භා. 9 ට ත්‍රිකුණාමලයේ පිහිටි රාජකීය ලංකා නාවික ආයතනයේදී, සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

විකුණනු ලබන විෂයයන් එදින පූ. භා. 8 සිට පරීක්ෂා කළ හැකිය.

වෙන්දේසිය අවසානයේදී සම්පූර්ණ මුදල ගෙවීම අවශ්‍ය වේ. මිලදී ගත් විෂයයන් 1965.12.17 දින සවස 4 ට පෙර ඉවත් කර ගතයුතු වේ.

ආර්. කදිර්ගාමර්,
නාවික හමුදාපති.

11-728—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

### අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව

#### පාවිච්චි කරණ ලද ඡායාරූප උපකරණ වෙන්දේසියක්

කැමරා, ත්‍රිපාදපීඨ, කැමරා කාච, විකාශනටැන්කි ආදී නොයෙක් පාවිච්චිකරණ ලද ඡායාරූප උපකරණ 1965 නොවැම්බර් මස 27 වෙනි දින උදේ 10ට කොළඹ වොරින්ටන් චතුරශ්‍රයේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්මික අංශයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරණු ලැබේ.

2. 1965 නොවැම්බර් මස 22 වෙනි දින සිට ඉහත සඳහන් කරණ ලද භාණ්ඩ කාර්යාල වේලාවේදී බැලිය හැක.

3. වෙන්දේසියේදී ලබාගන්නා ලද භාණ්ඩ සඳහා අයවිය යුතු සම්පූර්ණ මුදල් වෙන්දේසියෙන් පසු ගෙවා එදිනම අපරභාග 4 ට පෙර එම භාණ්ඩ රැගෙන යා යුතුයි.

ඇස්. වෛයි. චන්ද්‍රසෝම,
සහකාර පොලිස් අධිකාරි වෙනුවට,
අ. ප. දෙ. කාර්මික අංශය.

කාර්මික අංශය,
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව,
වොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.

11-684—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

### රේගු වෙන්දේසිය

පහත සඳහන් බඩු 1965 නොවැම්බර් මස 25 වෙනි බ්‍රහස්පතින්දා පෙ. ව. 9.30 ට ගමන් බඩු කායාලයේ පයනින්ත වේදිකාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ. 1965.11.23 වෙනි අඟහරුවාදා සහ 24 වෙනි බදාදා ප. ව. 1.30 සිට ප. ව. 3.45 දක්වා මැණික් ගල් පරීක්ෂා කළ හැක. විස්තර සඳහන් ලැයිස්තු ගමන් බඩු කායාලයේ භාණ්ඩ නිලධාරි තැනගෙන් ලබාගත හැක.

වටිනා මැණික් ගල්
අර්ධ වටිනා මැණික් ගල්
ස්වර්ණාභරණ කොටස් පහයි
මෝටර් කාර් අමතර කොටස්
රෙදි විවීමේ මැෂින් අමතර කොටස්
සාරිස් දහයයි
පුවුපු විලවුන්
රෙදි පිළි යනාදිය.

ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1965. 11. 13 දින,
කොළඹ, රේගුහලේදිය,
බී.ඔ. 148—13/65.

11-650—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

### රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් බඩු 1965 දෙසැම්බර මස 3 දින පෙරවරු 10 ට කොළඹ, රේගුවේ, කොච්චිකඩේ ගුදමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසි බඩු 1965 නොවැම්බර 29 දින සිට ඉහත සඳහන් ස්ථානයේ දී, පරීක්ෂාකර බැලීමට පිළිවන. වැඩි විස්තර අවශ්‍ය නම් රේගුවේ ප්‍රධාන ලිපිකරු මහතා හමුවන්න.

සී. සී. බී. හෙපන්ස්ටෝල්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒ ඞ්/විකිණීම්/65/17,
1965 නොවැම්බර මස 12 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. සේප්පුවක්
2. විෂ රහිත බෙහෙත් පිප්ප 18 ක්
3. තේක්ක ලී කැබැලි (ඉරූ) මිටි 6 ක්
4. තේක්ක ලී කැබැලි (ඉරූ) මිටි 25 ක්
5. සිගරට් කාට්න් 1 ක්
6. ද්‍රව විශේෂයක්, පෙට්ටි 1ක්
7. ඉස්කුරුප්පු ඇන පෙට්ටි 1 ක්
8. කිරි ආහාර කාට්න් 1 ක්
9. "ඇන්ටිරොමයිසින්" පෙට්ටි 1 ක්
10. "ඇන්ටිරොමයිසින්" පෙට්ටි 1 ක්
11. පෙලගත් කිරි පිටි මළු 1 ක්
12. සබ්බායි දෑල් 2 ක්
13. ස්ටේරෝ බෝඩ් මිටි 6 ක්
14. ටෙරමයිසින් සිරප් පෙට්ටි 1 ක්
15. බණිජ තෙල් කාට්න් [illegible] ක්
16. මෝටර් පෙට්ටි 2 ක්
17. කිරි ආහාර මළු 1 ක්
18. ගල්ලෑලි මිටි 15 ක්
19. බෙලෙක් පියන් පෙට්ටි 7 ක්
20. පුළුන් මිටි 3 ක්
21. පරිප්පු මළු 699 ක්
22. ප්‍රචාරක ලිපි ද්‍රව්‍ය පෙට්ටි 1 ක්
23. පරණ යකඩ තොගයක්
24. තේක්ක ලී (ඉරූ) කැබැලි කුඩා තොගයක්.

11-699—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

### කැලෑ දෙපාර්තමේන්තුවේ දැව දඬු වෙන්දේසියේ විකිණීමයි

කැලෑ දෙපාර්තමේන්තුවේ දකුණු දිසාභාර වන නිලධාරි විසින් ඇල්පිටිය අඩවියේ තිබෙන ඉරාපු දැව, කඳන්, කණු සහ පරාල තොග 39 ක් 1965 නොවැම්බර් මස 26 වැනි දින පෙරවරු 9.30 ට ඇල්පිටියේ අඩවි වන නිලධාරි කාර්යාලයයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන්නන්ට ඒ ඒ ස්ථානයන් වෙත ගොස් දැව පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

2. වෙන්දේසියේදී දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ යුතුය. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය අයට දකුණු දිසාභාර වන නිලධාරි තුමාගේ කායාලයයෙන් හෝ ඇල්පිටියේ අඩවි වන නිලධාරිගෙන් හෝ ඇමිණ ලබාගත හැක.

ඩී. ඩබ්ලිව්. සෙනවිරත්න,
දකුණු දිසා වන නිලධාරි.

දිසා වන කායාලය,
1965 නොවැම්බර් මස 2 දින,
ගාල්ලේදිය.

11-697—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## දන්වීමයි

මගේ කොට්ඨාශයේ ආරෝග්‍යශාලාවල නේවාසිකව සිට, මිය-ගිය හා රෝහල් වලින් පිටවූ රෝගීන්ගේ හිමිකම් නොපෑ භාණ්ඩවල හා මුදල්වල ලැයිස්තුවක් මෙහි පහත සඳහන් වේ.

2. මෙම ගැසට් නිවේදනයෙන් සති තුනක් ඇතුලත මෙම මුදල් හා භාණ්ඩ හිමි අය විසින් ඉල්ලා නොසිටිය හොත් එසේ හිමිකම් නොපා ඇති භාණ්ඩ 1965.12.15 වෙනි දින පෙරවරු 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ තබා එයින් ලැබෙන මුදලුත් හිමිකම් නොපෑ මුදලුත් සමග ආදායමට බැර කරනු ලැබේ.

3. භාණ්ඩ ඒ ඒ ආයතනවලදී වෙන්දේසියේ තබනු ලැබේ. වෙන්දේසිය අවසන්වූ විගසම ඉල්ලුම්කරුවන් විසින් සම්පූර්ණ මුදල් ගෙවා භාණ්ඩ රැගෙන යා යුතුය.

4. වෙන්දේසිය අවලංගු කිරීම හෝ විලම්බනය කිරීම හෝ ඉල්ලීමක් පැහැර හැරීමේ බලය සෞ. සේ. අධ්‍යක්ෂ තුමාටම හිමි වී ඇත.

5. අමතර විස්තර ආයතන භාර නිලධාරීන් ගෙන් ලබාගත හැක.

එච්. ඒ. ජේසුදසන්,
මහනුවර වැඩබලන සෞඛ්‍ය සේවා අධිකාරී.

1965 නොවැම්බර් මස 9 වෙනි දින,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී ය.

| | රෝහල | රෝගියාගේ නම | රෝහලට ඇතුලත් වූ දිනය | පිටව් ගිය දින | මියගිය දිනය | හිමිකම නොපා ඇති මුදල රු. ශ. | හිමිකම නොපෑ බඩු |
|---|---|---|---|---|---|---|---|
| 1. | මහනුවර රෝහල | නම නොදනී | නොදනී | — | — | — | රතු පැහැති තැල්ලක් |
| 2. | ,, | ගුණවර්ධන | — | — | — | — | කරාබු එකයි |
| 3. | ,, | ආර්. ඇම්. විමලසේන | — | — | — | — | යතුරු දෙනිය, බොත්තම 5යි |
| 4. | ,, | පෙරහැර තුවාලකරුවන් | — | — | — | — | නිල්පැහැති බොත්තම 4යි, රිදීපාට මුදු තුනයි, සුදුපාට මුදු 2යි, සුර එකයි |
| 5. | ,, | සින්නපිල්ලේ | — | — | — | — | කහපාට කරාබු 1යි, මුදු 1යි, සුදුපාට චේන් 1යි |
| 6. | ,, | නම නොදනී | — | — | — | — | වලලු 2යි, සුදුපාට මුදු 3යි |
| 7. | දෙල්තොට රෝහල | තුප්පන් | 1954 | — | — | — | වලලු 1යි, චේන් 1යි, මුදු 1යි |
| 8. | ,, | සෙල්වන් | 1954 | — | — | — | රිදී වලලු 2යි, තමයන් වලලු 6යි, සෙලොලයිට් වලලු 4යි, වීදුරු වලලු 4යි, මුදු 1යි |
| 9. | ,, | ඒබ්‍රහම් | 1954 | — | — | — | මුදු 1යි |
| 10. | ,, | නාගමමා | 1955 | — | — | — | වලලු ජෝඩු 1යි, රිදී මුදු 1යි, යකඩ ලොකට් 1යි |
| 11. | ,, | අබේසුන්දරහාමි | 1956 | — | — | — | මුදු 2යි, හැට්ට කටු 11යි |
| 12. | ,, | මු කම්මාල් | 1956 | — | — | — | තාලි 1යි, බබලු 2යි, චේන් 1යි, කටු 1යි |
| 13. | දෙලොස්බාගේ රෝහල | ලියනා | 1956. 6.16 | — | 1959.6.25 | — | රිදී හවඩි 1යි |
| 14. | ,, | නම නොදනී | 1964. 8.20 | — | 1964. 8.25 | — | රිදී වලලු 2යි, නාසයේ පළඳින ආභරණ 1යි, ඇලුමිනියන් කෝප්ප 2යි, ඇලුමිනියන් පිගන් 1යි, ඇලුමිනියන් හැඳි 1යි, ඇලුමිනියන් පියන් 1යි |
| 15. | ගම්පල රෝහල | කේ. ඩිංගිරඅම්මා | 1951. 1. 3 | — | 1954. 1. 4 | — | වලලු 2යි |
| 16. | ,, | පොඩිනෝනා | 1952. 9.26 | 1952.10. 1 | — | — | වලලු 2යි, අරුන්ගල් 1යි, මුදු 1යි |
| 17. | ,, | රංමැණිකා | 1953.10.17 | — | 1953.10.19 | — | අරුන්ගල් 2යි |
| 18. | ,, | අයියම්මා | 1956. 5.21 | — | 1956. 5.26 | 70 0 | — |
| 19. | ,, | නන්දුවා | 1957. 1.18 | — | 1957. 1.22 | 2 3 | — |
| 20. | ,, | බී. ඇම්. පුංචිබණ්ඩා | 1957. 2. 4 | — | 1957. 2. 9 | — | හවඩි 1යි |
| 21. | ,, | රාමයියා | 1959. 5.23 | — | 1959. 5.28 | 20 0 | — |
| 22. | ,, | ඇස්. බී. කැටකුඹුර | 1959.10. 1 | 1959.10. 3 | — | 5 0 | — |
| 23. | ,, | ආර්. පෙරුමාල් | 1959.11. 6 | — | 1959.11.15 | 4 25 | — |
| 24. | ,, | මංගොනෝනා | 1962. 2.27 | — | 1962. 3.25 | 4 11 | — |
| 25. | ,, | කේ. ඩිංගිර බණ්ඩා | 1963. 1.15 | — | 1963. 1.15 | 5 0 | — |
| 26. | ,, | ඇස්. වී. පිල්ලේ | 1962. 9.22 | — | 1963. 9. 3 | 275 31 | අත් ඔරලෝසු 1යි, චේට්ටි 2යි, කෝට් 2යි, කලිසම් 2යි, කමිස 1යි, බැනියන් 1යි, සූට්කේස් 1යි |
| 27. | ,, | අබ්දුල්කාදර් | 1963. 7. 7 | — | 1963. 7.23 | 2 60 | — |
| 28. | ,, | කේ. වී. උණ්ඩියා | 1963. 9.24 | 1963. 9.30 | — | 1 30 | — |
| 29. | ,, | මැණිකා | 1962. 8.18 | — | 1962. 8.18 | 1 28 | ... |
| 30. | ,, | අන්දිරිස් | 1964.11.12 | — | 1964.11.12 | 30 0 | — |
| 31. | මඩුල්කැලේ රෝහල | ලෙව්විම් | 1954. 4.16 | — | 1954. 4.16 | — | මුදු 2යි, අරුංගල් 1යි |
| 32. | ,, | පොඩිනෝනා | 1955. 2.17 | — | 1955. 2.19 | — | අරුංගල් 2යි, වලලු 1යි |
| 33. | ,, | ඉරුලයි | 1959. 1.21 | — | 1959. 1.23 | — | මුදු 1යි, මුතුනි 3යි, තාලි 1යි |
| 34. | ,, | ක්‍රිෂ්ණම් | 1960. 7.11 | — | 1960. 7.13 | 9 0 | පවුන්ටන් පෑන් 1යි, යතුරු 2යි, දුනු පිහියා 1යි, මුදල් දමන (හිස්) පසුම්බි 1යි, කොළපාට කොඩි 1යි, සුදු රෙදි 1යි, සුදු කමිස 1යි, කළු පටි 1යි, පොත් 1යි, අත්බෑග් 1යි, යතුරු ඉබ්බො 1යි |
| 35. | ,, | සෙල්ලම්මා | 1961. 1.18 | — | 1961. 1.18 | — | රිදී පාට චේන් 1යි |
| 36. | මස්කෙලිය රෝහල | යාචක ස්ත්‍රියක් | 1955. 9.30 | — | 1955.10. 7 | — | කහ පාට සුරයක්, පිත්තල මුදුවක්, පබළු ඇට හයක් |
| 37. | මුල්හල්කැලේ රෝහල | නම නොදනී | — | — | — | — | රන්පැහැති අරුංගල් 2යි, වලලු 2යි |
| 38. | නුවරඑලිය රෝහල | කුමාරන් | 1959. 4.23 | 1959. 4.28 | — | — | වලලු ජෝඩු 1යි, කරාබු කුට්ටම 2යි, කැලිතුනෝ කොඩිකාලි 1යි |

| | රෝහල | රෝගියාගේ නම | රෝහලට ඇතුළුවූ දිනය | පිටව්ගිය දිනය | මියගිය දිනය | හිමිකට නොපා ඇති මුදල රු. ශ. | හිමිකම නොපෑ බඩු |
|---|---|---|---|---|---|---|---|
| 39. | නුවරඑළිය රෝහල | විරන්දශසගම් | 1960. 2.26 | — | 1960. 3. 2 | — | වලලු ජෝඩු 1යි, රිදී මුදු 3යි, සොංගර 2යි, කරවලලු 1යි, කරාබු 2යි, නාගමාල 1යි |
| 40. | ,, | මුතායි | 1960. 3. 5 | — | 1960. 3.12 | 4 03 | — |
| 41. | ,, | ඇප්. ආර්. ඒ. පීරිස් | 1960. 4 12 | — | 1960. 4.20 | — | මුදු 1යි, මුන්ත්පෙට්ටි 1යි |
| 42. | නාවලපිටිය රෝහල | අපියම්මා | 1960. 5.30 | — | 1950. 6. 3 | — | ඇටමාල 4යි |
| 43. | ,, | රංමැණිකෙ | 1950. 6. 9 | — | 1950. 7. 2 | — | වලළු 3යි, කරාබු 2යි |
| 44. | ,, | පලනිනම්මා | 1950. 7.27 | — | 1950. 8. 2 | — | වලළු 2යි, ඇටමාල 2යි, පටි 1යි, මුතු පොට 1යි |
| 45. | ,, | ඩිංගිරිඅම්මා | 1950. 8. 4 | — | 1960. 8.23 | — | වලළු 2යි |
| 46. | ,, | ආරුමුගම් | 1950. 8.29 | — | 1950. 9.18 | — | කරාබු 1යි, පැන පිහිය 1යි |
| 47. | ,, | පුංචිරාල | 1950.10. 5 | — | 1950.10. 6 | 5 0 | — |
| 48. | ,, | ලෙච්චිමි | 1950.10 23 | — | 1950.10.26 | — | වලළු 2යි, ඇටමාල 3යි |
| 49. | ,, | බෙබිනෝනා | 1950.11.23 | — | 1950.12.26 | — | කරාබු 2යි |
| 50. | ,, | සංගරලිංගම් | 1951. 2. 1 | — | 1951. 2. 3 | — | කරාබු 1යි |
| 51. | ,, | මුදියන්සේ | 1951. 1.24 | — | 1961. 2. 8 | — | ඇටමාල 1යි |
| 52. | ,, | කේ. පී. මැණිකේ | 1951. 5. 7 | — | 1951. 5. 7 | — | හවඩි 4යි |
| 53. | ,, | පුංචිමහත්මයා | 1951. 5.23 | — | 1951. 5.27 | — | ඇටමාල 2යි, මුදලු 1යි, හවඩි 1යි |
| 54. | ,, | සොපිනෝනා | 1951. 5.23 | — | 1951. 6. 1 | — | ඇටමාල 2යි |
| 55. | ,, | සින්නතම්බි | 1951. 6.15 | — | 1951. 6.15 | 3 52 | මුදු 1යි |
| 56. | ,, | සින්නම්මා | 1951. 8.22 | — | 1951. 8.27 | — | වලලු 2යි |
| 57. | ,, | රිනෙස් උම්මා | — | — | — | — | ඇටමාල 2යි, මුදු 1යි |
| 58. | ,, | පාජ්පි | 1951.12.11 | — | 1951.12.12 | — | වලලු 6යි, ඇටමාල 1යි, මුතුන්නි 1යි |
| 59. | ,, | මංගොනෝනා | 1951.12. 4 | — | 1951.12.13 | 5 0 | කරාබු 1යි, ඇටමාල 1යි |
| 60. | ,, | වරුනායි | 1952. 2. 3 | — | 1952. 2.25 | — | මුතුන්නි 1යි |
| 61. | ,, | වරදයි | 1952. 7.10 | — | 1952. 7.22 | — | කරාබු 4යි |
| 62. | ,, | සූසෙයි අම්මා | 1952. 7.31 | — | 1952. 8.17 | — | වලලු 7යි, හවඩි 1යි, මුතුන්නි 2යි |
| 63. | ,, | පොඩිසිඤ්ඤෝ | 1952.10.20 | — | 1952.11.27 | — | හවඩි 1යි |
| 64. | ,, | පලනියායි | 1952.10.29 | — | 1952.12.13 | — | වලලු 3යි, මුදු 2යි, මුතුන්නි 1යි, ඇටමාල 1යි |
| 65. | ,, | නාගම්මා | 1952.12. 2 | — | 1952.12.16 | — | මුදු 2යි, මුතුන්නි 1යි |
| 66. | ,, | පයිබායන් | 1952.10.23 | — | 1952.10.23 | 1 45 | — |
| 67. | ,, | අංගොඅප්පු | 1953. 1. 4 | — | 1953. 1. 5 | — | බොත්තම 3යි, තලා 2යි |
| 68. | ,, | දෙවපියන් | 1953. 7.11 | — | 1953. 7.12 | — | යතුරු 1යි, තලා 1යි |
| 69. | ,, | මුනියම්මා | 1953.11.16 | — | 1953.11.21 | — | වලලු 1යි, ඇටමාල 1යි, මුතුන්නි 1යි |
| 70. | ,, | කන්දසාමි | — | — | — | — | මුදු 2යි |
| 71. | ,, | සත්තියාගු | 1963.11.30 | — | 1963.12. 3 | — | මුදු 2යි |
| 72. | ,, | පුංචිරත්නා | 1954. 1. 3 | — | 1954. 1. 4 | — | ඇටමාල 2යි, මුදු 2යි |
| 73. | ,, | ඩොලිනෝනා | 1953.12.29 | — | 1954.1. 12 | — | මුදු 1යි |
| 74. | ,, | කාලිඅම්මා | 1954. 2. 1 | — | 1954. 2.[illegible] | — | මුදු 2යි |
| 75. | ,, | වෙල්ලිඅම්මා | 1954. 5.24 | — | 1954. 5.25 | — | වලලු 2යි, මුදු 1යි |
| 76. | ,, | ඩිංගිරිඅම්මා | 1954. 6.21 | — | 1954. 7.16 | — | කරාබු 2යි, මුදු 4යි |
| 77. | ,, | සින්නඅම්මා | 1954. 8. 3 | — | 1954. 8.10 | — | වලලු 1යි, මුදු 2යි |
| 78. | ,, | රංගම්මා | 1954. 8. 4 | — | 1954. 8.15 | — | වලලු 9යි, මුතුනි 2යි, සුර 1යි |
| 79. | ,, | පොඩිමැනිකෙ | 1954. 9.17 | — | 1954. 9.24 | — | වලලු 3යි, මුතුනි 2යි |
| 80. | ,, | රංගනි | 1954.11. 6 | — | 1954.11. 9 | — | වලලු 23, කරාබු 2යි |
| 81. | ,, | තංගම්මා | 1954.11. 7 | — | 1954.12.11 | — | වලලු 2යි, ඇටමාල 1යි |
| 82. | ,, | අපිරනම් | 1954.12.20 | — | 1954.12.24 | — | වලලු 2යි |
| 83. | ,, | ඩිංගිරිහාමි | 1955. 3. 4 | — | 1955. 3.15 | — | වලලු 2යි |
| 84. | ,, | අරුණාසලම් | 1955. 3.14 | — | 1955. 4. 1 | — | මුදු 1යි |
| 85. | ,, | ආරායි | 1955. 3.26 | — | 1955. 4. 2 | — | සුර 1යි |
| 86. | ,, | එම්. කදිරායි | 1955. 5.26 | | 1955. 5.28 | — | වලලු 7යි, මුදු 5යි, සුර 1යි, මුතුන්නි 1යි |
| 87. | ,, | පාපා | 1955. 8. 8 | — | 1955. 8. 9 | — | වලලු 2යි |
| 88. | ,, | නම නොදනී | 1955.12. 9 | — | 1955.12.10 | 14 81 | — |
| 89. | ,, | රංමැණිකේ | 1956. 1. 1 | — | 1956. 1. 2 | — | සුර 1යි |
| 90. | ,, | සිරිදරා | 1955.12.28 | — | 1956. 1.23 | 4 87 | — |
| 91. | ,, | මුදියන්සේ | 1956. 2.10 | — | 1956. 2.18 | — | චේන් 1යි, බොත්තම 3යි |
| 92. | ,, | ඩිංගිරිරත්නා | 1956. 2 23 | — | 1956. 2.23 | — | වලලු 2යි, කරාබු 1යි |
| 93. | ,, | නම නොදනී | 1956. 3. 4 | — | 1956. 3. 6 | 1 76 | — |
| 94. | ,, | ලේලායි | 1956. 6. 4 | — | 1956. 6. 9 | — | මුතුන්නි 1යි |
| 95. | ,, | කිරිබණ්ඩා | 1956. 6. 8 | — | 1956. 6.12 | — | ඇටමාල 2යි, මුදු 1යි |
| 96. | ,, | අයියම්මා | 1956. 6.17 | — | 1956. 6.24 | 0 20 | මුදු 4යි |
| 97. | ,, | කරුප්පන් | 1956. 6.26 | — | 1956. 7. 5 | — | වලලු 2යි, කරාබු 1යි, පාදයේ ලන මුදු 8යි |
| 98. | ,, | සෝමාවතී | 1956.7.3 | — | 1956.12.13 | — | රිදී චේන් පොටයි |
| 99. | ,, | පොඩිමැනිකෙ | 1956.11.27 | — | 1956.12.15 | — | කරාබු 2යි |
| 100. | ,, | පොන්නම්මා | 1956. 8.12 | — | 1956. 8.19 | — | වලලු 1යි, මුදු 1යි |
| 101. | ,, | රංමැණිකේ | — | — | — | — | කරාබු 2යි, මුදු 3යි, ඉනේ බඳින චේන් 1යි |
| 102. | ,, | රනෙල්රත්නා | 1956.12. 5 | — | 1965.12.23 | — | වලලු 2යි |
| 103. | ,, | පෝත්තු | 1956. 9.29 | — | 1956 10.26 | — | චේන් 1යි |
| 104. | ,, | කරුප්පි | — | — | — | — | රිදී චේන්පොටයි, වලලු 1යි |
| 105. | ,, | මැකී | 1957. 5. 6 | — | 1957. 5. 6 | — | වලලු 2යි, රිදී චේන්පොටයි, මුතු පොටයි, මුදු 2යි, මුතුනි 2යි |
| 106. | ,, | වීරම්මා | 1957. 5. 8 | — | 1957. 5. 8 | — | වලලු 2යි |

| | රෝහල | රෝගියාගේ නම | රෝහලට ඇතුළුවූ දිනය | පිටවිගිය දිනය | මියගිය දිනය | හිමිකම නොපෑ ඇති මුදල රු. ශ. | හිමිකම නොපෑ බඩු |
|---|---|---|---|---|---|---|---|
| 107. | නාවලපිටිය රෝහල | ලෙච්චිමි | 1957. 5.19 | — | 1957. 6.29 | — | මුතුනි 2යි |
| 108. | ,, | මාරිමුත්තු | 1957. 7.21 | — | 1957. 7.22 | 1 22 | — |
| 109. | ,, | මාරියායි | 1957. 6.13 | — | 1957. 8. 3 | — | වලලු 5යි |
| 110. | ,, | කුසුමාවතී | 1957. 8. 9 | — | 1957. 8. 9 | — | කරාබු 2යි |
| 111. | ,, | කිදිරායි | 1957.10.18 | — | 1957.10.19 | — | මුදු 2යි. |
| 112. | ,, | ඇතුරාසම් | 1957. 9.18 | — | 1957.10.26 | — | වලලු 2යි, කරාබු 2යි, ඉනෝබදින චේන්පොටයි, |
| 113. | ,, | කාමාච්චි | 1957.11. 1 | — | 1957.11. 5 | — | වලලු 3යි, සුදු 3යි |
| 114. | ,, | මුනාච්චි | 1957.11.13 | — | 1957.11.21 | — | කරාබු 3යි |
| 115. | ,, | සන්දනම් | 1957.12. 7 | — | 1957.12. 8 | — | කරාබු 2යි, මුදු 1යි |
| 116. | ,, | රංමැණිකා | 1958. 1.17 | — | 1958. 1.19 | 0 20 | වලලු 2යි, චේන් 1යි |
| 117. | ,, | වීරා | 1958. 3.27 | — | 1958. 4. 2 | 0 40 | මුදු 3යි |
| 118. | ,, | මහාලිංගම් | 1958. 7. 3 | — | 1958. 7. 6 | — | මුදු 1යි |
| 119. | ,, | අයියාම්මා | 1958. 7. 5 | — | 1958. 7.11 | — | වලලු 2යි, පෑන පිහිය 1යි, යතුරු 6යි |
| 120. | ,, | සිංගරම් | 1958. 8.25 | — | 1958. 8.27 | 1 27 | — |
| 121. | ,, | අංගමුත්තු | 1958. 9.18 | — | 1958. 9.30 | — | මුදු 3යි, චේන් 1යි |
| 122. | ,, | සෙල්ලම්මා | 1959. 5. 6 | — | 1959. 5.17 | — | වලලු 2යි |
| 123. | ,, | සෙම්බායි | 1959. 6.27 | — | 1959. 7. 3 | — | වලලු 1යි, කරාබු 1යි |
| 124. | ,, | උක්කුමැනිකෙ | 1959.11.30 | — | 1960. 2.20 | — | කරාබු 1යි, චේන් 1යි |
| 125. | ,, | ආරෝකියම් | 1959. 6.25 | — | 1959. 7.10 | 0 25 | — |
| 126. | ,, | කර්නායි | 1960. 9.23 | — | 1960. 9.29 | — | වලලු 2යි, මුදු 2යි |
| 127. | ,, | එල්ලම්මා | 1960. 3. 4 | — | 1960. 3. 4 | — | රිදී චේන් පොට 2යි, කරාබු 2යි, මුදු 1යි, මුතුනි 1යි |
| 128. | ,, | පොන්නයියා | 1960.12.11 | — | 1960.12.15 | 7 70 | — |
| 129. | ,, | පිටර් | 1961. 1.14 | — | 1961. 1.15 | — | සුදු 1යි |
| 130. | ,, | පුච්චි | 1962. 1. 1 | — | 1962. 1.14 | 4 0 | — |
| 131. | ,, | සිවටු | 1962. 5.13 | — | 1962. 5.15 | 1 20 | වලලු 2යි, චේන් 1යි |
| 132. | ,, | එස්. පෙරුමාල් | 1964. 5.10 | — | 1964. 5.12 | 2 24 | — |
| 133. | ,, | බිලින්ද | 1964. 7.26 | — | 1964. 7.30 | 7 50 | — |
| 134. | තෙල්දෙනිය රෝහල | වික්‍රමසිංහ | 1952.12.12 | — | — | — | සෙලෝලයිට් වලලු 2යි, පිත්තල අරුංගල් 2යි, සාරි පින් 1යි, ඇට මාල 1යි |
| 135. | ,, | පුංචිරාල | — | — | — | — | හවඩි 1යි |
| 136. | ,, | අඩයිකන් | 1962. 2. 2 | — | 1962. 2.17 | 1 78 | යතුරු කැරලි 1යි, කුඩ 1යි, රත්‍රං අරුංගල් 2යි |
| 137. | ,, | ජේච්චි | 1954.12.15 | — | 1954.12.15 | — | මුතුනි 2යි, අරුංගල් 2යි, මුදු 2යි, පාදයේ ලන මුදු 2යි, වලලු 2යි |
| 138. | වටවල රෝහල | රාමායි | 1964. 2. 4 | — | 1964. 3. 7 | — | තෝඩු 1යි, මුතුනි 1යි, සලෝලයිට් වලලු 4යි, පස්ලෝ මුදු 1යි, රිදී මුදු 2යි |

11-611—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව

### යාපනය දැව ගබඩාවේ දැව විකිණීම

යාපනය දැව ගබඩාවේ තිබෙන තොග 100කින් සැදි, තේක්ක, බුරුත, හල්මිල්ල, වැවරන හා පලු කඳන් 1000 ක් (ඝන අඩි 11705.6) මිළදී ගැනීම සඳහා 65.11.30 දා පෙරවරු 10 දක්වා මුද්‍රා තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ.

රාජකාරි වේලාවන් තුලදී යාපනය ගබඩා භූමියේදී මෙම දැව පරීක්‍ෂාකර බැලිය හැක.

වැඩිදුර විස්තර මගෙන් හෝ යාපනය දැව ගබඩාකරුගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. ඩී. ආර්. රත්නරාජා,
උතුරු දිසා වන නිලධාරී.

1965 නොවැම්බර් මස 6 වැනි දින,
යාපනයේ, උතුරු දිසා වන කායසීලයේ දී ය.

11-696—65.11.19 දින අංක 14.561 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුවේ දැව වෙන්දේසියේ විකිණීම

ඔඩ්ඩුසුඩාන්-මුලතිව් පාර අසල ගොඩ ගසා ඇති 1 වැනි හා 2 වැනි පංතියේ කඳන් 165ක් ඝන අඩි 1199.7 ක් පමණ 1965.11.25 වැනි දින උදය 10ට වවුනියාවේ දිශා භාර කැලෑ නිලධාරි විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දැව ඉල්ලුම්කරුවන්ට වෙන්දේසියට පෙර පරීක්‍ෂාකර බැලිය හැක. වැඩි විස්තර සඳහා ජගත අත්සන් කරන මගෙන් හෝ මූලියාවලෙයි අඩවි වන නිලධාරි තැනගෙන් ලබාගත හැක.

සී. දිසානායක,
දිශා භාර වන නිලධාරි, වවුනියාව.

1965.11.5,
වවුනියාවේ දිශා කැලෑ කාර්යාලය.

11-695—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

තිබොල්කැටිය ලී මෝලෙහි ඇති තොග 30 කින් යුත්, I, II හා III පන්තිවල ඉරු දැව ඝන අඩි 4,0 2.2 ක් 1965 දෙසැම්බර් මස 3 වෙනි දින පෙ. ව. 10 ට වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට අපේක්‍ෂා කරන භවතුන්හට වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම දැව පරීක්‍ෂාකර බැලීමට උපදෙස් දෙනු ලැබේ.

වෙන්දේසිය පිළිබඳ තවදුරටත් අවශ්‍ය විස්තර මගෙන් හෝ තිබොල්කැටිය ලී මෝලේ කාය්‍ය භාර නිලධාරි වෙතින් හෝ ලබාගත හැක.

හෙක්ටර් සේනානායක,
බටහිර දිසාවේ දිසා වන නිලධාරී.

1965.11.1 දින,
දිසා වන නිලධාරි කාර්යාලය,
රත්නපුර.

11-689—65.11.19 දින අංක 14.561 දරන ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### දව වෙන්දේසියේ විකිණීමයි

තේක්ක, බුරුත, හල්මිල්ල, හුලන්හික්, දුන්, මිල්ල, ගම්මාලු, රාතේ යන වර්ගයෙන් කඳන් 101 කින් සමන්විත ඝන අඩි 1,256.5 ගොඩවල් 21 කින් යුත් දැව තොගයක් 1965 දෙසැම්බර් මස 6 වෙනි සඳුදා උදේ 10 ට ඒරාවූර් දුම්රිය අංගනයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ ඒරාවූර් දුම්රිය අංගනයේ සිටින වන ඕවර්සියර්ගෙන්, හෝ විමසන්න.

කෙ. අරුල්වෙල්වම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරි.

1965.11.8 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේ දීය.

11–688—65.11.19 දින අංක 14,561 දරණ ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීම

පහත උපලේඛනයේ සඳහන් තේක්ක, බුරුත, හල්මිල්ල, රාණි, පලු යන I, II, III පන්තිවලට අයත් කඳන් හා ඉරන ලද දව ද, වන අපරාධයනට අයත් ද්‍රව්‍ය ද, මෙහි දක්වා ඇති දිනයන් හිදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වැඩි විස්තර මගෙන් හෝ, අඩවි වන නිළධාරිගෙන් හෝ, ගබඩා පාලකගෙන් පැමිණ ලබා ගත හැකි ය.

ජ. ආ. ද සිල්වා,
දිශා වන නිළධාරි (උ. මැ. දි.).

1965 නොවැම්බර් මස 9 දින,
ත්‍රිකුණාමලය,
දිසා කැලෑ කාර්යාලයේ දිය.

### උප ලේඛනය

| වෙන්දේසි කරන ස්ථානය | තොග ගණන | දිනය හා වෙලාව |
|---|---|---|
| 1. අඩවි කැලෑ කාර්යාලය, අනුරාධපුරය ... | ඉරූ ලී තොග 13 යි, ඝන අඩි 119·5<br>කඳන් තොග 6යි, ඝන අඩි 70.0<br>දෙර පලු 12 යි<br>කඹිලි කනු තොග 1යි. (කනු 18) | 6 .11.23 දින පෙ. ව. 10 |
| 2. රජයේ දව ටම්ල, මැදවච්චිය ... ... ... | ඉරූ ලී තොග 10 යි, ඝ.අ. 1,435<br>කඳන් තොග 1යි. ඝ.අ. 50·3 | 65.11.23 දින ප.ව. 2 |
| 3. අඩවි කැලෑ කාර්යාලය, කැකිරාව ... .. .. | ඉරූ ලී තොග 2 යි. ඝන අඩි 20.0<br>කඳන් තොග 12 යි. ඝන අඩි 174.1 යි<br>උඩ දුරන කියත් 6 යි, පොරෝ 1 යි, වැය 1 යි, පිහි 1 යි, පිරි 2 යි, කියත් අඩු 1 යි, බාස්කට් 1 යි, කිරෝකෝදු 1යි, කඹ 1 යි, දලි ලනු 1යි | 65.11.24 දින පෙ.ව. 9 |

11–687—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ,

### ලබුදූව රජයේ ගොවිපලේ වැඩිපුර සිටින සතුන් විකිණීම

පහත විස්තර සඳහන්, ලබුදූව රජයේ ගොවිපලේ සිටින සතුන් 1965 දෙසැම්බර් මස 15 දින පස්වරු 2 ට ලබුදූව ගොවිපලේදීම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| 2. වර්ගය | ගවයා | උපන් දිනය | අංකය | අන්තිම වුරයට ලද කිරි පයින්ට |
|---|---|---|---|---|
| තර්පකාර් ... ... ... | එළදෙන ... | 51.12.12 ... | ඇන් 111 ... | 1,460 |
| දෙමුහුන් ... ... ... | එම ... | 56.12. 1 ... | ඊ 524 ... | 1,704 |
| තර්පකාර් ... ... ... | එම ... | 52.12.27 ... | ඇන් 174 ... | 2,752 |
| සින්ධි ... ... ... | එම ... | 55. 3.23 ... | ඒකේ 882 ... | 2,178 |
| තර්පකාර් ... ... ... | එම ... | 53.12.27 ... | පි 875 ... | 1,513¾ |
| තර්පකාර් ... ... ... | එම ... | 55.10.31 ... | සි 359 ... | 3,167 |
| දෙමුහුන් ... ... ... | එම ... | 54.12.18 ... | ඊ 382 ... | 2,328 |
| තර්පකාර් ... ... ... | එම ... | 53. 8.18 ... | පි 782 ... | 2,013 |
| දෙමුහුන් ... ... ... | එම ... | 54.11. 8 ... | සි 489 ... | 2,724 |
| සිංහල ... ... ... | එම ... | 55. 9. 1 ... | ඇල් 4098 ... | 1,650½ |
| තර්පකාර් ... ... ... | එම ... | 51. 8.19 ... | ඇන් 90 ... | 2,110 |
| තර්පකාර් ... ... ... | එම ... | 52.10.12 ... | පි 543 ... | 1,187 |
| දෙමුහුන් ... ... ... | එම ... | — ... | සි 482 ... | 2,305 |
| තර්පකාර් ... ... ... | එම ... | 54. 9.19 ... | සි 90 ... | 3,553 |
| දෙමුහුන් ... ... ... | එම ... | 55. 4.14 ... | ඇල් 4089 ... | 1,748¾ |
| තර්පකාර් ... ... ... | එම ... | 52. 8.10 ... | ඇන් 158 ... | 2,358¾ |
| දෙමුහුන් ... ... ... | එම ... | 59.10.20 ... | ඊ 580 ... | 2,228½ |
| තර්පකාර් ... ... ... | එම ... | 54. 1.13 ... | ඇන් 215 ... | 1,332¾ |
| ජර්සි ... ... ... | පට්ටිගොන් ... | — ... | පි 153 ... | — |
| කිලාරි ... ... ... | කරත්ත ගොනා ... | — ... | ඇෆ් 749 ... | — |

3. සාමාන්‍ය රාජකාරි වේලාවන් තුලදී ලබුදූව රජයේ ගොවිපලේදී මෙම සතුන් පරීක්ෂා කර බැලිය හැකිය.

4. වෙන්දේසිය අවසන් වූ වහාම ලබුදූව රජයේ ගොවිපලේ කළමනාකරුට මුදල් ගෙවා මෙම සතුන් ගොවිපලෙන් ඉවත ගෙන යා යුතුය.

5. වැඩි විස්තර, ලබුදූව රජයේ ගොවිපලේ කළමනාකරුගෙන් හෝ කොළඹ 7, ග්‍රෙගරි පාරේ අංක 54 දරන තැන පිහිටි ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයයෙන් ලබා ගත හැකිය.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 නොවැම්බර්,
පේරාදෙනියේ දිය.

11–685/1—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## කළුතර දිස්ත්‍රික්කයේ 1966 තොටුපල් රේන්ද විකිණීම

1966 ජනවාරි මස 1 වැනිදා සිට 1966 දෙසැම්බර් මස 31 වැනිදා තෙක් පහත සඳහන් තොටුපලවල් වෙනුවෙන් රේන්ද ගාස්තු අය කිරීමේ සහ එකතු කිරීමේ තනි අයිති වාසිකම් මිලට ගැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කළුතර ආණ්ඩුවේ ඒජන්ත තැන විසින් කළුතර කච්චේරියේදී 1965 දෙසැම්බර් මස 17 වෙනි දින පෙ. ව. 10 තෙක් බාරගන්නා බව මෙයින් දන්වමි:—

(1) අඟුරුවාතොට
(2) කලවැල්ලාව
(3) කිතුල්ගහ වත්ත
(4) පරගස් තොටුපල
(5) රුක්ගහ තොටුපල
(6) වෙරළුගස් තොටුපල හෙවත් පොසැස්වර්
(7) එගොඩ උයන, හේනමුල්ල හා ගොරකපොල
(8) ඉදිගහ තොටුපල
(9) මෝල්කාව
(10) ගල්වතුර

2. ඇති සෑම අවස්ථාවකදීම තොටුපල් සේවා කටයුතු සමුපකාර සමිතිවලට භාරදීමට වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රය ලියමි කවරයක දමා සිල් (මුද්‍රා) තබා, ඒ ලියුම් කවරයේ මුදුනේ වම් කොනෙහි "කළුතර දිස්ත්‍රික්කයේ 1966 තොටුපල් රේන්ද පිළිබඳ ටෙන්ඩර් පත්‍රය" යන්න ලිවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් මස 17 වෙනි දින පෙ. ව. 10ට කලින් කළුතර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබිය යුතුය. ඉහත කී දින ඉහත කී වේලාවටම ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට කච්චේරියට පැමිණ සිටිය හැකිය.

4. රුපියල් 50ක් තැන්පත් කළ බවට කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් එක් එක් ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුවාත් හැර ටෙන්ඩර් පත්‍රයේ මුල් පිටේ ඒ කුවිතාන්සියේ අංකය හා දිනය ලකුණු කළ යුතුයි.

5. පත් කරනු ලැබූ ටෙන්ඩර් කරුවාට රේන්දය විකුණන දිනයේදී එනම් 1965. 12. 17 වෙනි දින ගැනුම් මුදලෙන් දහයෙන් පංගුවක් එවලේම කච්චේරියෙහි මුදලෙන් තැන්පත් කොට රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රයේ අත්සන් කරන්ටත්, තොටුපල් රේන්ද විස්ක දිනයේ සිට දවස් 14ක් ඇතුළතදී මුළු ගැනුම් මුදලින් තුනෙන් පංගුවක් ඇප මුදලක් වශයෙන් තබන්ටත් නියම කරනු ලැබේ. රේන්ද විකුණුම් කොන්දේසි පත්‍රයට ඔහු රුපියලක මුද්දරයක් ගැසිය යුතුයි. ඉහත කී දේ ඔහු නොකළොත් රේන්දය විස්ක දවසේදි ඔහු තැන්පත් කළ ගැනුම් මුදලෙන් දහයෙන් පංගුව රාජ සන්තක වනු ලැබේ.

6. මගීන් ගෙනයාම් සඳහා වුවමනා වන සියළු බෝට්ටු හෝ ඔරු රේන්දකාරයා තම වියදමෙන්ම සපයාගෙන කැඩී බිඳී නොයාදී අළුත් වැඩියා කරවාගෙන තබා ගැනීමට බැඳී සිටිය යුතුයි. යාත්‍රාව සඳහා බෝට්ටුවල යෝග්‍යතාවත් වරකට බෝට්ටුවකින් ගෙනයා හැකි මගීන් ගණනත් කළුතර ආණ්ඩුවේ ඒජන්ත තැන අනුමත කරන පරිදි විය යුතුයි. ඉහත කී තොටුපල්වලින් වැලි, රොන්මඩ ආදිය තම වියදමෙන් ඉවත් කළ යුතුයි.

7. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය කළුතර ආණ්ඩුවේ ඒජන්ත තැන සතුව ඇත.

8. මේ පිළිබඳ වැඩි විස්තර කළුතර කච්චේරියෙන් දැනගත හැකිය.

පී. කාසිලින්ගම්,
කළුතර ආණ්ඩුවේ ඒජන්ත.

1965 ඔක්තෝබර් 26 වැනි දින,
කළුතර කච්චේරියේ දිය.

11-590—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම

## උගස් නඩු තීන්දුවක් යටතේ ප්‍රසිද්ධ ඉඩම් වෙන්දේසියක්

මාතර දිස්ත්‍රික් උසාවියේ දීය

කඹුරුගමුවේ පදිංචි නැන්සි අබේසිංහ ගුණවර්ධන හාමිනේ ........................................ පැමිණිලිකාරිය.

නොම්මරය : ඇම්. බී. 1287 එදිරිව

කඹුරුගමුවේ පදිංචි දොන් කුලරත්න වික්‍රම සුරේන්ද ........................................ විත්තිකරු.

ඉහත සඳහන් නඩුවෙන් මට ලැබී තිබෙන බලය පිට විත්තිකාර පක්ෂය විසින් පැමිණිලිකාර පක්ෂයට ගෙවිය යුතු මෙම නඩු තීන්දුවේ ගිහ මුදල වන රුපියල් එක්දාස් හත්සිය හැත්තෑ වකුත් ශත හතලිහක් අයකර ගැනීම පිණිස මෙහි පහත සඳහන් දේපල ප්‍රථම කොට මහජනයා අතරේ වර්ෂ 1965ක් වූ නොවැම්බර් 27 වැනි දින පෙරවරු 10.30 ට එම ස්ථානයේදී විකුණනු ලැබේ.

එනම්.—දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ කඹුරුගමුවේ පිහිටි පොල්පැල කොරටුවේ බෙදා වෙන්කරන ලද නැගෙනහිර පහෙන් පංගු කැබැල්ලට මායිම් :— උතුරට : වැකඩ දෙණියද ; නැගෙනගිරට : වැවද ; දකුණට : මහපාර සහ බස්නාගිරට : ඇල සහ මෙම ඉඩමේ කැබැල්ලද යන මායිම් තුළ රූඩ් එකක් විශාල ඉඩමෙන් බෙදා වෙන්කරන ලද හතරෙන් තුනෙන් හතෙන් හයක්ද, හතරෙන් තුනෙන් හතෙන් පංගුවෙන් හතරෙන් පංගුවක්ද, අටෙන් පංගුවක්ද සහ විසිපහෙන් පංගුවක්ද සහ වැවට යාකරන ලද දහතුන් රියන් උළු සෙවිලි ගෙයින් නොබෙදූ විසි අටෙන් විසි පස් පංගුවක් ද යන දේපල වේ.

තක්සේරු මිල රු. 12,000 යි

විකිණීමේ කොන්දේසි පරිදි වෙන්දේසි උනි තම් තත් ගන්නා ලද මුදලින් ¼ පංගුවත් සමග කොමසාරිස් තැනගේ සියලුම ගාස්තු ගෙවිය යුතුයි. තවද කොන්දේසි ඔප්පු සහතික කිරීමේ මුද්දර ගාස්තුව සහ නීතිඥ තැනගේ ගාස්තුව ද එවෙලේ ගෙවිය යුතුයි. ඉතිරි මුදල විකිණීමේ දින සිට දින 30 ඇතුළත උසාවියට ගෙවිය යුතුයි. මේ සම්බන්ධ වැඩි විස්තර නීතිඥ ඇම්. පී. ගුණවර්ධන මැතිනිය ගෙන් හෝ මගෙන් විමසන්න.

ජාන් ද සිල්වා සදුකොටන,
උසාවියේ කොමසාරිස් තැන සහ
ප්‍රසිද්ධ වෙන්දේසිකාර තැන.

7.10.1965,
"කීර්ති", ගිත්තැටිය, මාතර.

11-370—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

## මෙන්දේසියේ විකිණීමයි

කටුගස්තොට කහල්ලේ නො. 17 දරණ නිවසේ පදිංචි නෙගිනුවෙල ගනදූල් පනික්කියලාගෙදර පියදස මහතාට අයිති මැද පළාතේ නුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලෙගම්පහ කහල්ලේ පිහිටි අක්කර පිළිවෙලින් රූඩ් එකයි, පර්චස් දහතුනයි දහසයෙන් දහහතරක් සහ රූඩ් එකයි, පර්චස් එකොලහයි හතලිස් අටෙන් විසිඅටක් ප්‍රමාණයෙන් යුත් කැකුනගහමුල්ලේහේනේ අක්කර 2 දරණ කැබැල්ල සහ නිතුල් යහමුදුනේවත්තේ අක්කර 2 "සී" දරණ කැබැල්ල සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ සහ අනිකුත් දේත් මෙහි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

ලංකා රජයේ උකස් බැංකු ආඥා පනතේ 32 (1) දරණ වගන්තිය යටතේ ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් [illegible] පලකර ප්‍රසිද්ධ කිරීමෙන් ඒ යටතේ ලැබී ඇති බලතල අනුව සහ එකී අධ්‍යක්ෂක මණ්ඩලයෙන් බලය ලත් පරිදි 1960 ජූලි මස 15 වැනි දින ඒ. ඇස්. කරුණාරත්න ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 3354 දරණ උකස්කරය පිට කටුගස්තොට කහල්ලේ නො. 17 දරණ නිවසේ පදිංචි නෙගිනුවෙල ගනදූල් පනික්කියලාගෙදර පියදස මහතා විසින් මෙම බැංකුවට ඇප වශයෙන් උකස් කරන ලද—

(1) ජේ. වී. ඩේවිඩ් බලයලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද වර්ෂ 1938ක් වූ නොවැම්බර් මස 12 වැනි දින අංක 3791ඒ දරණ මිනුම් පිඹුරේ ප්‍රකාර රූඩ් එකයි පර්චස් දහතුනයි දහසයෙන් දහහතරක් ප්‍රමාණයෙන් යුත් මැද පළාතේ නුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේගම්පහ කහල්ලේ පිහිටි කැකුනගහමුල්ල [illegible]

(ඉ) ජේ. ව. ඩේවිඩ්, බලයලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද 1953.11.12 වැනි දින අංක 3,792 " ඒ " දරන මිනුම් සැලැස්මේ ප්‍රකාර රූඩ් එකයි පර්චස් එකොලහයි හතලිස් අටෙන් විසිඅටක ප්‍රමාණයෙන් යුත් කාහල්ලේ පිහිටි නිතුල්ගහමුදුනේවත්තේ අක්ෂර 2 " සී " දරණ කැබැල්ලද,

ඉහතකී උකස්කරය පිට අය වියයුතු මුදල වන රු. 5,286.22ක් අය කරගනු සඳහා සහ 1963.9.5 දින සිට වෙන්දේසිය සිදුකරන දින දක්වා රු. 4,849.78ට අවුරුද්දට සියයට 6 බැගින් පොලිය අයකරගනු සඳහාද, ලංකා රජයේ උකස් බැංකු ආඥපනතේ 63 වන වගන්තිය යටතේ අයකරගත හැකි වියහියදම් සහ අනිකුත් මුදල්ද අයකරගනු සඳහා 1965 දෙසැම්බර් 11 වැනි ශනි දින අපරභාග 3.30ට කැකුණගහමුල්ල ගේනේ අක්ෂර 2 දරණ කැබැල්ලේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර කොළඹ හෝර්ටන් පෙදෙසේ අංක 91 දරණ තැන ලංකා රජයේ උකස් බැංකුවෙන් ලබාගත හැකිය.

ලොයිඩ් සමරවික්‍රම,
බලයලත් වෙන්දේසිකරු.

හොක්මන් සහ සමරවික්‍රම සහෝදරයෝ බාරේ,
නුවර, 1965.10.18.

11-66—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## නත්තල් ගස් විකිණීම—1965

1965 නත්තලට, නත්තල් ගස් සැපයීම සඳහා නුවරඑළියේ ප්‍රාදේශීය වන නිළධාරි විසින් 1965 දෙසැම්බර් මස 15 වැනි දින දක්වා ඉල්ලුම්පත් භාරගනු ලැබේ.

2. පට්ටිපොල වන රක්ෂකගේ නිවාසයෙන් ලබාගත හැකි නත්තල් ගස්වල මිල මෙසේයි :—

උස අඩි 3 දක්වා ගසක් රු. 4·00

උස අඩි 7 දක්වා ගසක් රු. 7·00

උස අඩි 10 දක්වා ගසක් රු. 12·00

උස අඩි 12 දක්වා ගසක් රු. 14·00

3. පැමිණ ලබාගත නොහැකි අයදුම්කරුවන්ට දිවයිනේ ඕනෑම දුම්රිය පොලකට නත්තල් ගස් දුම්රියෙන් යවනු ලැබේ. ඒ සඳහා දුම්රිය ගාස්තුවත් සමග මිල මෙසේ යි :—

උස අඩි 3 දක්වා ගසක් රු. 4·50

උස අඩි 7 දක්වා ගසක් රු. 8·50

උස අඩි 10 දක්වා ගසක් රු. 15·00

උස අඩි 12 දක්වා ගසක් රු. 18·00

4. දුම්රියෙන් යවන ගස් නැතිවීම ගැන මෙම දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. ඒ පිළිබඳව එවන කිසිම පැමිණිල්ලක් ගැන මෙම දෙපාර්තමේන්තුව විභාග නොකරයි.

5. සියළුම ඉල්ලුම්පත් නුවරඑළියේ දිසාපති නමට ලබාගත් මනි ඕඩර යක්/පෝස්ටල් ඕඩරයක් සහිතව පහත සඳහන් විස්තර ඇතුව මා වෙත ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) ගසේ දිග හා අවශ්‍ය ගස් ගණන.

(බී) ගස් දුම්රියෙන් යැවිය යුතු දිනය හා ඒවා දුම්රිය පොලෙන් ලබා ගැනීමට අපේක්ෂා කරන දිනය.

(සී) ගස් යැවිය යුතු දුම්රියපොල.

6. කළින් මුදල් නොඑවන කිසිම ඉල්ලීමකට ගස් එවනු නොලැබේ. චැක්පත් භාරගන්නේ නැත.

7. අවශ්‍ය විස්තර රහිතව ඉදිරිපත් කරන ඉල්ලීම්වලට කලට වේලාවට ගස් නොසැපයීම ගැන මේ දෙපාර්තමේන්තුව වග නොකියයි.

8. 1965 දෙසැම්බර් මස 15 වැනිදායින් පසු ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

පී. ල. මා. පෙරේරා,
ප්‍රාදේශිය වන නිළධාරි, උඩරට දිසාව.

දිසා කැලෑ කාර්යාලය,
නුවරඑළිය,
1965 නොවැම්බර් 4 දින.

11-432—65.11.19 දින අංක 14,561 දරන ගැසට් පත්‍රය

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරම ඇතිවෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති නමට ලැබෙන සේ එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබා ගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ ... "විස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" ය නිපදවන ලද කඩදාසිවල
[illegible]